

# මායා

එච්. කේ. පවිත්‍රා මානසී සමරසේකර

# මායා

එච්. කේ. පවිත්‍රා මානසී සමරසේකර

Sinhalaebooks.com වෙත 2020.06.24

දින upload කරන ලදි.

*මාගේ මේ පොත*

*මට සැමදා ශක්තියක් වන මගේ*

*මව්පියන්ටත්*

*නැණ පහන් දල්වන ගුරු භවතුන්ටත්*

*ඉතා ආදරයෙන්*

*පුදමි.*

අඳුරුම අඳුරු අමාවක මහ රෑක එක පාළු පළාතකට මහ වැසිත් එක්ක කුණාටුවක් හැමුවා. අහැට ඇඟිල්ලෙන් ඇන්නත් නොපෙනෙන තරමට පළාතම අඳුරු වෙලායි තිබුනේ. එකපාරටම කවුරු හරි කෑගහන සද්දයක් ඇහුනා. ඒත් ඒක පාළු පළාතක්නේ එතකොට කවුඩ මේ කෑගහන්නේ. ඒක ගෑණු ළමයෙක්ගේ කටහඬක් වගේ.

ඒත් එක්කම ඒ පාළු පළාත මැදින් යන පාර දිගේ කවුරු හරි දුවගෙන ආවා. එයා දුවගෙන එන ගමන් පිටිපස්ස හැරී හැරී ආවේ කවුරුර් හරි එයාගේ පස්සේ පන්නනවා වගෙයි. ඔව්, එහෙම තමයි, එයගේ පිටිපස්සේ කොල්ලෝ දහ දෙනෙක් විතර පන්නගෙන

ආවා. පෙනුමෙන්නම් ඒ අය පෝසත් පවුල්වල කොල්ලෝ වගෙයි. පළාතම අඳුරේ තිබුනත් මට ඒ අයව හොඩට පේනවා.

කෙල්ල දිගටම දුවගෙන යනවා. එයා ටික ටික ළං වෙන්නේ ප්‍රපාතෙකට. ප්‍රපාතේ දකින කෙල්ල නතර වෙනවා. කොල්ලෝ ටිකත් ළගටම ඇවිත් නවතිනවා.

“ මායා, අද නම් මගෙන් බේරෙන්න හම්බුවෙන්නේ නැහැ.” එතන හිටපු එක කොල්ලෙක් කියනවා.

“නෑ, මගේ ළගට එන්න එපා.” එහෙම කියන ගමන් අර කෙල්ල ප්‍රපාතේ පැත්තට පස්සෙන් පස්සට යනවා. එයා ඇදගෙන ඉන්නේ දිගම දිග ගවුමක්. එකපාරටම එයාට ගවුම පෑගිලා කකුල පැටලෙනවා. ඒත් එක්කම එයා ප්‍රපාතෙට වැටෙනවා. එයා මහ හයියෙන් කෑ ගහනවා. “ ගයාන් , මාව බේරගන්න....”

හැමදාමත් වගේ මේ හීනේ දකින මම ගැස්සිලා ඇහරුනා.ඔව්, ඒක හීනයක්. සතියක ඉදන් හැමදාම මට මේ හීනේ පේනවා. හැමදාම මේ හිනේ දැක්කම මම ගැස්සිලා ඇහැරෙනවා. මම ෆෝන් එක අරගෙන

වෙලාව බැලුවා. වෙලාව පාන්දර එකයි. හැමදාම මේ හීනේ පෙනිලා මට ඇහැරෙන්නේ මේ වෙලාවට. ඊට පස්සේ මට නින්ද යන්නෙම නැහැ.

ආ... ඔයාලා මම කවුද කියලා දන්නේ නැහැනේ. මම තමයි ගයාන්. නින්ද යන්නෙත් නැති එකේ මම ඔයාලට මගේ ගැන කියන්නම්කෝ. මම ඉංජිනේරුවෙක්. මම වැඩ කරන්නේ මගේම කම්පැණි එකේ . ඒ කිව්වේ මගේ තාත්තාගේ කම්පැනියේ. අනාගතේ ඉතින් කොහොමත් මටනේ එයිති වෙන්නෙ. මට දැන් වයස විසිස් අටක් වෙනවා. අර හීනේ ගැන කියනවනම් ඒ කෙල්ලවත් කොල්ලොන්වවත් මම දන්නේ නැහැ. හැබැයි ඒ කෙල්ලනම් මාව දන්න පාටයි. ඒකනේ එයා මගේ නම කියලා කෑගහන්නේ.

මට ආය නින්ද ගියේ නැති නිසාම උදේම ඔෆිස් යන්න ලෑස්ති වුණා. මේ දවස්වල අම්මායි, තාත්තායි බිස්නස් වැඩකට සින්ගප්පූරුවට ගිහිල්ලයි ඉන්නේ. ඒ නිසා මම ගෙදර තනියම.මම කලින්ම ඔෆිස් එකට ගියා.

" ගුඩ් මෝර්නින්ග් සර්, සර් අද කලින්ම ඇවිල්ලා." මුරකාරයා දොරවල් අරින ගමන් කිව්වා.

"ඔව් අද ටිකක් කලින් තමා."මම එහෙම කියලා ඇතුලට ආවා. මගේ කැබින් එකට ගියපු මම ඉඳගත්තා. ඉඳගන්නකොටම මතක් වුනේ අර හීනේ. මායා, කවුද මේ කෙල්ල. එයා කොහොමද මාව දන්නේ. ටික ටික ඔෆිස් එකේ අය එන්න පටන් ගත්තා. නවය වෙනකොට හැමෝම තම තමන්ගේ වැඩ පටන්ගෙන ඉවරයි. මම කල්පනාව අතරේම අලුත් කන්ට්‍රැක්ට් ටිකකට අදාල ෆයිල්ස් වගයක් බලුවා. ඔන්න එතකොට මගේ අතිජාත මිත්‍රයා දිලීප ආවා. ඉස්කෝලේ යන කලේ ඉඳන්ම අපි හොඳම යාලුවෝ. ඉතින් දිලීපත් වැඩ කරන්නේ මාත් එක්කමයි.

"ගුඩ් මෝර්නින්ග් මචන්, අද උදේම වැඩ පටන්ගෙන වගේ."

"ඔව් දිලීප, අද මම උදේම ඔෆිස් එකට ආවා. ඊයේ මුළු රෑම මට නින්ද ගියේ නැහැ. ඉතින් උදේම ඇවිත් වැඩ පටන් ගත්තා. "

“දැන් දවස් තුන හතරක්ම ඔය නින්ද යන්නැති කතාව කිව්වානේ. මොනවා වෙලාද ඔය නින්ද යන්නැති ලෙඩේ හැදුනේ.

“ඒක නම් පිස්සුවක්. ඒක කියන්න කලින් මට කියනවකෝ කවීශා අදවත් වැඩට ආවද?”

“නැහැ. උඹ අහන හින්දා මම එද්දිම බලන් ආවේ. නිවාඩු ගන්නවා කියලා මෙහෙට දැනුම් දීලත් නැහැ. අස් වෙනවා කියලත් නෑ. දවස් හතකින් වැඩට ඇවිල්ලත් නෑ.”

“එහෙමද? මොකද දන්නෑ නැත්තේ.”

“ මම මේ කල්පනා කරේ මෙච්චර කෙල්ලෝ ඉන්න ඔෆිස් එකේ උඹ කවීශා ගැන මෙච්චර හොයන්නේ ඇයි කියලා. ඇයි දන්නෑ නේ.”

“හරි ඉතින් වටේ යන්න ඕනේ නැහැ. කෙලින්ම අහපන් මම කවීශාට කැමතියිද කියලා.”

“ ආ... ඒ කියන්නේ උඹට ආදරයක් ඇති වෙලා.ඒක තමා බන් මේ දවස් වල මහ වැහි වහින්නේ. උඹ කෙල්ලෙක් ගැන හිතලනේ.”

“ කට වහන් හිටු. මම මොනවා කිව්වත් උඹට කියන්න දෙයක් තියනවනේ.”

“ හරි හරි, උඹ ලැජ්ජා වෙන්න එපා ඉතින්. මම යනවා. අද ඉන්ටවිව් එක බලන්න යන්න එපැයි.”

“ යන්න කලින් මට කියන්න දෙයක් තියනවා. ඒකත් අහලාම යනවා.”

“ ආය මොනවද කියන්න තියෙන්නේ.මට ප්‍රමෝෂන් එකක්වත් දෙන්න තියෙනවද?”

“ උඹට ආය මොන ප්‍රමෝෂන්ද. කම්පැණි එකේම තුන්වෙනි තැනට ඉන්නවා මදිද. ඒක වෙන කතාවක්. මම උඹට කිව්වේ මට නින්ද යන්නෑ කියලා. දැන් සතියක විතර ඉදලා මට හීනයක් පේනවා. ඊට පස්සේ ත්මයි නින්ද යන්නැත්තේ.”ඊට පස්සේ මම දිලීපට මම හැමදාම දකින හීනේ කිව්වා.

“උඹ කොහොමද කියන්නේ ඒ කෙල්ල ගයාන් කියලා කෑගහන්නේ උඹටමයි කියලා. ලංකාවේ තව ගයාන්ලා කීයක් ඉන්නවද?”

“ හරි ඒ මම නෙවෙයිනම් මට මොකටද එහෙම හීනයක් එක දිගට හැමදාම පෙන්නේ.”

“ම්... එහෙමත් එකක් තියනවනේ. ඒ කෙල්ලව උඹ දන්නවද? කොයි වගේද කෙල්ල.”

“ කෙල්ලගේ මූණ පේන්නේ නෑ දිලීප. ඒ කෙල්ල ගැන කියන්න පුලුවන් දේවල් දෙකයි. එක ඒ කෙල්ලගේ කොණ්ඩේ දණිස්ස ගාවට විතර දිගයි. දෙක කෙල්ල ඇඳගෙන ඉන්නේ බිමටම දිග සුදු පාට ගවුමක්.”

“එහෙමද? කොල්ලොන්ගේ මූණු උඹට හොදට පේනවා. ඒත් කෙල්ලගේ මූණ පේන්නේ නැහැ. කවුද එතකොට මේ උඹට පේන මායාව.”

“අනේ මන්දා, මට තියෙන ප්‍රශ්නේ හැමදාම මේ හීනේ පේන එක.අනිත් දේ තමයි හැමදාම මට ඔය හීනේ පෙනිලා ඇහැරෙන්නේ පාන්දර එකට. ඊට පස්සෙ නින්ද යන්නෙම නෑ.”

“ මේක මහ අද්භූත ප්‍රශ්නයක්නේ ගයාන්. මම දන් ඉන්ටර්විව් එකට යන්න ඕනේ. අපි හවසට මේ ගැන කතා කරමු.”

ඉන්ටර්විව් එකේ වැඩ ඉවර වෙලා දිලීප ආයෙත් ආවේ වැඩ ඉවර වෙන වෙලාවට. ඉතින් අපි දෙන්නා

මොනවා හරි බොන ගමන් කතා කරමු කියලා කොෆී ශොප් එකකට ගියා.

එතනට වෙලා අපි දෙන්නා මේ හීන ප්‍රශ්නේ ගැන කතා කර කර ඉන්නකොට මගේ ෆෝන් එක රින්ග් වුණා.කෝල් එක ගෙදර ලැන්ඩ් ෆෝන් එකෙන්. කවුද දෙයියනේ ඒකෙන් කෝල් කරන්නේ. කවුද කියලා බලන්න ඉස්සරවෙලා කෝල් එක ආන්සර් කරන්න එපැයි. ඉතින් මම ආන්සර් කරා.

“ හලෝ, කවුද මේ කතා කරන්නේ. “මම ගත්ත ගමන් ඇහුවා.

“ හලෝ, ගයාන් මම කවීශා කතා කරන්නේ.”

“ මොකක්... කවීශා,  ඔයා කොහොමද මගේ ගෙදර ලැන්ඩ් ලයින් එකෙන් කතා කරන්නේ.”

“ගයාන්,මම ඔයාගේ ගෙදරට ආවා. ඔයා දම්ම එනවද? මට ඔයා හම්බුවෙලා කියන්න වැදගත් දෙයක් තියෙනවා.”

“ මට දැම්මනම් එන්න විදිහක් නැහැ. දන්නවනේ ට්‍රැෆික් එකට අහුවුනාම යන වෙලාව. ඔයා අයි

ගෙදරට ගියේ ඔෆිස් එකට එන්නැතුව. අනික ඔයා දැනුම් දෙන්නැතුව දවස් හතක්ම වැඩට අවිත් නැහැ.”

“ගයාන් මම ඔයාට හැමදේම කියන්නම්. පුලුවන්නම් හයට කලින් එනවද? මට හයෙන් පස්සේ ඉන්න බැහැ.”

“ හරි, මම දැම්ම එන්නම්. හැබැයි හය වෙනකොටනම් එන්න පුලුවන් වෙයිද දන්නෑ.”

“ හරි, මම ඉන්නම්. ඔයා එන්නකෝ.” එහෙම කියලා එයා ෆෝන් එක තිබ්බා.

“ දිලීප, අපි දැම්ම ගෙදර යන්න ඕනේ. කවීශා මාව හොයාගෙන ගෙදර්ට ගිහින්. මට පේන්නේ මොකක් හරි ප්‍රශ්නයක් වගේ.”

“හරි යමු. දිලීප නැගිටින ගමන් කිව්වා.

මම පුලුවන් තරම් ට්‍රයි කරා හය වෙන්න කලින් ගෙදරට යන්න. අන්තිමේට කොහොමහරි හයයි පහ වෙනකොට ගෙදරට යන්න අපිට පුලුවන් වුණා. ඒත් මම යනකොට කවීශා ගිහිල්ලා.

“ එයා කිව්වනේ හය වෙනකම් ඉන්නම් කියලා. මේ විනාඩි පහට එයා අතුරුදහන් වෙලානේ. එයා හය වෙනකම් හිටියනම් අපි එද්දී එයා යනවා දකින්න එපැයි.”

“එයා මෙහේ එන්න නැතුව ඇති බන්. වෙන කොහේ හරි ඉදන් කතා කරන්න ඇත්තේ.”

උඹට පිස්සුද, වෙන කොහේහරි හිටියනම් කොහොමද මේ ගෙදර ෆෝන් එකෙන් කෝල් කරන්නේ.” මම කෝල් එක ආපු නම්බර් එක පෙන්වන ගමන් කිව්වා.

“එහෙනම් මේ කෙල්ල කොහේ අතුරුදහන් වුණාද.”

“ කවුද දන්නේ බං.කෝල් එකක් දෙන්න නම්බර් එකකුත් නෑ. ඔෆිස් එකට දීලා තියන නම්බර් එකත් වැඩ කරන්නේ නැහැනේ.”

“ආ... ඒ කියන්නේ උඹ ඒකටත් කෝල් කරලා බලලානේ.”එහෙම කියන ගමන් දිලීප ගිහින් සෝෆා එකෙන් ඉදගත්තා.

“ ඔව් ඉතින්, උඹ හිතුවද මම නිකන් උඩ බලාගෙන ඉදියි කියලා.”

“ඒ.. කාගෙද මේ ෆෝන් එක...” එහෙම කියන ගමන් දිලීප සෝෆා එකේ හිඩසක් ඇතුලේ තිබිලා ෆෝන් එකක් ගත්තා.මම ඒක උදුරලා වගේ අරන් බැලුවා.

“ඒ... මේක කවීශගේ ෆෝන් එක බං. මේ දාලා තියෙන්නේ ෆොටෝ එක. පලවෙනි වතාවට දැක්කේ ලොක් එකක් දාලා  නැති කෙල්ලෙක්ගේ ෆෝන් එකක්.”

“එතකොට කවීශා ෆෝන් එක තියාගෙනද මෙහේ ලැන්ඩ් ෆෝන් එකෙන් කෝල් කරේ.”

“ ඒක තමයි බං, මේ කෙල්ලට මොනවා වෙලාද මන්දා.මාව හම්බුවෙන්න ඔෆිස් එකට එන්නැතුව

ගෙදරටත් ඇවිල්ලා. ඒකල්ලා මන් එනකන් ඉන්නැතුව ගිහින්.''

''එයා හෙට එයි බං,ෆෝන් එක ගන්න අනිවාර්යයෙන්ම එන්න එපැයි. ගයාන් මම දැන් යන්න ඕනේ. චතුනිව ඩිනර් එකට එක්කන් යන්න පොරොන්දු වුණා අද. ''

''මම මේ අද මෙහේ නවතින්න කියන්න හැදුවේ. කමක් නෑ යනවා.''

'' හරි එහෙනම් මම ගිහින් මෙහේ එන්නම්. එතකොට හරිනේ. උඹට කොහොමත් රෑට නින්ද යන්නෙත් නැහැනේ.''

''නෑ මම අද නිදි පෙති බීලා හරි නිදාගන්නවා. නැත්තම් ඔෆිස් ගිහාම නින්ද යනවනේ.''

ඊට පස්සේ දිලීප ගියා. මමත් වොශ් එකක් දාගෙන ඇදට ආවේ ලැප් එකත් අරගෙන ෆිල්ම් එකක් බලන්න හිතගෙන. ඒත් ඊට පස්සේ කවීශාගේ ෆෝන් එක අරගෙන නිකමට වගේ ඒකේ තිබුන ෆොටෝ බලන්න ගත්තා.

කවීශා කියන්නේ මීට මාස දෙකකට කලින් කම්පැණි එකේ අයි.ටී. ඩිපාර්ට්මන්ට් එකේ වැඩට ඇපු

කෙල්ලෙක්. දිලීපගේ ගර්ල් ෆ්‍රෙන්ඩ් චතුනිගේ විශේෂ ඉල්ලීමක් නිසයි අපි එයාව ජොබ් එක දුන්නේ. කවීශා ගොඩාක් අහින්සක කෙල්ලෙක්. එයා කාට හරි බයේ වගෙයි වැඩ කරේ. මම එයාට කැමති වුනේ එයාගෙ අහිංසක කම නිසායි. ඒත් තාමත් මම එයාට ඒක කියලා නැහැ. මම එයා එක්ක කතා කරලත් නැහැ. අද තමා පළ වෙනි වතාවට කතා කරේ.

එක පාරටම මට දෙයක් කලපනා වුණා. මම බැලුවේ ෆෝන් එකේ බ්‍රැන්ඩ් එක මොකක්ද කියලා. මේ වගේ අයි ෆෝන් එකක් කොහොමද එයා ළග තියෙන්නෙ. චතුනි කිව්වේ එයා ගොඩාක් දුප්පත් පවුලක කෙනෙක් කියලනේ. එයා කලින් ජොබ් එකක් කරපු කෙනෙකුත් නෙවෙයිනේ. ෆෝන් එක ටික කාලයක් යූස් කරපු පාටකුත් තිබුනා. ඔන්න කවීශා ගැන තිබ්බ ප්‍රෙහේලිකාව තවත් අවුල් වුණා.

ඊට පස්සේ මම අයෙත් ෆොටෝස් බලුවේ හිතේ ඇති වෙච්ච කුතුහලය හින්දා. සමහරවිට එයාට පෝසත් කොල්ලෙක් ඉන්නවද දන්නැනේ. ඒත් ෆෝන් එකේ තිබුණ ෆොටෝස්වල හිටියේ එයා විතරයි.

ඊට පස්සෙ මට තව අයිඩියා එකක් ආවා. එයාගේ සෝශල් මීඩියාවල තියෙන අකවුන්ට්වලට මාව ඇඩ් කරා නම් හොඳයි කියලා. ඊට පස්සෙ මම එයාගේ ෆේස්බුක් අකවුන්ට් එකට ගියා. ඒකේ තිබුන කවර් ෆොටෝ එක දැක්ක මට තරු පෙනිලා උඩ ගිහින් බිම වටුනා.ඒකේ තිබුනේ ලංකාවේ හොඳම ඉංජිනියර් කම්පැණි එකේ අයිතිකාරයයි එයාගේ වයිෆ්ගෙයි ෆොටෝ එකක්. ඒකේ කවීශා වගේම ටිකක් වැඩිමල් පාට කොල්ලෙකුත් හිටියා. ෆොටෝ නම් ඕනේ කෙනෙක් දායිනේ කියලා මම එයා දාලා තිබුන ඉන්ෆොමේශන් බලුවා.

ඒ ටික බලන්න කලින් ඔන්න දිලීප ආවා. එයා වොශ් එකක් දාගෙන එනකම් මම ඉවසිල්ලක් නැතුව බලන් හිටියා. ඊට පස්සේ අපි දෙන්නා එකතු වෙලා කවීශාගේ ෆේස්බුක් අකවුන්ට් එකේ තිබුන දේවල් එකක් නෑර බලුවා. ඒ ටික බලලා ඉවර වෙනකොට අපි දෙන්නට පිස්සු හැදෙන්න හොඳටම ළං වෙලායි හිටියේ.

"කවුද බං මේ කවීශා. චතුනි කිව්වේ කවීශා දුප්පත් පවුලක අන්ත අසරණ කෙල්ලෙක් කියලනේ. එතකොට මේ මොනවද?" දිලීප කිව්වා.

"කවුද දන්නේ බං. කවීශා කියන්නේ රිච්මන්ඩ් පෙරේරා කියන ලංකාවේ හොදම ඉන්ජිනියරින් කම්පැණි එකේ අයිතිකාරයගේ දුවද එතකොට? ඒ මචන් චතුනි දන්නවා ඇති ඔය කෙල්ල ගැන හැමදේම. කතා කරලා අහමුද?"

"දන් එයා නිදිත් ඇති බං. උඹේ ඉවසීමේ සීමව පැනලා හිටියට කමක් නැහැ. දැන්නම් කෝල් කරන්න බෑ හරිද?"

"හා එහෙනම්, හෙට අහමුකෝ. මේ කෙල්ල කැම්පස් යන කෙල්ලෙක්නේ.ඇයි අර විදිහට බොරු කියලා අපි ළග වඩට ආවේ."

"ඒක අතැරපං බං. එයා රිච්මන්ඩ් පෙරේරාගේ දුවනම් මොකටද අපේ ළග වැඩට ආවේ."

"පිස්සු හදිලා හොද වෙලා ආයෙත් පිස්සු හැදෙනවා බං මේවා දක්කම. ඒකෙන් මේකෙන් වෙලාවත් අමතක වුණා . බලපන් දැන් එකටත් ළගයි."

" අඩෝ, එච්චර වෙලා ගියාද? දන්වත් නිදාගමු එහෙනම්." දිලීප කාමරේට යන්න නැගිටින ගමන් කිව්වා.

දිලීප නැගිටිනකොටම මාත් නැගිට්ටා. නැගිටිනකොටම එකපාරටම වටේ තියෙන දේවල් කැරකෙන්න පටන් ගත්තා. ඒත් එක්කම මාව ෆේන්ට් වුණා. සිහිය නැති වෙලා හිටපු වෙලාවේ මට අර හීනෙන් පේන ටිකම පෙනුනා. මායා කෑගහගෙන වටෙනකොටම එකපාරටම මට ගැස්සිලා සිහිය ආවා. ඇස් දෙක අරිනකොට දිලීපයි සර්වන්ට්ලා දෙතුන් දෙනෙකුයි යකෙක් දැක්කා වගේ බය වෙලා මගේ දිහා බලන් ඉන්නවා. "හරි, දැන් ඔයාලා යන්න." එහෙම කියලා දිලීප සර්වන්ට්ලාව යැව්වා. මම ඔලුව උස්සලා නැගිටින්න හැදුවා. කොහේ නගිටින්නද, ඔලුව පැලෙන්න වගේ රිදෙනවා. මම අත් දෙකෙන්ම ඔලුව අල්ල ගත්තා.

"මොකද බං උඹට වුණේ. ඔලුවේ කොහේහරි වැදුනද."

"දන්නෑ දිලීප, මගේ ඔලුව පැලෙන්න තරම් රිදෙනවා. ඔලුව උස්සන්නවත් බෑ."

"උඹ වැටුනේ ඉස්සරහට බං.වැදෙනවනම් වදෙන්න ඇත්තේ නලලේ කොහේ හරි.'එහෙම කියලා දිලීප මගේ නළලට අත තිබ්බා."දෙයියනේ,

උඹේ ඇඟ ගින්දර වගේ රස්නෙයිනේ බං. උඹට උණ වගේ මට පේන්නේ.''

''මම ගොඩක් වෙලා සිහිය නැතුව හිටියද? උඹලා බය වෙලා බලන් හිටියේ.''

'' විනාඩි දහයක් විතර. උඹට වතුර ඉහුවට සිහිය ආවේ නැහැ.හොස්පිට්ල් අරන් යන්න හදනකොට තමයි එකපාරට සිහිය ආවේ.''

''උඹ විශ්වාස කරයිද දන්නෑ. මට සිහිය නැතිවෙලා ඉන්න අතරේ අර හීනෙන් පෙනුන ටිකම පෙනුනා බං. මායා වැටෙන ටික පේනකොටම තමා මට ගස්සිලා සිහිය ආවේ.''

''උඹ ඔය ඇත්තටමද කියන්නේ.''

''ඔව් බං, මම බොරු කියන්නේ මොකටද?''

''මේකනම් එන්න එන්නම බරපතල වෙනවා බං. වෙනදාට උඹට ඔය හීනේ පෙනිලා අහරෙන්නේ එකට විතර කිව්වා නේද? අද උඹ නිදාගත්තේ නෑ. හැබැයි සිහිය නැතිවෙලා ඒ වෙලාවට පෙනුන දේවල්ම පේනවා.''

‘‘දෙයියනේ, ඔව් නේන්නම්.මොකක්ද බං මට මේ ජේන සිද්ධිය. දැන් මේ අට වෙනි දවස ඕක පෙනුන.’’

‘‘තාම උඹට ඔය කෙල්ලගේ මූණ පෙනුනේ නැද්ද.’’

‘‘නෑ බං, හැමදාම එකම විදිහට තමා ජේන්නේ.මූණ ජේන්නේ නැහැ.’’

‘‘මම කියන්නද වැඩක්. උඹට හීනේ ඉන්න කොල්ලොන්ගේ මූණූ හොදට ජේනවනේ. අපි බලමු එහෙම කවුරු හරි ඉන්නවද කියලා.’’

‘‘උඹ හිතන්නේ ඒක ඇත්තටම වුණ සිද්ධියක් කියලාද?’’

‘‘එහෙම වෙන්න බැරි නැනේ. නැත්තම් ඇයි හැමදාම උඹට ඔය හීනේ ජේන්නේ. සමහරවිට අනාගතේ වෙන්න තියෙන දෙයක්ද දන්නෙත් නෑ.’’

‘‘මොනවා කරන්නත් කලින් මට දැන් තියන ප්‍රශ්නේ නැගිටගන්න බැරි තරමට ඔලුව රිදෙන එක.’’

‘‘උඹට හොදටම උණ බං. බලපන්කෝ ඇගේ රස්නේ. හෙට උදේම හොස්පිට්ල් යමු ආ.. උඹ හෙට

ගෙදරට වෙලා හිටපන්. මම ඔෆිස් එකේ වැඩ ටික බලාගන්නම්.''

''හරි බං, ඔෆිස් යන්න තියා මොන දේ කරන්නත් මට නගිටගන්න පුලුවන් වෙයිද දන්නෑ.උඹ දැන් ගිහින් නිදාගන්නවා. මට නම් නින්ද යයිද දන්නැහැ.''

'' උඹට අමාරුනම් මම ඉන්නම් උඹ ළඟ.''

''ඕන නැහැ. මට ලොකු අමාරුවක් නැහැ.''

# 3

අද නම් පාන්දර ටිකක් නින්ද ගියා. ඒත් දිලීප උදේම ඇහැරවලා මාව හොස්පිටල් එක්කන් ගියා. බෙහෙත් අරගෙන මාව ගෙදරට දාලා දිලීප ඔෆිස් එකට ගියා. මට තිබුණ අමාරුව නිසා මම ගෙදර ඇවිත් ආයෙත් නිදාගත්තා. දවල් වෙලා මට ඇහරුනේ කවුරු හරි මගේ ඔළුව අතගානව දැනිලා. ඒත් එක්කම මට හොදට පුරුදු සෙන්ට් සුවදකුත් ආවා. ඒත් මම ඇස් අරිනකොට මගේ ළග කවුරුත් හිටියේ නැහැ. මට දිවුරලා වුනත් කියන්න පුලුවන් ඇස් අරින්න කලින් මගේ ළග කවුරු හරි හිටියා කියලා. අනේ මන්දා මොනවා වෙනවද කියලා  මට නම් තේරෙන්නේ නැහැ.

දැන්නම් ටිකක් උණ අඩුයි වගේ.ඒ නිසා මම පහළට බැහැලා සාලෙන් වාඩි වුණා. ඔහේ කල්පනා කර කර ඉන්නකොට ටීපෝව උඩ කවීශාගේ ෆෝන් එක තියෙනවා දක්කා.'මේක කොහොමද මෙතෙන්ට ආවේ. මේක තිබුනේ මගේ රූම් එකේනේ'එහෙම හිතන ගමන් මම ඒක අතට ගත්තා.

කවීශා ගැන දැනගන්න පුලුවන් තව මොනවා හරි තියෙනවාද කියලා බල බලා ඉන්නකොට හයිඩ් කරලා තිබුන ෆෝල්ඩර් එකක් තිබුනා. ඒත් ඒක ලොක් කරලයි තිබුනේ. මම දන්න හැම විදිහටම ට්‍රයි කරත් ඒක අරින්න බැරිවුණා. ඔන්න ඒ වෙලාවේ ඒ ෆෝන් එක රින්ග් වුණා. ඒ කෝල් එක ඔෆිස් එකේ නම්බ්‍ර එකෙන් . ඒ නම්බර් එක් මගේ කැබින් එකේ තියෙන ෆෝන් එකේ නම්බර් එක. ඒකෙන් ගන්නවනම් ගන්නේ දිලීප විතරනේ. ඌ මොකටද මේකට ගන්න්නේ. කවුරු වුණත් කියලා මම කෝල් එක ආන්සර් කරා.

“හලෝ, මේ ගයාන් නෙද? මම කවීශා කතා කරන්නේ. මම ඔයාව හම්බුවෙන්න කියලා ඔෆිස් එකට ආවා. ඒත් දිලීප කිව්වා  ඔයාට උණ හදිලා ගෙදර කියලා.”

“ආ ඔව්, මේ පොඩි උණක් . ඔයා ගෙදරට එන්න. මාව හම්බුවෙන්න පුලුවන් අද ආවොත්.”

“අද නම් මට එන්න බරි වෙයි ගයාන්. මට දැන් වඩක් තියෙනවා. මගේ ෆෝන් එක ගන්න මම පුලුවන් වුණොත් හවසට එන්නම්. “එහෙම කියලා

එයා ෆෝන් එක කට් කරේ මම් මොකුත් කියන්නත් කලින්.

කවීශා කතා කරාට පස්සේ මට අමුත්තක් දනෙන්න පටන් ගත්තා. එයා කෝල් කරේ ඔෆිස් එකේ නම්බර් එකෙන් වුණත් මට දනුනෝ එයා මගේ ඉස්සරහා ඉදන් කතා කළා වගෙයි. අනේ මන්දා. මට වෙලාවකට හිතෙනවා පිස්සු හදීගන එනවද කියලා.

දවල් බෙහෙත් බිව්වට පස්සේ බෙහෙත්වල සැරටද මන්දා ලොකු නිදිමතක් ආවා. ඉතින් මම ගිහින් නිදාගත්තා. හවස් වෙලා ඇහැරෙනකොට ආයෙත් මට දැනුනා කවුරු හරි මගේ ඔලුව අතගානවා කියලා.දවල් දැනුන සෙන්ට් සුවදම දනුනා. මම ඇස් අරන්නැතුව විනාඩි දෙක තුනක් එහෙම්මම හිටියා. ඒ මුලු වෙලාවෙම කවුරුර් හරි මගේ ඔලුව අතගානවා මිට් හොදටම දැනුනා. ඒත් මම අස් අරිනකොට මගේ ළග කවුරුත්ම හිටියේ නැහැ.

මම නැගිටලා ඇද පිට්පස්සට හෙත්තු වුණා. මට මහ අමුතු හැගීමක් දැනෙන්න පටන් ගත්තා.ඒක මහ මූසල හැගීමක්. ඒ වගේම ලොකු දුකක්. ටික වෙලාවක් යද්දී මෙන්න මගේ ඇස් දෙකෙන් කදුලු

ගලනවා. මට පිස්සුද කියලා හිතන ගමන් මම කඳුළු පිහදගත්තා. තවත් පයකට විතර පස්සේ දිලීප ආවා. වොශ් එකකුත් දාගෙන ඌ මගේ කාමරේට ආවේ මොකක්දෝ සීඩී එක්කුත් අරගෙන.

“මොකද බං උඹේ මූණේ හැටි. ඌබට තාම අමාරුද?”ඇඳෙන් ඉඳගන්න ගමන් දිලීප ඇහුවා.

“දැන් උණ අඩුයි බං. ඒක නෙවෙයි ප්‍රශ්නේ. මට හිතෙන්නේ මට පිස්සු හදීගන එනවද කොහෙදෝ. උඹ විශ්වාස කරන එකක් නෑ බං අද වුණ දේ.”

“ඇයි මොකද වුණේ.”

“මම බෙහෙත් අරන් ඇවිත් නිදාගත්තා බං. ඒකරලා දවල් අහැරෙනකොට කවුරු හරි මගේ ළඟ ඉඳන් ඔලුව අතගානවා වගේ දැනුනා. ඒත් අස් අරිනකොට කවුරුත් හිටියේ නැහැ.”

“විකාර කියවන්න් එපා බං. උඹ හීනෙන් දකින්න ඇත්තේ එහෙම.”

“පිස්සුද බං.දැන් හවසත් එහෙම වුණා. හීනෙන් දැක්කනම් මට කොහොමද සෙන්ට් සුවදක් දනෙන්නේ.”

“මට පේන්නේ ඊයේ උඹ වැටුන වෙලේ ඔලුව කොහේහරි වදිලා වගේ. පිස්සු දොඩවන්නැතුව හිටහන්. උඹේ ඔය අමාරුව හරියන්නත් එක්ක මෙන්න මේක බලපන්.මේ අවුරුද්දේ තිබ්බ ඔෆිස් පාර්ටි එකේ සීඩී එක මේ.”

“ඕ එහෙමද, මේකේ කවීශාත් ඇතිනේ. මගේ ලැප් එක අරන් වරෙන්කෝ අපි දෙන්නම් බලමු.”

ඊට පස්සේ අපි දෙන්නා පාර්ටි එකේ වීඩියෝ එක බලන්න පටන් ගත්තා. කොච්චර හෙව්වත් කවීශාව නම් ඒකේ හොයාගන්න බැරි වුණා. ඉතින් මම කවීශාව හොයන එක පැත්තක තියලා වීඩියෝ එක බලන ගමන් දිලීපත් එක්ක කතාවක් පටන් ගත්තා.

“උඹ අද උදේම රොයිටරේ වගේ මට උණ කියලා වාර්තාව දීලා නේද?”

“මොකක්ද? කාටද?”

“කවීශාට බං. එයා කිව්වේ මාව හොයාගෙන ඔෆිස් එකට ආවම උඹ කිව්වා කියලා.”

“පිස්සුද? කවීශා අද ඔෆිස් එකට ආවයෑ”

"ආවේ නෑ, ආවේ නත්තම් එයා කොහොමද දන්නේ මට උණ කියලා. එයා මට ඔෆිස් එකේ ෆෝන් එකෙන්මනේ කෝල් කරේ. එයගේ ෆෝන් එක ගන්න එන්නම් කියලත් කිව්වා."

"ගයාන්, උඹට ඇත්තටම පිස්සු වගේ මට පේන්නේ.අද දවසම මම හිටියේ ඔෆිස් එකේ. කවීශා උඹව හොයාගෙන ආවෙත් නැහැ කවුරුත් ඒ ෆෝන් එකෙන් උඹට කෝල් කරෙත් නැහැ."

"පිස්සු නෙවෙයි, පොඩ්ඩක් හිටපන් මම උඹට පෙන්නන්න." එහෙම කියලා මම කවීශාගේ ෆෝන් එකට ආපු කෝල් එක පෙන්නුවා.

"අඩෝ ඇත්තටම කෝල් එකක් ඇවිත්නේ.ඒත් අද කවීශා ඔෆිස් එකට අවේ නෑ බං. අඩුම තරමේ කෝල් එකක් දීලවත් උඹට උණ කියලා කිව්වේ නැහැ. උඹට සැකනම් ඔෆිස් එකේ සීසීටීවී තියෙනවනේ බලපන්."

"අනේ මේ දිලීප මම වදින්නම්. විහිලුවකට ගන්න එපා බං හමදේම. මම මේ අවුල් වෙලා ඉන්නවා උඹ හැමදේටම විහිළු කරනවා."

“හරි හරි, මම ආය මොකුත් කියන්නේ නෑ.දැන් ඕක බලපන් කට වහගෙන.”

ඒ වෙනකොට වීඩීයෝ එකේ අන්තිම අහරිය තිබුනේ. ඇනුවල් පාර්ටි එකේ කේක් එක කපුවට පස්සේ කට්ටිය නටන ටිකයි තිබුනේ. ඒත් මම බලන් හිටියේ නටන අය දිහා නෙවෙයි. ඒ හෝල් එකේ කොනක තිබුන ජනේලයක් ගාවට වෙලා හිටියේ එයා. එයා හිටියේ පිටිපස්ස හැරිලායි. ඔව් ඒ එයාම තමයි. දණිස්ස ගාවට දිග ස්ට්‍රේට් කරපු කොණ්ඩේ. බිමටම දිග සුදු පාට ගවුම. ඒ මායා. ඒක දැකලා මට එකපාරටම කෑගැස්සුනා. මම වීඩීයෝ එක නතර අකරලා දිලීපට මායා ව පෙන්නුවා.

“උඹට හොදටම ශුවර්ද මේ එයාමයි කියලා. වීඩියෝ එකේ වෙන කොහෙවත් මෙයා හිටියේ නැහැනේ,” එහෙම කියලා දිලීප වීඩියෝ එක ෆෝවර්ඩ් කරලාත් බැලුවා. ඒත් එයා දිගටම හිටියේ පිටිපස්ස හැරිලා. කොතනකවත් එයාගේ මූන පෙනුනේ නැහැ. “අයියෝ බං, මේකෙත් අඳුරගන්න බෑනේ කවුද කියලා.”

මට හීනෙනුත් මූණ පෙන්නැනේ බං. දැන්නම් මටත් හිතෙනවා මම මේ දකින්නේ ඇත්තම සිද්ධියක් කියලා.''

''අපිට ඔෆිස් එකේ අයගෙන් අහලා බලන්න පුලුවන්නේ මායා කියන්නේ කවුද කියලා. ඔෆිස් එකේ ඔක්කොම ඩීටේල්ස් ඇතිනේ. ''

''එතකොට මේ මායාව අපි ළග වැඩ  කරන කෙනෙක්. අපි ළග ඉන්නෙම මහා අද්භූත කෙල්ලොනේ බං.''

''ඒක තමයි. උඹත් හරි අද්භූතයිනේ. ඒ හිනදා ඒකේ පුදුම වෙන්න දෙයක් නැහැ,''

''අනේ කට වහන් හිටපන්. දන්නම් මට නිදිමතයි. බෙහෙත්වල සැරටද කොහෙදෝ නින්ද යනවා. මම නිදාගන්නවා.''

''හරි හරි, ගුඩ් නයිට් මාත් යනවා නිදාගන්න. '' දිලීප එහෙම කියලා කාමරේට ගියා

නිදාගත්තත් ඉතින් සුපුරුදු සිද්ධියම තමා. පාන්දර එකට අර හීනෙම දකලා ඇහැරුනා. හැබයි ඩෙවියන්ට පි සිද්ධ වෙන්න මට ආයෙත් නින්ද ගියා.

# 4

පහුවදා තියෙන අමාරු ඔක්කොම පැත්තක තියලා ඔෆිස් ගියේ මායා කවුද කියලා හොයාහන්න ඕනේ හින්දා. ඒත් ඉතින් මගේ බලාපොරොත්තුවනම් ඉෂ්ඨ වුණේ නැහැ.කවුරුත්ම මායා නමින් කාවවත්ම ඩැනගෙන හිටියේ නැහැ. ඉතින් මමයි දිලීපයි වැඩ කරන අයගේ විස්තර තිබ්බ ෆැයිල් සේරම පීරලා හෙව්වත් මායා නමින් කිසිම විස්තරයක් තිබුනේ නැහැ.

''මොකක්ද බං මේ විකාරේ. උඹ කියන විදිහට ඒ වීඩියෝ එකේ උඹට හීනෙන් පේන මායා ඉන්නවා. ඒ වුණාට ඔෆිස් එකේ මායා නමින් කවුරුත් නැහැ.

''අනේ මන්දා බං . පිස්සු හැදෙනවනේ මේ වෙන දේවල්වලට. එහෙන් කවීශා පිස්සු නටනවා. වෙන හැම දෙයක්ම මහා පටලැවිල්ලක් . මගේ ඔලුවත් රිදෙනවා.''

''උඹ දැන් ගෙදර පලයන්. උණ අමාරුවත් එක්කනේ. බෙහෙත් ටික බීලා රෙස්ට් කරාම ඕක අඩුවෙයි.''

“හරි බං, මම යන්නම්. අර අලුත් කන්ට්‍රැක්ට් ටිකේ ෆයිල්ස්වල වැරදි තියෙනවාද කියලා බලනවා ඈ...”එහෙම කියලා මම ඇවිල්ලා කාර් එකට නැග්ගා. එතකොටම මගේ ෆෝන් එක රින්ග් වුණා. කෝල් එක ආවේ මම නොදන්න නම්බර් එකකින්.

“හලෝ, කවුද මේ.”

“ගයාන්, මම කවීශා. මගේ ෆෝන් එක ඔයා ළගනේ. ඒකයි මේ නම්බර් එකෙන් කෝල් කරේ. මන් මේ පොඩි උදව්වක් ඉල්ලන්න කතා කරේ.”

“ මොකද්ද උදව්ව?”

“අනේ මම මෙහෙම ඇහුවාට මොකුත් හිතන්න එපා. මාව හම්බුවෙන්න එන්න පුලුවන්ද? මම ඉන්නේ යාලුවෙක්ගේ ගෙදරක. ඔයාට මම එන හැටි කියන්නම්. අනේ ඔයාට පුලුවන්ද?”

“හරි මම එන්නම්. හැබැයි ඔයාගේ ෆෝන් එකනම් ගේන්න හම්බුවෙන්නේ නෑ. ඒක ගෙදර . මම ඔෆිස් එකේ.”

“ඒකට කමක් නැහැ. ඔයා එන්නකෝ. මට ඔයාට කියන්න ලොකු කතාවක් තියෙනවා. මම මසේජ් එකක් එවන්නම් පාර කියලා.”

ඊට පස්සෙ මම එයා එව්ව් මැසේජ් එකේ තිබුණ පාරේ ගිහින් එයා ඉන්නවා කිව්ව තනට ගියා. මම යනකොට එහේකවුරුත් හිටියේ නැහැ.මම ගිහින් දොරේ බෙල් එක ගැහුවා. ඒත් කවුරුත් දොර අරින්න ආවේ නැහැ.”කවීශා, ඔයා ඉන්නවද” මම දොරට තට්ටු කරලා කතා කරා. ඒත් කිසිම සද්දයක් නැහැ.මම දොරේ ලොක් එකට අත තිබ්බා. මෙන්න දොර අරුණා. ඉතින් මම ඇතුළට ගියා. කවීශා කියලා කතා කරත් කිසිම ස්ද්දයක් නෑ. ගෙදර කවුරුත් නෑ වගේ. ‘මේ කෙල්ල මට එන්න කියලා කොහේ ගියාද?’ මම කල්පනා කරා.

එතන තිබුන ටීපෝව උඩ ඩයරියක් තිබුනා. ඒ ඩයරිය උඩ මොන්වදෝ ලියපු කොලයක් තිබුනා. මම ඒ කොලේ අරන් බැලුවා. ඒක ලියලා තියෙන්නේ කවීශා. ඒකේ තිබුනේ මෙහෙම.

‘ගයාන්, මට හදිස්සියේම එළියට යන්න වෙනවා. අනේ සොරි. ඔයා මේ ඩයරිය අරන් යන්න.

ඔයාට කියන්න ඕනේ කතාව ඕකේ ලිඅයලා තියෙනවා.මම එයි කියලා බලන් ඉන්න එපා.'

අනේ මන්දා, මේ කෙල්ල මොනවා කරනවද මන්දා.එයාට කෝල් කරලා කියන්න තිබුනනනේ මට එන්න එපා කියලා. මම මේ උණ අමාරුවත් තියාගෙන ආවේ එයාව හම්බුවෙන්න ඕනේ නිසායි. එයා මට කෝල් කරපු නම්බර් එකට මම කෝල් එකක් ගත්තත් ඒක වැඩ කරේ නැහැ.

ඉතින් මම ඩයරියත් අරගෙන ගෙදර ආවා. වෙලාවකට කවීශාත් එක්ක මට පුදුම තරහක් එන්නේ. ගෙදර ඇවිත් මම ඩයරිය පැත්තක තියලා බෙහෙත් බීලා නිදාගත්තා. පැය දෙකකට විතර පස්සේ තමයි මට ඇහැරුනේ. ඊට පස්සේ මම වොෂ් එකක් දාගෙන ඩයරිය කියවන්න පටන් ගත්තා. මෙතන ඉදන් මම එයා ඒකේ ලියලා තිබුණ විදිහටම එයාගේ කතාව ඔයාලට කියන්නම්.

*************************************

මම කවීශා. මයුමි කවීශා පෙරේරා. ලංකාවේ හොදම ඉංජිනියරින් කම්පැණි එකේ ඕව්නර් රිච්මන්ඩ් පෙරේරාගේ දුව. අද මම මගේ මේ අවාසනාවන්ත

කතාව මේ විදිහට ලියන්න වැදගත් හේතුවක් තියනවා. ඒක තමයි මගේ ජීවිතේ නැතිවුණ දවසක ඒකට හේතුව කවුරුහරි දැනගන්න ඕනේ එක.

මගේ ජීවිතේ ලස්සනට ගෙවිච්ච ජීවිතයක්. ඒ ලෙවල් විභාගේ හොද ප්‍රතිපලයක් ගන්න මට ලබුණා. ඉතින් මම කැම්පස් එකේ ඉංජිනේරු පීඨයේ ඉගෙනගන්නවා. කැම්පස් ජීවීතේ අවුරුද්ඩු තුනක්ම කිසිම ප්‍රශ්නයක් නැතුව ගෙවිලාඅ ගියා. මේ අතරේ මට ආදරේ කරන්න කෙනෙකුත් හම්බුවුණා. ඒ තමයි විශ්ව. විශ්ව කියන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක්ගේ පුතෙක්. කැම්පස් එකේ තුන්වෙනි අවුරුද්දේ අන්තිම වෙනකොට මගේ ජීවීතෙට ලොකු කුණාටුවක් හැමුවා.කවුරුත් දන්න විදිහට මගේ අම්මායි, තාත්තායි ප්ලේන් ක්‍රෑෂ් එකෙන් නැති වුණා. ඒත් ඒක නෙවෙයි මගේ ජීවීතේට හමපු කුණාටුව. ඒ දෙන්නාගේ මරණෙන් පස්සේ සිද්ධ වෙච්ච දේවල් මගේ ජීවීතේ අපායක් කළා.

අම්මයි තාත්තායි මැරෙනකොට කිසිම දේපලක් අයියාගේවත් මගේවත් නමට ලියලා තිබුනේ නැහැ. අවසාන කමති පත්‍රයක් තිබුනෙත්

නැහැ. මල ගෙදර හැම වැඩක්ම ඉවර වුණාට පස්සේ අයියායි නෑනයි මාව හම්බුවෙන්න ආවා.

"නංගි, මට ඔයත් එක්ක කතා කරන්න දෙයක් තියනවා. "

"මොකද්ද අයියේ කියන්න."

"කතා කරන්න දෙයක් නෑ. ඔයා එයාට කෙලින්ම කියලා දාන්න."මගේ නෑනා කිව්වා.

"ඔව්, මම කෙලින්ම කියන්නම්. තාත්තාගේ මේ කිසිම දේපළක් ඔයාගෙවත් මගෙවත් නමට ලියලා නැහැ.මට අද එයාගේ කමරේ තිබ්ලා අවසාන කැමති පත්‍රේ හම්බුණා. ඒකේ හටියට මේ හැම දේපළක්ම ලැබෙන්නේ මට. ඔයාගේ නමට කිසිම දෙයක් නැහැ."

"ඔයා කලින් කිව්වේ අවසන් කැමති පත්‍රයක් නෑ කියලා නේද? දැන් කොහෙන්ද අවසන් කැමති පත්‍රයක් ආවේ. අනික මේ වෙලාවේ ඔයාට වැදගත් දේපළද.මම මේ අම්මායි තත්තායි නැතිවෙච්ච දුක දරාගන්න බැරුව ඉන්නවා."

“අවසාන කැමති පත්‍රයක් තියනවා. මම ලෝයර් කෙනෙක්ට ඒක දීලා බැලුවා. ඒක නීත්‍යානුකූලයි. “

“හරි දැන් ඔයා මට මොකද්ද කියන්නෙ.”

“කියන්නේද, දැන් මේ හැමදෙයක්ම මගේ. ඔයා මේ දැම්ම මේ ගෙදරින් යන්න ඕනේ. තේරුනාද.”

“ අයියේ, ඔයා මේ මොනවද කියන්නේ. මම ඔයාගේ නංගිනේ. මේ දේවල් ඔයාගෙ වුණත් ඇයි මට මේ ගෙදර ඉන්න බැරි.”

“දැන් අයියා එකපාරක් කිව්වානේ. මේ දැම්ම මෙහෙන් යනවා.”නැනා කිව්වා.

“අයියේ, අඩුම තරමේ මට ඉන්න තැනක්වත් හොයාගන්න කාලයක් දෙන්නකෝ.”

“නවතින්න තැනක් හොයාගන්න. සල්ලි තියනවාද නවතින්න තනක් හොයාගෙන ගෙවන්න.”

“මගේ බැන්ක් අකවුන්ට් එකේ තාත්තා දාපු සල්ලී තියනවනේ.”

“අනේ මගේ නංගි බබෝ, දැන් ඔයාගේ බැන්ක් අකවුන්ට් වල එක රුපියලක්වත් නහැ. ඒ ඔක්කොම

මගේ ඒවාට ට්‍රාන්සර් කරා.විශ්වාස නැත්තම් මේ දැන් බැංකුවට කතා කරලා බලන්න.''

''ඔයාට මගේ සිග්නේචර එක නැතුව එහෙම කරන්න බැහැ. මම කවදාවත් එහෙම දේකට අත්සන් කරලා නැහැ. ''

''අයියෝ, ඔයාගේ සයින් එක ගහන එක මට මහලොකු වැඩක් නෙවෙයි. දැන් කටවහගෙන බහිනවා එළියට.''

''එහෙම නොකරොත් ඔයා මට මොනවා කරන්නද? මම හිතුවේ නෑ අයියේ ඔයා ඔහොම කෙනෙක් කියලා. සල්ලි නිසා ඔයා ඔයාගේ නංගිට ඔහොමද සලකන්නේ. ''

''අනේ මේ, තමුසෙගේ දේශනා මට වැඩක් නැහැ. ඕන්නම් අඳුම් ටිකත් අරගෙන යන්වා.දැන් යනවා.''

''මම යන්නේ නැහැ. මේක ඔයාගේ වගේම මගෙත් ගෙදර.'' මම කෑගහුවා. ඒ වෙලාවේ ජීවිතේ පළවෙනි වතාවට අයියා මගේ කම්මුලට ගැහුවා. ඊට පස්සෙ එයා මාව ගෙදරින එළියට ඇදලා දැම්මා. අක්කා මගේ

ඇඳුම් ටික ගෙනල්ලා මූණට දමලා ගැහුවා.ගෙදර සර්වන්ට්ලා ඔක්කොම බලාගෙන හිටියා.

"එකෙක් හරි මේකිට මේ ගෙදරින් වතුර උගුරක් හරි දීලා තිබුනොත් මම ඒ කෙනා ගැන බලාගන්නම්." අයියා හැමෝටම කෑගැහුවා.

හොද වෙලාවට මගේ කාර් එකේ යතුර මගේ ළග තිබුනා. මම බිම පුරා වැටිලා තිබුන ඇඳුම් ටික අරගෙන කාර් එකට දැම්මා. මට ඒ රෑ ඉන්න වුණේ කාර් එකේ. මම ගොඩාක් ෂොක් වෙලායි හිටියේ ඒ වෙලාවේ. කාර් එක ඇතුළට වෙලා මම පැය ගානක් ඇඩුවා. මට හිතාගන්න බැරි වුණා මගේම අයියා මට මෙහෙම කරා කියලා. මට වෙලාවකට හිතුනා මම හීනයක් දකිනවා ඇති කියලා.

ඒත් නැහැ, මම පහුවදා උදේ ඇහැරුණේ කාර් එක ඇතුළේ. මම කොහොමහරි හිත හයිය කරගත්තා. තව අවුරුද්දකින් මම ඉංජිනේරුවෙක්. ඒ නිසා එක අවුරුද්දක් ඉවසුවොත් හරි. මම හිතුවා.

ඒත් මට ජීවිතේ කවදාවත් දුක් විදලා පුරුද්දක් තිබුනේ නැහැ. මම සැපට හැදුන කෙල්ලෙක්නේ. කාර් එකේ ඉදන්ම චේන්ජ් කරගත්ත මම කැම්පස්

යනවා කියලා පිටත් වුණා. කලින් දවසේ රෑට කාලත් නෑ. උදේට කෑමත් නෑ. මොකුත් ගන්න අතේ සල්ලිත් නැහැ. මට මොනවා කරන්නද කියලා හිතාගන්න බැරි වුණා.

ඉතින් ඒ වෙලාවේ මට යන්න ඉතුරුැර් වෙලා හිටියේ එකම එක්කෙනයි. ඒ තමයි මගේ ආදරේ විශ්ව. ඉතින් මම කැම්පස් එක පුරාම ඇවිදලා. එයාව හොයාගත්තා. අඩුම තරමේ මට එයා හරි ඉන්නවානේ. එයා මට උදව් කරයි කියලා මම හිතුවා.

"විශ්ව මට ඔයාට කියන්න ලොකු දෙයක් තියනවා." මම අඩ අඩාම කිව්වා.

"ඔයාට මොනවාද මට කියන්න තියෙන්නේ. ඇයි මෙහෙම අඩන්න්නේ. ම්.... ඔයා අද උදේම අවිල්ලා. ඔයා කාලද ඉන්නේ."

මම නැහැ කියන්න ඔළුව වැනුවේ අඩන ගමනමයි.

" හරි එන්න. අපි කැන්ටින් එකට ගිහින් මොනවා හරි කාලා ඉමු. මාත් උදේට කාලා නැහැ."එහෙම කියලා එයා මාව කැන්ටින් එකට එක්කරගෙන ගියා. මම කන අතරේ වෙච්ච හැමදෙයක්ම එයාට කිව්වා.

එයා කිසිම දෙයක් නොකියා අහගෙන හිටියා. අපි කැන්ටින් එකෙන් එළියට ආවට පස්සේ එයා එකපාරටම මගේ අත ගසලා දාලා යන්න ගියා. මම කොච්චර කතා කරත් එයා නතර වුණේ නැහැ.

ඉතින් ආයෙත් මගේ කඳුළු අලුත් වුණා. එයාට කෝල් කරත් ෆෝන් එක ආන්සර් කරේ නැහැ. මම අඩ අඩා ඉන්නකොට මගේ යාලුවෝ ටික මාව හොයාගෙන ආවා. මොනවා වුණත් හැමදේම මෙයාලට දැනගන්න දෙන්න බෑ. මම මගේ කඳුළු පිහදගත්තා. මගේ ගැන හැම දෙයක්ම මම කියන්න්නේ චතුනිට විතරයි. අනිත් අය මගේ ගැන දන්නේ ටිකයි. මම හිත හදාගන ලෙක්චර්ස් වලට ගියත් කිසිදෙයක් අහගන හිටියේ නැහැ.

ඇයි විශ්වත් අර විදිහට ගියේ. එයත් මාව අතාරින්නද යන්නේ. මම කල්පනා කරා. නැහැ.එයා මට ආදරෙයිනේ. එයා එහෙම කරන එකක් නැහැ. මම හිතුවා. යාළුවෝ ටික දවල්ට කන්න යන්න කතා කරනකොට තමයි මට මතක් වුණේ මගේ අතේ රුපියලක්වත් නෑ කියලා. ඉතින් මට වෙන කරන්න දෙයක් තිබුනේ නැහැ. මම කිව්වා පර්ස් එක අමතක වෙලා ඇවිත් කියලා. ඒ නිසා යන්තම් බේරුනා. ඒත්

මම හැමදාම බොරු කියන්නද? මට තෙරේන්නේ නෑ මොන්වා කරන්නද කියලා.

අන්තිමේට මම හතුනිව ඇදගෙන කාර් එකට ගියා. කාර් එකේ පිටිපස්සේ දාලා තිබුන මගේ අඳුම් දැකලා එයාට පුදුම හිතිලා.

" ඒ.. මොකද මේ, අයි මේ ඇදුම් ඔක්කොම ක්කර් එකේ."එයා එහෙම අහනකොට මට හයියෙන් ඇඩුනා. "ඇයි මේ අඩන්නේ. මොකද්ද වුණේ."

ඉතින් මම එයාට හමදේම කිව්වා. විශ්ව උදේ හැසිරුන විදිහත් කිව්වා.

"මට හිතුනා උදේ මූණ එල්ලන් ඉන්නකොට මොනවා හරි වෙලා තමයි කියලා.දැන් ඉතින් මොකද කරන්නේ. ඔයා කොහෙද දන් ඉන්නේ."

"ඉන්න තැනක් නෑ චතු. තැනක් හොයාගත්තත් මගේ ළැග සල්ලී නැහැ. මම ඊයේ රෑ හිටියේ කාර් එකේ."

"මම ඉන්නෙත් හොස්ටල් එකේනේ. නැත්තම් ඔයාට මාත් එක්කවත් ඉන්න තිබුනා.ඔයාට හැමදාම කාර් එකට වෙලා ඉන්න පුලුවනෑ."

“ඔව්, මේ කාර් එක අයියා මට දුන්න එකක්. මේක තියෙන්නේ එයාගේ නමට. එයා කොයි වෙලේ හරි කාර් එකත් අරන් යයි.”

“දැන් ඉස්සරවෙලා අඩන එක නවත්තන්නකෝ ළමයෝ. මම අඳුරන කෙනෙක් ඉනනවා. මගේ ඉස්කෝලේ යන කාලේ යාලුවෙක්. ඉන්න මම එයාට කතා කරලා ඔයාවා එහෙට යවන්නම්. ඊට පස්සේ එයා යාළුවාට කෝල් කරා. හොද වෙලාවට එයාගේ යාළුවා මාව එහේ තියාගන්න කැමති වුණා.

ඒ වෙලාවෙම චතුනි මාව එහෙට එක්කන් ගියා. චතුනි මගේ අතට එයා ළග තිබුණ සල්ලිත් දීලයි ගියේ.චතුනිගේ යාලුවා උදාරිගේ ගෙදර එයයි එයාගේ නංගියි විතරයි හිටියේ. උදාරි ජොබ් එකක් කරා. එයාගෙත් අම්මයි තාත්තායි හිටියේ නැහැ. ඉතින් එයාට මගේ දුක හොදට තේරුනා. එයා මගේ හිත හදන්න ගොඩාක් උතසාහා කරා. ඒත් මට ඒ කිසිම දේකින් හිත හදාගන්න පුලුවන් කමක් තිබුනේ නැහැ. විශ්වට කෝල් කරත් එයා මගේ කෝල් ආන්සර් කරේ නැහැ. මට හිතාගන්න බැරි වුණා මට මේ මොනවද වෙන්නේ කියලා. ආදරේ කරන හැම කෙනාම මාව අතැරලා යන්නද හදන්නේ.

## 5

මුළු රැයක්ම තනියම ඉඳගෙන ඇඬුවත් මගේ හිතේ තිබුණ දුක ඉවරයක් වුණේ නැහැ. කොහොමහරි උදාරි කියලා කියලා මාව කැම්පස් එකට යැව්වා. උදේ ලෙක්චර්ස් වලින් පස්සේ මම විශ්වව හොයාගෙන ගියා.

ඒත් මට හම්බුනේ මට ආදරේ කරපු විශ්වව නෙවෙයි. වෙන කෙල්ලෙක්ගේ අතින් අල්ලගෙන ගහක් යටට වෙලා හිටපු විශ්වව.ඒක දකලා ෂොක් වුණ මම එතනම් ගල් වුණා. විනාඩි පහක් විතර යනකම් මට ඇවිදගන්නවත් සිහියක් තිබුණේ නැහැ. අන්තිමට මම කොහොමහරි විශ්වගේ ළගට ගියා.

“විශ්ව ඔයා... ඔයා වෙන කෙල්ලෙක් එක්ක. ඇයි මේ...”මම කඳුළු අතරින් කිව්වා.

“ඔයාව මෙහෙම හම්බුන එක හොදයි. මම ඔයාට කියන්න හිටියේ ආව අතැරලා දාන්න කියලා. මට ඔයාට වඩා හොද කෙනෙක් හ්ම්බුනා.”

“අනේ විශ්වා, ඔයා..ඔයා මොනවද මේ... කියන්නේ. ඊයේ උදෙත් ඔයා මාත් එක්ක හොදට හිටියනේ. ඇයි මේ එකපාරටම.”

“දැන් මට තමුසෙගෙන් වැඩක් නැහැ. ටානියා තමුසෙට වඩා දහස් ගුණයක් හොදයි. දැන් මට වදයක් නොවී මාව අතැරලා දානවා.”විශ්ව කෑගැහුවා.

“අනේ විශ්ව ඔයත් ඇයි මට මෙහෙම කරන්නේ. මේ වෙලාවේ මට ඔයා විතරයි ඉන්නේ. මට මෙහෙම කරන්න එපා විශ්ව.”

“ඒකම තමයි ප්‍රශ්නේ. දැන් තමුසේ කිසිම දෙයක් නැති හිගන කෙල්ලෙක්. දැන් මට තමුසෙව වැඩක් නෑ.”

“විශ්ව, මේ ඔයාමද කතා කරන්නේ. ඔයා මට ආදරේ කරේ සල්ලි වෙනුවෙන්ද. ඔයා පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක්ගේ පුතෙක්. එහෙම වෙලත් ඔයා......”

“කට වහගන්නවා. ඔව් මම තමුසෙට ආදරේ කලේ සල්ලි නිසා තමයි.දැන් පාඩුවේ මාව අතැරලා යනවා.”

“අනේ විශ්ව මට මෙහෙම කරන්න එපා.මම වදින්නම්. මේ වෙලාවේ ඔයත් මාව දාලා යන්න

එපා.''මම විශ්වගේ කකුල් දෙක ළග වැටිලා කිව්වා. ඒත් එයා නිකමටවත් මාව ගනන් ගත්තේ නැහැ. මම එතනම අඩ අඩා ඉද්දී එයා ටානියා එක්ක යන්න ගියා. මම එතනම දණ ගහගෙන ගොඩක් වෙලා ඇඩුවා. තවත් කැම්පස් එකට වෙලා ඉන්න මට ආසාවක් තිබුණේ නැහැ. මම යන්න කියලා කාර් එක ළගට ආවා.

''නංගි, මේ කාර් එක තියෙන්නේ මගේ නමට. මම මේක විකුණනවා. මට යතුර දෙනවා.''

''අනේ අයියේ...''මට කතා කරගන්න පුලුවන් වුණේ නැහැ.ඇඩුනා.මගේ අතේ තිබුණ යතුර උදුරලා වගේ අරගෙන එයා යන්න ගියා. ඉතින් මම අඩ අඩාම බස් හෝල්ට් එකට ගියා. ජීවිතේ පළවෙනි වතාවට මම එදා තමයි බස් එකක ගියේ.

මට තේරුනේ නෑ මොනවා කරන්නද කියලා. බස් එකේදී අඩන්නතුව හිටියේ බොහොම අමාරුවෙන්. මම මොන පවක් කරාටද මට මෙහෙම වෙන්නේ.අයි මම ආදරේ කරන හැමෝම මාව අතෑරලා දාන්නේ. මට හිතාගන්න බැරි වුණා.මම ගිහිල්ලත් විශ්වට

කෝල් කරා. ඒත් එයා ආන්සර් කරේ නැහැ. මමත් එයා ආන්සර් කරනකම්ම කෝල් ගත්තා.

අන්තිමට එයා ෆෝම් එක ආන්සර් කරා. ඊට පස්සේ කවදාවත් නොකියපු තරමේ දේවල් කියලා බැන්නා. එයා යක්ෂයෙක් වගෙයි කෑගැහුවේ. අන්තිමේට එයා ෆෝන් එක තිබ්බේ මෙහෙම කියලා.''තමුසෙට මාව අතාරින්න බෑ නේද? හෙට බලාගන්නවකෝ තමුසෙට මොකද වෙන්නේ කියලා.''

මට මේ කිසිස්ම දෙයක් දරාගන්න පුලුවන් කමක් තිබුනේ නැහැ. දෙවියනේ, මම කොහොමද මේ තරම් දුක් ගොඩක් දරාගන්නේ. මම අඩනවා අහිලා උදාරි ඇවිත් මගෙන් විස්තර ඇහුවා. මම හිතේ තිබුන බර නිදහස් කරගන්න එයාට හැමදේම කිව්වා. එයාටත් හිතාගන්න බැරි වුණා මට මේ වෙන දේවල්. චතුනිත් මාව හොයාගෙන හවස එහෙට ආවා. විශ්ව බැන්න හැටි මම එයාට කිව්වා.

''විශ්ව කියන්නෙ ලේසිපාසු කෙනෙක් නෙවෙයි කියලා ඔයා දන්නවනේ. ඌට ඕනේ දේ සිද්ද වුණේ නැත්තම් ඔයාව මරන්න වුණත් ඌට පුලුවන්. පරිස්සම් වෙන්න.''

"මට මේ වෙලවේ එයාගේ ආදරේ ඕනේ චතු. මේ වෙලාවේ මට ඉන්නේ ඔයයි එයායි විතරයි. යාළුවෝ කියලා ඉන්න අනික් අයගේ හටි මම දන්නවනේ."

"මම ඔයාගෙම හොදටයි කියන්නේ. විශ්වට පාඩුවේ ඉන්න අරින්න. කවුරු නැතත් ඔයාට මම ඉන්නවා. ඔයා ඒ කලේ මට කොච්චර උදව් කරාද. මම මේ වෙලාවේ ඔයාව අතාරින්නේ නැහැ."

"ඒත් මම කොහොමද මෙහෙම ජීවත් වෙන්නෙ. ඉංජිනියර් කෙනෙක් වෙන්න තව අවුරුද්දක් කම්පස් යන්න ඕනේ. එතකන් කන්න බොන්නවත් මගේ ළග සල්ලි නැහැ. අනික අනිත් යාළුවොන්ට හමදාම බොරු කිය කිය ඉන්න බෑනේ. එයාලත් කවදා හරි මේක දැනගනියි. මම යාලුවෝ කියලා හිතපු ගොඩාක් අය මගේ එක්ක ඉදලා තියෙන්නෙ මගේ සල්ලි නිසා"

"මම උදව් කරන්නම්. ඔයා කොහොමහරි මේ අවුරුද්ද ඉවසන් හිටියොත් ඔයාව අතැරපු හමෝටම පේන්න හොද ජීවිතයක් ගෙවන්න පුලුවන්." චතුනි කිව්වා. එයා මොනවා කිව්වත් මගේ කඩන් වැටුන හිත හදාගන්න පුලුවන් කමක් තිබුනේ  නැහැ. චතුනි

ගියාට පස්සේ මම ඉදගෙන කල්පනා කරා.තවත් අඩන්න මගේ ඇස්වල කඳුළු තිබුනේ නැහැ.

හිතලා හිතලා හිත්ලා අන්තිමේට මම ටික ටික හිත හදාගන්න පටන් ගත්තා. මගේ ජීවිතේට මීට වඩා නැතිවෙන්න දෙයක් නැහැනේ. මම මෙතන ඉදන් ආයෙත් නගිටින්න පටන් ගන්නවා කියලා මම කල්පනා කරා. ජීවිතේ කවදාවත් දුකක් විදලා නොතිබුන නිසා මට හිත හදාගන්නනම් ලේසි වෙන එකක් නැහැ. ඒත් මම කොහොමහරි නැගිටිනවා. මාව අතැරපු අයට පේන්න මම ජීවිතේ හදාගන්නවා. මම එහෙම හිතලා පහුවදා කැම්පස් ගියා.

ඒත් ඔයා දන්නවද එදා තමයි මගේ ජීවිතේ මට නැතිවෙන්න තිබ්බ අන්තිම දේත් නැතිවුණේ.එදා මගේ ජීවිතේ අපායකටත් අන්ත තත්තවෙකට පත්වුණා.එදා උදේ මම කැම්පස් එකට යනකොට වෙනදට වඩා පරක්කු වුණා.

මම කැම්පස් එක ඇතුළට යනකොට හැමෝම මගේ දිහා අමුතු විදිහට බලන්න පටන් ගත්තා. සමහරු මාව පෙන්න පෙන්න එක එක දේවල් කුටු කුටු ගානවා. ඇයි මේ, මට මොකුත් තේරුණේ නැහැ.

මම ඒ කවුරුත් දිහා නොබලා ලෙක්චර්ස් තිබුන හෝල් එකට ගියා. මම හෝල් එක ඇතුලට යනකොට ඒකේ හිටපු කොල්ලෝ කෙල්ලෝ හැමෝම හයියෙන් හූ කියලා කෑගැහුවා. එයාලා හූ කිව්වේ මටයි.මම අත් දෙකෙන්ම කන් දෙක වහගත්තා. ඒත් එක්කම විශ්වගේ යාලුවෝ ටිකක මාව වටකරගත්තා.

“ඇයි මේ කන් දෙක වහගන .ඔයාට තමයි මේ හැමෝම හූ කියන්නේ සුදූ.” එක කොල්ලෙක් කිව්වා.

“ඇයි ලැජ්ජයිද, අහක බලන් ඉන්නේ. ඔයා ඉතින් එහෙම එකක් නැති කෙල්ලෙක්නේ.”විශ්වගේ යාළුවෝ මගේ වටේට එකතු වෙලා එක එක නැහැදිච්ච කතා කියන්න පටන්ගත්තා. මට තේරුනේ නෑ මේ මොනවා වෙනව්ද කියලා. මම කිසිම දෙයක් හිතාගන්න බැරුව ඔහේ බලන් හිටියා.

“ඒ බං මැඩම් තාම දන්නේ නෑ වගේ වෙලා තියන දේ. එයා දන්නෑ වගේ එයා කරපු බලු වැඩ ද්ඇන් මුළු කැම්පස් එකම දන්නවා කියලා. ඒ ඔය ප්‍රොජෙක්ටරේ ඔන් කරලා ඔක්කොටම පේන්න දාපන් මේ මැඩම්ගේ වැඩ.”මගේ ළග හිටපු එක කොල්ලෙක් කෑගැහුවා.

ඒත් එක්කම කවුරු හරි ප්‍රොජෙක්ටරේ ඔන් කරලා මුළු හෝල් එකටම පේන්න වීඩියෝ එකක් ප්ලේ කරා.ඒකේ තිබුන දේ දැකලා මට අකුණක් වැදුනා වගේ වුණා. ඒක කාටවත් ඇස් ඇරන් බලන් ඉන්න පුලුවන් දෙයක් නෙවෙයි. ඒත් දෙයියනේ ඒකේ හිටියේ මම තවත් කොල්ලෙක් එක්ක. ආදරේ කරපු විශ්වගෙන්වත් අඩුම තරමේ කිස් එකක්වත් අරන් නැති මම. ඒක දැකලා මගේ හුස්ම හිර වුණා. මම අත් දෙකෙන්ම මූණ වහගෙන අනිත් පැත්ත හැරුණා. හෝල් එකේ හිටපු ඔක්කොම ආයෙත් හූ කියන්න පටන් ගත්තා.

"ඔන්න, හැමෝම බලාගන්න මේ මැඩම් මෙහේ විශ්ව එක්ක යාළු වෙලා ඉන්න ගමන් එළියෙදි කරන දෙවල්."

"නැහැ, මේක බොරුවක්. මේක ඇත්තක් නෙවෙයි." මම කෑගහුවා.

"දැන් ඔයා කියන්නෙ මේක අපි හදපු වීඩියෝ එකක් කියලද?ඇයි දැන් හැමදේම එළි වුණාම ලැජ්ජයිද."

මට කතා කරන්න බැරි ටහරමට ෂොක් වෙලයි හිටියේ.විශ්ව,අනිවාශයෙන්ම විශ්ව තමයි මේක

කරන්න ඇත්තේ. එයා ඊයේ මට කිව්වේ මේකයි, ඇයි එයා මට මෙහෙම කළේ. මගේ ගෞරවේ නැති කරන්න එයාට තිබ්බ වුවමනාව මොකද්ද?

හැමෝම වට වෙලා මට එක එක දේවල් කියන්න පටන්ගත්තා. මම එතනම දණ ගහගෙන අත් දෙකෙන් මූණ වහගෙන හිටියා. මේ අය කියන දේවල් මට පිහිවලින් අනිනවා වගේ. විශ්ව අයි මේ වගේ බලු වැඩක් කළේ. එයා මාව අතෑරලා වැරැද්ද මගෙ පත්තට දාන්න මේ තරම් දෙයක් කළාද?චතුනි කිව්වා හරි. විශ්ව එයාට ඕනේ දේ කරගන්න ඕනෙම බලු වැඩක් කරයි.

ඒ වෙලාවේ දෙවියෝ එව්වා වගේ චතුනි එතනට ආවා. එයා අමාරුවෙන් එතනින් මාව බේරගෙන එලියට අරන් ආවා. එයා කැම්පස් එකේ නතර නොවී කෙලින්ම මාව උදාරිගේ ගෙදරට අරගෙන ආවා.

මම කොයොතරම් ෂොක් වෙලාද හිටියේ කියනවනම් මට කතා කරන්නවත් පුලුවන් කමක් තිබුනේ නැහැ. චතුනි හිටියේ කාවහරි මරන්න තරම් කේන්තියෙන්. එදා උදාරිත් හිටියේ ගෙදර. චතුනි තරහෙන් වෙච්ච හැමදේම උදාරිට කිව්වා.

“මට ඒ බල්ලව මරන්න තරම් තරහයි උදාරි. මේ කෙල්ලව අතැරියනම් ඌට ඒ විදිහට ඉන්න තිබ්බා. මේ කෙල්ලගේ ගෞරවේ නැති කරන්න තිබ්බ වුවමනාව මොකද්ද? මම දන්නවා මෙයා කවදාවත් ඒ වගේ දෙයක් කරන්නේ නැහැ කියලා. ඌ කවුරු හරි කෙල්ලෙක් කොල්ලෙක් එක්ක හිටපු වීඩියෝ එකක් අරන් එඩිට් කරලා.”

“චතූ, කාම් ඩවුන් . අපි මේඑ ගැන පොලීසියට කියමු.’උදාරි කිව්වා.

“පොලිසියට කියලා වැඩක් නෑ උදාරී.උගේ තාත්තා පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක්.ඌ මෙයගේ කටවහන්න මෙයාව මරන්න උනත් පුලුවන්.දැන් දැක්කනේ අර තරම් පොඩි දේකින් බේරෙන්න කරපු දේ.”

මම ඔහේ බලාගෙන හිටියා. මහේ කම්මුල් දිගේ කඳුළු ගගක් වගේ ගලාගෙන ගියා. මීට වඩා හොදයි විශ්ව ඔයා මාව මැරුවනම්. ඇයි ඔයා මෙහෙමෙ කරේ.

“කවීශා, ළමයෝ මොනවා හරි කියන්න. ඔයා ඔහොම ඉන්නකොට මට බය හිතෙනවා. “චතුනි ගිහිල්ලත් පැය ගානකට පස්සේත් මම ඒ විදිහටම ඉන්නකොට

උදාරි මගේ ළගට ඇවිත් කිව්වා. එයා මාව කාමරේට එක්කන් ගියා. මමම් රූකඩයක් වගේ එයාට බරවෙලා කාමරේට ගියා. උදාරි අවිත් මගේ ළගින් වාඩි වුණා. "ළමයෝ , අඩුම තරමේ හයියෙන් කෑගහලා අඩන්න. හැමදේම ඔයාගේ හිත අතුලේ හිරකරන් ඉන්න එපා." මම රොබෝ කෙනෙක් වගේ එයා දිහාට හැරුනා. මට එකපාරටම කෑගැස්සිලා ඇඩුනා. මම උදාරිගේ උරහිසේ ඔලුව තියාගෙන ගොඩක් වෙලා අඩුවා.

"කවිශා, දන් ඔයා ඔයාගේ හිතෙ තියන හැම දුකක්ම මට කියන්න. ඔයා පොඩි දෙයක්වත් හිතේ හිරකරන් ඉන්න එපා."

"මට....මට මොනවා කියන්නද කියලා හිතාගන්න බෑ... මට මේ මොනවද වෙන්නේ... හැමෝම ... හැමෝම ඇයි මට මෙහෙම කරන්නේ. මම එයාලට මොනවා කරාටද එයාලා මගෙන් පලි ගන්නේ. විශ්ව.. මම හිතුවේ එයා මේ වෙලාවේ මාව අතාරින එකක් නෑ කියලා.ඒත්....ඒත් එයා මගේ ජීවිතේ විනාශ කළා. මුළු කැම්පස් එකම ඉස්සරහා එයා මගේ ගෞරවේ නැති කරා. එයා බැන්නනම් ගැහුවානම් මම එයාව අතාරිනවනේ. ඒකට අර තරම් දෙයක් කරේ ඇයි එයා."මම අඩ අඩාම කිව්වා.

"ඒක තමයි එයාගේ හැටි. තාත්තාගේ බලේ අතට අරන් එයා වැඩ කරනවා ඇති. ඒක බොරුවක් කියන එක අපි කොහොමහ්‍රි ඔප්පු කරමු."

"එහෙම කරන්න බෑ උදාරි. එයාගේ තාත්තා මාව විතරක් නෙවෙයි ඔයාලවත් ඉවරයක් කරයි. එයගේ පුතාට ඕනේ දේ කරන්න බාධා කරන කාවවත් එයා ඉතුරු කරන්නෑ. මට විශ්වම ඒ වගේ වුණ දේවල් කියලා තියනවා."

"ඔයා බය වෙන්න එපා.අපි මොනවා හරි කරමුකෝ. අහන්න ළමයෝ, මේ වුණ දෙයින් ඔයා වැටෙන්න එපා. ඔයාගේ ජීවිතේ විනාශ වුණා කියලා හිතන්න එපා. මෝඩ තීරණනම් ගන්න එපා. ඔයාට හොද ජීවිතයක් ගෙවන්න පුලුවන්.ඔයා දන්නවනේ විශ්ව පෙන්නපු දේවල් බොරු කියලා.

## 6

“ඒ දේවල් බොරු දේවල් කියලා දන්නේ මම විතරනේ. හැමෝම හිතන්නේ මම ලැජ්ජාවක් නැති ජරා කෙල්ලෙක් කියලා.මගේ ගෞරවේ නැති වෙලා ඉවරයි. මම කොහොමද ආය කැම්පස් එකට යන්නේ. මගේ ජීවිතෙ විනාශ වෙලා ඉවරයි උදාරි. ආය මට නැගිටින්න විශ්ව ඉඩ දෙන එකකුත් නෑ.”

“විශ්වට බෑ එහෙම කරන්න. එයාට මොකද්ද තියන අයිතිය නිකරුණේ ඔයාගේ ජීවිතේ විනාශ කරන්න.”

“එයා එහෙම තමයි. මගේ අයියාත් මට සැලකුවේ බල්ලෙක්ට වගේ, ඉතින් විශ්ව මට එහෙම කරන එක ගැන කතා කරන්න දෙයක් නැහැ. දැන් මගේ ජීවිතේ අපායක් වෙලා ඉවරයි.”

“ඔයා හදන්නේ හැමෝටම ඔයාට ඔහොම අසාධාරණකම් කරන්න දීලා පාඩුවේ ඉන්නද.”

“මම වෙන මොනවා කරන්නද? දන් මගේ ජීවිතේ කිසිම වැඩක් නැහැ. ඉතින් මම ඒ අසාධාරණකම්වලට විරුද්ධ වෙලා මොනවා කියලා කරන්නද? ඊට වඩා හොදයි මැරිලා යන එක.”මම අඩ අඩාම කිව්වා.

“කවීශා, එහෙමයි කියලා ඔයා ජීවිතේ නැතිකරගන්න හදන්න එපා හරිද. දැන් අඩුවා ඇති. ගිහිල්ලා වොෂ් එකක් දාගෙන එන්න. මම කන්න මොනවාහරි අරගෙන එන්නම්.”

මම බාත්රූම් එකට ගියා. ඒත් කණ්ණාඩියෙන් මගේ මූණ දකිනකොට වෙච්ච දේවල් එක දිගට මගේ ඔළුවට එන්න පටන් ගත්තා. කැම්පස් එකේදී කොල්ලෝ කෙල්ලෝ කියපු දේවල් මට එක දිගට ඇහෙනවා වගේ දැනුනා. ඉතින් මම අත මිට මොලවලා කණ්ණාඩියට ගහුවා. මට ආපු ආවේගෙට ගහපු පාර කණ්ණාඩිය කුඩු වෙලා ගියා. මගේ ඔලුව අතුළෙන් මට එක එක දේවල් අහෙද්දී මට තවත් දරාගෙන ඉන්න පුලුවන් කමක් තිබුනේ නැහැ. එතන වටිලා තිබුන වීදුරු කැල්ලක් අරගෙන මම අත කපාගත්තා. එක තැනක් නෙවෙයි. අත දිගට හරහට කපාගෙන කපාගෙන ගියා.

ඒ වෙලාවේ මට කෑමා අරන් ආපු උදාරි මම කරන දේ දැකලා කෑ ගහගෙන ඇවිත් මාව අල්ල ගත්තා. එයා වීදුරු කැල්ල මගේ අතින් උදුරලා විසි කරා.ඒත් එක්කම මට සිහිය නැතිවෙන්න ඇති.මට ආය සිහිය ආවේ හොස්පිට්ල් එකේදියි. චතුනි වගේම උදාරිත්

මගේ ළග හිටියා. මගේ අතේ මණික්කටුව ළග ඉදන වැලමිට ළගට එනකම්ම බැන්ඩේජ් කරලයි තිබුනේ.

සිහිය ආවට පස්සේ වෙච්ච හැමදෙයක්ම එක දිගට ඔලුවට එන්න පටන්ගත්තා.මේ හැමදෙයක්ම අතැරලා මැරෙන්න ඕනේ වුණත් ඒකටත් වාසනාවක් නෑ වගේ. තවදුරටත් අඩන්නවත් මට ශක්තියක් තිබුනේ නැහැ. ඉතින් මම බලාගත්ත අත බලාගෙන හිටියා.

උදාරි වගේම චතුනිත් මගේ හිත හදන්න ගොඩාක් දේවල් කිව්වත් ඒ කිසිම දෙයක් ඔලුවට ගියේ නැහැ. මාව බලන්න ආපු ඩොක්ටර්ස්ලා එක්ක වුණත් මම වැඩිය කතා කළේ නැහැ. දවස් දෙකකට පස්සේ මගේ ටිකට් කැපුවා. උදාරිගේ ගෙදරට ආවට පස්සේ චතුනි මගේ ළගට ආවා.

“මට ඔයාට කියන්න දෙයක් තියනවා.” එයා ඇදේ වාඩි වෙන ගමන් කිව්වා. “අඩුම තරමේ මොකද්ද කියලවත් අහන්න. ඔහොම කතා නොකර ඉන්න එපා. ඔයා හොස්පිට්ල් ඇඩ්මිට් කරාට පස්සේ විශ්වගේ තාත්තා ආවා ඔයාව හොයාගෙන. ඔයා ළගට එන්න අපි ඉඩ දුන්නේ නැහැ. අනික ඒ වෙලාවේ ඔයාට සිහිය තිබුනෙත් නැහැ. “එයා කියන දේවල් අහගෙන මම

ඔහේ බලගෙන හිටියා. ‘‘එයා කිව්වා විශ්වට විරුද්ධව පොඩි හරි දෙයක් කරලා තිබුනොත් ඔයාගේ ජීවිතෙ ඉතුරු වෙන එකක් නැහැ කියලා. ඒ වගේම මටයි උදාරිටයිත් පාඩුවේ ඉන්න කිව්වා.’’එතකොටම වගේ උදාරිත් කාමරේට ආවා.

‘‘මෙයා මොකද කියන්නේ.’’

‘‘එයා මොනවා කියන්නද? තාමත් කතා කරන්නේ නැහැ.’’

‘‘කවීශා දැන්වත් කතා කරන්නකෝ. ඔයාට හිතෙන දනෙන හැමදේම හිතේ හිර කරගෙන ඉදලා හරියනවයෑ.’’උදාරි කිව්වා. මට කාත් එක්කවත් කතා කරන්න වුවමනාවක් තිබුනේ නැහැ. ඉතින් මම ඇදේ අනිත් පැත්ත හැරිලා කොට්ටෙට ඔලුව තියාගත්තා.

දවස් ඔහේ ගෙවිලා ගියා. මම හැමදාමත් කාමරේට වෙලා ඔහේ ඉදගෙන හිටියා. චතුනියි උදාරියි සැරින් සැරේට ඇවිත් එක එක දේවල් කිව්වත් මට එයාලා එක්කවත් කතා කරන්න හිතුනේ නැහැ. තවත් සතියකට විතර පස්සේ මට කැම්පස් එකට එන්න කියලා කැදවීමක් ලැබිලා තිබුණා.

ඉතින් පහුවදා මම ආයෙත් අකමැත්තෙන් වුණත් කැම්පස් එකට ගියා. මාව ඉංජිනේරු පීඨයේ පීඨාදිපතිගේ ඔෆිස් එකට එක්කන් ගියා. එතනට යනකොට හිටියේ මම හීනෙකින්වත් බලාපොරොත්තු වුණ කෙනෙක් නෙවෙයි. විශ්වයි එයාගේ තාත්තායි පීඨාදිපතිගේ ඔෆිස් එකේ හිටියා.

"කවීශා, වැඩිය කතා ඕනේ නැහැ. මම කෙලින්ම කතාවට එන්නම්. ගිය සතියේ කැම්පස් එක පුරාම ඔයාගේ වීඩියෝ එකක් ගිහින් තියනවා. ඔයාගේ චරිතේ ඒ වගේනම් අපිට බැහැ ඔයාට තවත් කැම්පස් එකේ ඉන්න ඉඩ දෙන්න. අපිට සිද්ධ වෙනවා ඔයාගේ ශිෂ්‍යභාවය අහෝසි කරන්න. "පීඨාදිපති කිව්වා.

"ඒත් සර්... ඒක අත්තක් නෙවෙයිනේ....ඒ විඩ්ඩියෝ එක ඇත්තක් නෙවෙයි. ඒක එඩිට් කරපු එකක්. එහෙම කොහොමද ස්ර් කිසිම පරික්ෂණයක් නොකර ශිෂ්‍යභාවය අහෝසි කරන්නේ"මාත් එක්ක හිටපු චතුනි කිව්වා.

"අපි ගිය සති දෙක පුරාවටම හොයලා තමයි මේ තීර්ණේ ගත්තේ."පීඨාදිපති එහෙම කියනකොට මට

තවදුරටත් කතා නොකර ඉන්න බැරි වුණා. හමෝටම මගේ ජීවිතේට අසාධාරණකම් කරන්න දෙන්න බෑ.

"ඔයාලා කොහොමද එහෙම මගේ ශිෂ්‍යභාවය අහෝසි කරන්නේ. මොනවාද ඔයාලා සති දෙකක් හොයලා බැලුවේ. හොයලා දනගත්තේ මෙයායි මෙයාගේ යාළුවොයි කියන බොරුද?"මම විශ්ව පෙන්නලා ඇහුවා. "මගේ චරිතේ ගැන සැකනම් ඔයාලා මෙඩිකල් ටෙස්ට් එකක් කරලා බලන්න....

"කවීශා ඕක නවත්තන්න."චතුනි කිව්වා.

"මාව අතාරින්න චතූ, මට තවත් නැති වෙන්න ගෞරවයක් ඉතුරු කරලා නෑනේ. මට කියන්න දෙන්න. මට දන් හිතාගන්න පුලුවන් මගේ ශිෂ්‍යභාවය අහෝසි වුණේ කොහොමද කියලා.සර්ට කීයක් දුන්නද විශ්වගේ තාත්තා මේකට. සර් මේ විශ්ව කියන බල්ලාට ඕනේ නිසානේ මට මෙහෙම අසාධාර්ණයක් කරන්නේ...."

මට කියන්න හම්බුණේ එච්චරයි. විශ්ව පනපු ගමන් මෙගේ කම්මුලට ගහපු පාරට මම විසිවෙලා ගියා. චතුනි මාව අල්ලගත්තා. විශ්ව මගේ ළගට ඇවිල්ලා මගේ මූණ දෙපැත්තෙන් අල්ල ගත්තා.

“මට බල්ලා කියන්න උඹට මොකක්ද් යකෝ තියෙන හයිය. උඹ දැනගනින් මේ විශ්වට විරුද්ධව කතා කරන කවුරුත් ඉතුරු වෙන්නේ නෑ කියන එක. අර වීඩියෝ එක එඩිට් කරපු එකක් තමයි. එතකොට උඹේ ශිෂ්‍යභාවය අයින් කරෙත් සල්ලි දීලා තමයි. ඇයි උඹ මොනවා කරන්නද? හැමදේම පොලීසියට කියන්නද? මගේ තාත්තා ඉන්නකම් පොලීසියට නෙවෙයි ජනාදිපතිට කිව්වත් තමුසෙට මට විරුද්ධව කිසිම දෙයක් කරන්න බැහැ. මේ දේවල් ගැන එක වචනයක් හරි පිටට ගියොත් උඹ විතරක් උඹ එක්ක ඉන්න හැම එකාම මම ඉවරයක් කරනවා.” විශ්ව කෑගැහුවා. ඊට පස්සේ එයා එතනින් යන්න ගියා.

එයාලා ගියාට පස්සේ චතුනි මාවත් එක්කගෙන එළියට ආවා.ඊට පස්සෙ එයා මාව ආයෙමත් ගෙදර්ට එක්කරගෙන ආවා. මම ගෙදර ආපු ගමන් කාමරේට ඇවිත් දොර වහගත්තා. චතුනි ඇවිල්ලා දොර අරින්න කියලා කතා කරත් මම දොර ඇරියේ නැහැ.

“මම මැරෙන්න හදන්නේ නැහැ. බය වෙන්න එපා. මොකද මට මැරෙන්නවත් වාසනාවක් නැහැ.”මම කිව්වා.

තවත් සතියකට පස්සේ චතුනි ඇවිල්ලා කිව්වා එයාගේ ට්‍රේනින්ග් කාලේ පටන් ගන්නවා කියලා.එයාට ඒකට කොලඹ යන්න වෙනවා කියලත් එයා කිව්වා.

"චතූ, මට ජොබ් එකක් හොයලා දෙන්න පුලුවන්ද? දැන් මට ඉංජිනියර් කෙනෙක් වෙන්න බැනේ. මගේ අතේ සල්ලිත් නෑ."

"එතකොට ඔයා ඒක අතෑරලා දැම්මද? අසාධාරණ විදිහටනේ ඔයාගේ ශිෂ්‍යභාවය අහෝසි කරේ."

"ඒ ගැන කතා කරන්න මම කැමති නෑ චතූ. මම ඒ ගැන ආය කතා කරන්න ගියොත් උන් ඔයාලගේ ජීවිතත් විනාශ කරයි. මම වගේ අවාසනාවන්ත කෙල්ලෙක් හින්දා ඔයාලගේ ජීවිතත් විනාශ වෙන්න දෙන්න බැහැ. ආය ඒ ගැන කතා කරන්න එපා."

"හරි, මම දන්නවා ඔයා ඉන්න තත්ත්වේ. ඒ නිසා මම ආය වදදෙන්නේ නැහැ. මම ජොබ් එකක් හොයලා තියෙන්නේ. මගේ බෝයි ෆ්‍රෙන්ඩ් වැඩ කරන කම්පැණියේ. කිසිම දෙයක් නොබලා එයාලා ඔයාට ජොබ් එක දෙනවා. ඔයාගේ සෙටිෆිකට්ස් නැහැනේ."

“හ්ම්ම්, මෙහේ ජොබ් එකක්ද?මම තවත් මෙහෙනම් ඉන්න කැමති නෑ.”

“නැහැ. කොලඹ. ඔයාටත් මාත් එක්කම අනිද්දට කොලඹ යන්න එන්න වෙනවා,”

“ඒක හොදයි, මගේ විනාශ වෙච්ච ජීවිතේ කොලඹදිවත් හදාගන්න පුලුවන් වෙයිනේ.”

“මටනම් පුදුමයි ඔයා මේ දේවල් ඉවසන විදිහ ගැන.ඒක නෙවෙයි මට ඔයාට තව දෙයක් කියන්න තියනවා.”

“ මොකක්ද?”

“ඔයාට කවදාහරි හිතුනොත් විශ්ව කරපු අසාධාර්ණේ ට විරුද්ධ වෙන්න ඕනේ කියලා ඒකට ඕනේ සාක්ෂි මගේ ළග තියනවා.”

“චතූ......”මම පුදුම වෙලා එයා දිහා බැලුවා. “ඔයා මොනවද මේ කියන්නේ.”

“ඔව්, මගේ ළග සාක්ෂි තියනවා. එදා ඔෆිස් එකේ කතාකරපු දේවල් සේරම මම රෙකෝර්ඩ් කරලා තියෙන්නේ.”

"චතූ, ඔයා මොනවද කියන්නේ. බැරිවෙලා හරි විශ්ව මේක දැනගත්තොත් ඉවරයි."

"බය වෙන්න එපා. ඒ දේවල් මගේ ළග නෑ. තියෙන්නේ උදාරි ළග .විශ්ව උදාරිව දන්නේ නෑනේ."

" අනේ මන්දා ඔයාලා මොනවා කරනවද කියලා. මටනම් දැන් මොනවා වුණත් කමක් නෑ. ඔය දේවල් කරන්න ගිහින් අහු වුණොත් ඔය දෙන්නාම ඉවරනේ. නිකම් ඔය දෙන්නා අමාරුවේ වැටෙන්න එපා."

"එහෙම වෙන්නේ නැහැ. අපි කොළඹ ගිහාම ඔයා ඉන්නේ කොහෙද කියලා විශ්වට හොයාගන්න ඉඩ තියන්නේ නැහැ.ඊට පස්සේ බලමුකෝ.දැන් ඔයා අනිද්දට මාත් එක්ක කොළඹ යන්න ලෑස්ති වෙන්න." එයා එහෙම කියලා ගියා.

ඊට පස්සේ මම චතුනිත් එක්ක කොඹ ආවා. මට ජොබ් එක හම්බුණා. ඉතින් මම හිතුවා මගේ ජීවිතේ වෙච්ච දේවල් අමතක කරලා ආයෙත් නැගිටින්න පුලුවන් වෙයි කියලා. ඒත් මාසයක් යනකොට ආයෙත් හැමදේම කණපිට පෙරලෙන්න පටන්ගත්තා. විශ්ව කොහොමහරි දනගෙන අපේ රෙකෝර්ඩ් එක

ගැන. එයා ඒ ගැන හොයන්න පටන්ගෙන කියලා චතුනි මට කිව්වා.

තවත් දවස් දෙකකට පස්සේ අවාසනාවන්ත ආරංචියක් අපිට හම්බුණා. විශ්ව දැනගෙන ඒ රෙකෝර්ඩ් එක උදාරි ළඟ තියනවා කියලා. එයා උදාරිව මරලා. චතුනි එපා කියද්දිම මම එයත් එක්ක ආපහු නුවරට ගියා. උදාරිගේ මරණේ සම්බන්ධව පොලීසිය කිසිම දෙයක් කරේ නැහැ. විශ්වගේ තාත්තා සල්ලි වියදම් කරලා ඒකත් යටගහන්න ඇති. විශ්ව එයාට විරුද්ධව තිබුන සාක්ෂි අරගෙන ගිහින් තිබුනා.ඒත් විශ්වට විනාශ කරන්න හම්බුනේ එයාට විරුද්ධව තිබුන පොඩි සාක්ෂියක් විතරයි කියලා එයා දන්නේ නැහැ.

මල ගෙදර වැඩ ඉවර වෙලා හත් දවසේ දානේ දෙන්න මමයි චතුනියි ඒ ගෙදරම නතර වුණා. එක දවසක් චතුනි බඩු වගයක් ගේන්න එළියට ගිහින් ඉන්න වෙලාවක මම තනියම ගේ අස් කර කර හිටියා. ඒ වෙලවේ මම දක්කා සිවිලිමේ මොකක් හරි පුංචි කැමරාවක් වගේ දෙයක් තියනවා. මම පුටුවකට නැගලා බැලුවා. ඒක එතන හයි කරලා නෙවෙයි තිබුනේ.ඒක බැට්‍රියෙන් වැඩ කරන වීඩියෝ

කැමරාවක්. මම ඒක අතට ගත්තා. ඒක දූවිලිවලින් වැහිලායි තිබුනේ. ඒකේ තිබුන චිප් එක අරගෙන මම ලැප් එකට දාලා බැලුවා.

දෙවියනේ, විශ්ව එන වෙලාවේ උදාරියි ඒක සිවිලිමේ පුංචි හිඩසක් අතර තියලා තියෙන්නේ. වෙච්ච හැමදේම ඒකේ වීඩියෝ වෙලා තිබුණා. විශ්වයි එයාගේ යලුවෝ ටිකයි උදාරිව මරපු හැටි.

දානෙන් පස්සේ මායි චතුනියි ආයෙත් කොළඹ ආවා. චිප් එක ගැන මම චතුනිටවත් කිව්වේ නැහැ. ඒක මම තැනක හැංගුවා කවුරුත් හිතන්න්නෙවත් නැති තැනක.

අද අලුත් අවුරුද්දේ ජනවාරි පළවෙනිදා. ඔෆිස් එකේ නිව් ඉයර් පාර්ටි එකට යන්න ලැස්ති වෙලායි මම මේ දේවල් ලිව්වේ. මම දන්නෑ ඇයි මට මේ කතාව මෙහෙම ලියලා තියන්න හිතුනේ කියලා. ඒත් මට එකපාරට මොනවා හරි වෙලා මැරුනොත් ඒකට වගකියන්න ඕනේ විශ්ව කියලා මම අද ලියලා තියනවා. සමහරවිට මේක කවදාහරි වැදගත් වේවි. මම ජීවත් වුණොත් විශ්ව නිකරුණේ උදාරිගේ ජීවිතේ නැති කරාට අනිවාර්යෙන්ම දඩුවම් දෙනවා.

*************************************

“දිලීප මටනම් හිතාගන්නවත් බෑ. මේ කෙල්ල කොහොම මේතරම් දේවල් ඉවසුවාද කියලා. එහෙනම් ඒක තමයි එයා හැමවෙලේම බයෙන් වගේ ඉන්නේ.”

“මේ තරම් එයාට අසාධාරණයක් වෙලා තියෙද්දිත් කට වහගෙන  හැමදේම ඉවසගෙන ඉන්නවා කියන එකනම් පුදුමයි තමා.”

“මේ වෙලාවේ එයාට කතා කරන්න විදිහක් නැනේ. මටනම් දැන් බයයිත් එක්ක. මෙච්චර දේවල් වුණාට පස්සෙත් එයා මාව විශ්වාස කරන එකක් නැති වෙයි කියලා.එයා මගේ ආදරේ පිළිගනියිද?”

“එයාට තේරුම් කරලා දුන්නම හරියයි. අනික චතුනි උඹ ගැන හොඳට දන්නවනේ. ඒක නෙවෙයි. දවල් ඔෆිස් එකෙන් ආවේ අමාරුයි කියලා නේද .දැන් කොහොමද?”

“දැන් ටිකක් අඩුයි වගේ. මම මේ කල්පනා කරේ ඒක නෙවෙයි. කවීශා ගැන. ඒ කෙල්ල කොච්චර අසරණද.

ඉංජිනියර් කෙනෙක් වෙන්න ඉගෙනගෙන දැන් අපි ළඟට ඇවිත් පොඩි ජොබ් එකක් කරනවා.''

"ඒක තමයි බන්.පවු නෙද? චතුනි අපිට ඔය කතාව කිව්වනම් ඔයිට වඩා ජොබ් එකක් අපිට දෙන්න තිබුණා.''

"හ්ම්ම්,ඒත් ඉතින් දැන් එයා තියෙන ජොබ් එකටවත් එන්නැනේ. ආයෙත් විශ්වගෙන් මොකක් හරි ප්‍රශ්නයක් වුණාද දන්නෑ.''

"ඒත් එයා දැන් ඉන්න තැන විශ්ව දන්නෑ කියලා නේදා තියෙන්නේ. ඒක නෙවෙයි , තව පොඩ්ඩෙන් මට කියන්න අමතක වෙනවා. උඹ ගියාට පස්සේ ජනිත් කතා කළා. හෙට නුවරඑළියේ යන්න දාගත්ත ට්‍රිප් එකට එනවා නේද කියලා අහන්න.''

"අයියෝ, මට ඒක අමතක වුණානේ. මට නිකමටවත් ඕක මතක තිබ්බෙ නැහැනේ.''

"දැන් ඔය උණත් තියාගෙන හෙට යනවාද?''

"යන්න වෙනවනේ, පරණ යාළුවෝ සෙට් එක අමාරුවෙන් එකතු කරගත්තේ ඔය ට්‍රිප් එක යන්න. ඇයි උඹ යන්නෙ නැද්ද?''

“මම යන්නැතුව ඉන්න බලුවේ. පෙරේදා චතුනිත් එක්ක පොඩි රණ්ඩුවක් වුණානේ. දන් තරහා වෙලා මාත් එක්ක. දන් එයා නතුව මම විතරක් ගියොත් ආය තරහා වෙනවා.”

“ආ… ඒකාද ප්‍රශ්නේ. මම එයාට කතා කරන්නම් එතකොට එයිනේ.”

# 7

මම කතා කරලා චතුනිව ට්‍රිප් එක යන්න කැමති කරවගත්තා. මොකද මට එයාගෙන් කවීශා ගැන දැනගන්න දේවල් තිබුණා. ඉතින් පහුවදා ට්‍රිප් එක යන්න පිටත් වුණ වෙලේ ඉඳන් මමයි දිලීපයි චතුනියි තුන්දෙනාම කවීශා ගැන කතා කරන්න පටන්ගත්තා. තව අපේ යාළුවෝ දහයක් විතර හිටියාට මම පළවෙනි වතාවට කෙල්ලෙක් ගැන හොයනවා කියලා දැනගත්තට පස්සේ කට්ටිය කටවල් වහගෙන හිටියා.

"චතුනි, මම ඔයාත් එක්ක කවීශා ගැන කතා කරන්නමයි හිටියේ. මම එයාගේ ජීවිතේ පහුගිය කාලේ වෙච්ච දේවල් සේරම දන්නවා. ඒ වෙච්ච දේවල්වලින් පස්සේ  එයා ආය කාටවත් ආදරේ කරයිද? මන් එයාට කැමතියි .ඒකයි."

"ඔයා කොහොමද එයා ගැන විස්තර දන්නේ."චතුනි පුදුම වෙලා අහුවා.

"මට ඊයේ එයාගේ ඩයරිය හම්බුනා."

"ඊයේ? ඒ කොහෙන්ද?"

"මෙහෙමයි, ඊයේ එයා මට කතා කරලා ඇහුවා එයා ඉන්න තැනට ඇවිත් හම්බුවෙන්න පුලුවන්ද කියලා. මම එහෙට යනකොට එයා මොකක්දෝ හදිස්සි වැඩකට ගිහින්. එයාගේ ඩයරිය තියලා තිබුනා නෝට් එකකුත් එක්ක මට අරන් යන්න කියලා."

"ඔයා කොහෙටද ගියේ එයාව හම්බුවෙන්න."චතුනි තවත් පුදුමෙන් වගේ ඇහුවා.

"එයා මට එන්න කිව්වේ එයා නැවතිලා ඉන්න යාළුවගේ ගෙදරට . ඇයි එහෙම අහන්නේ?"

"ඔයා කියන්නේ මෙහෙටද?"එයා ෆෝන් එකෙන් ෆොටෝ එකක් පෙන්නලා ඇහුවා.

"ඔව්, මේ එහේ තමයි. ඇයි ඔයා පුදුම වෙලා වගේ අහන්නේ. "මම එහෙම කිව්වම චතුනි පුදුමෙන් වගේ දිලීප දිහා බැලුවා.

"ඇයි චතූ, ඔයා පුදුම වෙලා වගේ."දිලීපත් ඇහුවා.

"ඔයාට හොදටම ෂුවර්ද ඒ කතා කරේළු කවීශාමයි කියලා. මොකක්ද එයා කතා කරපු නම්බර් එක."

“එයා ලැන්ඩ් ලයින් එකෙන් කතා කරේ. එයාගේ ෆෝන් එක මගේ ළඟනේ. එයා ඒක අපේ ගෙදර දාලා ගිහින් තිබුනා.”

“එයා ඔයගේ ගෙදර ආවා. ඒ කවද්ද?”

“දවස් තුනකට කලින්. හැබැයි එදාත් එයාව හම්බුනේ නැහැ. මම ගෙදර යන්න කලින් එයා ගිහින්.”

“මොකද්ද චතූ ප්‍රශ්නේ, ඇයි ඔයා අමුතුවෙන් වගේ මේ දේවල් අහන්නෙ. “දිලීප ආයෙත් ඇහුවා.

“දිලීප දවස් අටක් තිස්සේ කවීශා ගැන කිසිම ආරංචියක් නැහැ. එයා අතුරුදහන්. එහෙම තියෙද්දී එයා කොහොමද ලැන්ඩ් ලයින් එකෙන් කතා කරලා කිව්වේ ගයාන්ට එහේ එන්න කියලා. ඒ මමයි කවීශායි හිටපු තැන. ඔයාලගේ ඔෆිස් එකේ පාර්ටිය තිබ්බ දවසේ ඉදන් එයා එහේ ආවේ නැහැ. එදා ඉද්න් තමා එයා නැත්තේ.”ඒ කතාව අහලා මටයි දිලීපටයි මූණෙන් මූණ බැලුනේ ඉබේටම.

“ඔයා ඔය ඇත්තටමද කියන්නේ. ඒත් එයා දවස් තුනක්ම මට කතා කළානේ. එතකොට එයා කොහෙද ඉන්නේ.”

“එයා කොහේ හිටියත් කොළඹනම් නැහැ.”

“එතකොට එයා මට ඊයේ කතා කරේ කොහේ ඉඳන්ද. එයා කොළඹ නැත්තම් කොහොමද් මට ඩයරිය ගන්න කියලා නෝට් එකක් තිබ්බෙ.”

“ඔයා ඔය ඇත්තටමද කියන්නේ ඩයරිය ඔයා ළඟ කියලා”

“මේ තියෙන්නෙ, මම ඒකත් අරගෙනමයි ආවේ.” මම බෑග් එකෙන් ඩයරිය අරන් චතුනිගේ අතට දුන්නා. “ඕකේ තියෙන දේවල්වල හැටියට ගෙදර දාලා එන්න පුලුවන්කමක් තිබුනේ නැහැ.”

“ඇයි ? මොනවද ඕකේ තියෙන්නේ.”

“ඔයාම කියවලා බලන්න අන්තිම හරියේ ටික.”මම එහෙම කිව්වාම එයා ඒ ටික කියෙව්වා.

“දෙයියනේ, මේ කෙල්ල එක වචනයක්වත් කිව්වෙ නෑනේ. එයා මේවා ලිඅයලා තියෙන්නේ එයා අතුරුදහන් වුණ දවසේ. මටනම් දැන් බයයි විශ්ව ආයෙත් මොනවා හරි කරලද කියලා.”

“ඒක තමා මාත් කලපනා කරේ. කවුද ඔය විශ්ව. එයාගේ ෆොටෝ එකක් තියනවද?”

“ඔයා ළග කවීශාගේ ෆෝන් එක තියනවා කිව්වා නේද? එකේ තිබුනා ෆොටෝස්.”

“නෑ, ඒකේ තියෙන්නේ එයා තනියම ඉන්න ෆොටෝස් විතරයි.”

“දැන් ඔයා ළග තියෙනවද ෆෝන් එක. ඒකේ නැතිවෙන්න විදිහක් නෑ. එකේ විශ්වගේ විතරක් නෙවෙයි ඔයගේ ෆොටෝසුත් තිබුනා.”

“මගේ ෆොටෝ?ඒකේ තියෙන්නේ එයාගේ ඒවා විතරයි. එයා මොකද මගේ ෆොටෝ තියාගෙන හිටියේ.”මම කවීශාගේ ෆෝන් එක චතුනිට දෙනගමන් ඇහුවා.

“ඒකද? ඔයා ඉස්සර වෙලා ඇහුවා නේද වෙච්ච දේවල්වලින් පස්සෙත් එයා කාව හරි විශ්වාස කරලා ආදරේ කරයිද කියලා.එයා ඔයාට ආදරේ කරනවා.”

“ඔයා ඔය ඇත්තටමද කියන්නේ.විහිළුවට නෙවෙයිනේ. “මම ඇහුවේ සතුටින් වගේම පුදුමෙන්.

"විහිළු නෙවෙයි. ඇත්තටම කිව්වේ.ඔයා කිව්වා හරිනේ. මේකේ තියෙන්නේ එයා ඉන්න ෆොටෝ විතරනේ . එහෙම වෙන්නේ කොහොමද්? මට හොදට මතකයි මේකේ විශ්වගේ ෆොටෝ තිබුනා."

"ඒකනේ මම කිව්වෙ නෑ කියලා. ඕකේ තිබුනා ලොක් එකක් දාපු ෆෝල්ඩර් එකක්. මට ඒක ඇරගන්න බැරි වුණා."

"මේකේ තිබ්බ ෆොටෝ එයා මැකුවා වෙන්නනම් බෑ. සමහරවිට ලොක් කරලා තියන එකේ ඇති. ඔයාලට අවුලක් නැත්තම් මම දෙයක් කියන්නද? අපි මේ ට්‍රිප් එක පැත්තක තියලා කවීශාව හෙව්වනම් හොදයි කියලා මට හිතෙනවා."

"ඔයා කියන්නේ අපි මේ මගින් බැහැලා ආපහු කොළඹ යමු කියලාද?"

"නෑ, නුවර එළියේ තැනක් තියනවා. එතනට ගිහින් බලමු එයා ආවාද කියලා."

"ඒ කොහෙද?" දිලීප ඇහුවා.

" උදාරිගේ නංගි ඉන්න තැන."

"එයා තාම ඉන්නවද, විශ්ව එයා ගැන දන්නේ නැද්ද?"

"නෑ, එයා ඒ කාලේ ඉදන්ම හිටියේ නුවර එළියේ."

ඊට පස්සේ අපි නුවර එළියේ ටවුන් එකට එනකම්ම යාළුවෝ ටිකත් එක්ක ආවා. නුවර එළියේ ටවුන් එකෙන් බැහැපු අපි කාර් එකක් කුළියට අරගෙන චතුනි කිව්ව විදිහට උදාරිගේ නංගි නතර වෙලා හිටපු ගෙදරට ගියා. එයා එහේ නතර වෙලා හිටියේ එයාගේ නැනදා කෙනෙක් එක්ක."

"චතුනි අක්කා, ඔයා මෙහේ. කියන්නෙත් නැතුව ඇවිල්ලා."

ඔව් නංගා, අපි මේ හදිස්සී වැඩකට මෙහෙ ආවේ. මේ මගේ යාලුවෝ දෙන්නෙක් දිලීපයි, ගයානුයි."

"ඇයි අක්කේ, මොකද්ද හදිස්සිය."

"මේකයි නංගි, අපිට දැනගන්න ඕනේ ගිය සතිය ඇතුළත කවීශා මෙහේ ආවද කියලා."මම කිව්වා.

"කවී අක්කා මෙහේ ආවේ නැහැ. ඇයි මොකක් හරි ප්‍රශ්නයක්ද?"

"ඔව්, එයා අතුරුදහන්." චතුනි කිව්වා.

“ඉතින් ඔයාලා පොලීසියට කිව්වේ නද්ද?”

“ඔයා දන්නවනේ නංගි, පොලීසියට කිව්ව ගමන් විශ්ව ඕක දැනගන්නවනේ,”

“මේකත් එයාගෙම වැඩක්ද දන්නෑ. කවී අක්කාව ඌ අල්ලාගත්තාද දන්නෑ.”

“අනේ මන්දා නංගී, මොනවා කරන්නද කියලා තේරෙන්නෑ.” චතුනි කිව්වා.

ඔය අතරේ මට ආයෙත් කැරකිල්ලක් හැදුනා.මෙහේ සීතලයි මගේ උණයි නිසාද කොහෙදෝ. මම පුටුවෙන් නැගිටින්න ගිහින් එහෙම්මම ආයෙත් ඉන්ද වුණා.

“ගයාන් මොකද, උඹේ මූණත් වෙනස් වෙලා. “දිලීප මගේ ළගට එන ගමන් ඇහුවා.

“මෙහේ සීතල නිසා උණ වැඩිවෙලා වගේ බං. ඔලුව කැරකෙනවා.”මම කිව්වා.

“ටිකක් රෙස්ට් කරානම් හරියයි. මම කිව්වා උණත් තියාගෙන නුවර එළියේ එන්න එපා කියලා.”

"අපි මෙහෙම කරමු. මම නංගිට කියලා රූම් එකක් ලාස්ති කරලා දේන්නම්. ඔයා ටිකක් නදාගන්න. අපි හවස් වෙලා යමු."චතුනි කිව්වා.

මම බෑ කියද්දීම චතුනි ගිහින් නංගිත් එක්ක රූම් එකක් ලෑස්ති කරලා දුන්නා. මම තිබ්බ බෙහෙත් ටිකත් බීලා ඇදෙන් හාන්සි වුණා. ටිකක් වෙලා යද්දී නොදැනීම නින්ද ගිහින්.ආයෙත් මට ඇහැරෙනකොට හවස හතහාමාරට විතර ඇති.

"දැන් ඔයාලා ඔය යන්නද හදන්නේ? මේ වෙලවේ?"

"ඔව් නංගි, අපි යන්නම් ඕනේ. කවීශා කොහේ ඉන්නවිද ද්න්නෑ. ඔයා දන්නවනේ විශ්වගේ හැටි. අපිර නිකම් බලන් ඉන්න බෑ."චතුනි කිව්වා.

" ඒත් අක්කේ, මේ වෙලාවේ යන එක අනතුරුදායකයි. මූදුම නිසා පාර පේන්නෙත් නෑ හරියට. අනික මෙහේ පල්ලම් වල ඩ්‍රයිව් කරලා පුරුද්දකුත් නෑනේ ඔයාලට."

"ඒ වුණාට මේ වෙලාවේ කවීශා ඉන්නේ ඊටත් වඩා අනතුරුදායක තත්ත්වෙකද කියලා කවුද දන්නේ." "

"ඔව්, ඒ හින්දා අපි යන්න ඕනේ. අපි ගිහින් ඔයාට කෝල් එකක් දෙන්නම්කෝ."චතුනි කිව්වා.

උදාරිගේ නැන්දත් අපිට නැවතිලා පහුවදා යන්න කිව්වත් අපි රෑම පිටත් වුණා. එහෙන් අපි පිටත් වෙනකොට අටත් පහු වෙලා. මටත් අමාරු නිසා දිගටම ඩ්‍රයිව් කරන්න වුණේ දිලීපට.

"නංගි කිව්වා හරි,දැන් පාරවල් ගොඩාක් මීදුමට වැහිලා. අපිට හිමීට තමා යන්න වෙන්නේ. මේ මීදුමේ පාර හොයාගන්න පුලුවන්ද දිලීප" චතුනි ඇහුවා.

" පුලුවන් වෙයි කියලා හිතනවා. හැබැයි අපිට නුවර එළියේ ටවුන් එකට යන්න නම් ගොඩාක් වෙලා යයි."

"ඒකට කමක් නෑ, ඔයාහිමීට ඩ්‍රයිව් කරන්න. ඒක නෙවෙයි ගයාන්. කවීශා ඔයාට ගිය දවස් ටිකේ කෝල් කරා කිව්වා නේද? ඔයා ළඟ ඒ නම්බර්ස් තියෙනවාද?"

"ඒ ඔක්කොම ලැන්ඩ් ෆෝන් නම්බර්ස්නේ. අනික එකක් අපේ ගෙදර එක.එකක් ඔෆිස් එකේ එක."

" එහෙමද, එයා ඔයාගේ ගෙදරටත් ඇවිත්, දවස් දෙකකට කලින් ඔෆිස් එකටත් ගිහින්. කොහෙද

මෙයා දැන් ඉන්නවා ඇත්තේ. කෝල් කරන්නවත් විදිහක් නෑනේ.''

''එයා ඔෆිස් එකට ආවේ නැහැ කියලා මම කිව්වනේද, එදා එයා ආවේ නැහැ.''දිලීප කිව්වා.

''එහෙනම් එයා කොහොමද ඒ නම්බර් එකෙන් කෝල් කරේ.උඹ කන්න ගිය වෙලාවෙවත් වෙන්න ඇති එයා ආවේ.''

''උඹට මම කියන දේ විශ්වාස නෑ නේද? කොළඹ ගිහාම උඹම සීසීටීවී චෙක් කරලා බලනවකෝ.''

''ඒත් දිලීප ගයාන්ගේ ෆෝන් එකට කෝල් එක ඇවිත් තියනවනේ. එයා ආවේ නැත්තම් එයාගේ හොල්මනද ජේන්නේ නැතුව ඇවිත් කෝල් කරේ.''

''ඒවා වැඩක් නෑ, චතුනි ඔයා අර ලොක් කරලා තිබ්බ ෆෝල්ඩර් එක අරින්න බැලුවාද''

''අමතක වුනානේ. ඉන්න දැන් මම බලන්නම්.'' එහෙම කියලා එයා කවීශාගේ ෆෝන් එක අතට ගත්තා. මටනම් දැන් කවීශා ගැන බයයි. මේ කෙල්ලෙට මොනවා හරි වෙලාවත්ද.''

මගේ ඔලුව රිදෙන නිසා මම ටිකකට ඇස් දෙක වහගත්තා. ඊට පස්සේ මම දන්නෙම නැතුව නින්ද ගිහිල්ල. ආයෙත් මට ඇහැරුනේ චතුනි මාව ඇහැරවනකොට. අපි නුවර එලියට ඇවිත් අති කියලා හිතලා මම නැගිට්ටා.

“අපිට පාර වැරදිලා. කොහෙද ඉන්නෙ කියලා හොයාගන්නත් බැහැ. මේක මහා පාළු පැත්තක්. ඒ මදිවාට කාර් එක ස්ටාර්ට් වෙන්නෙත් නැහැ.”

“අයියෝ, එතකොට දැන් මොකද කරන්නේ. ළඟ පාත තැනක් තිබුනේ නද්ද උදව්වක් ගන්න පුලුවන්.”

“නැහැ,කිලෝමීටර් දෙක තුනකට මෙහා ගෙයක්වත් තිබුනේ නැහැ. ෆෝන් වලට සිග්නලුත් නැහැ.”දිලීප කිව්වා.

“ඔයා ඔහොම ඉන්න අපි දෙන්නා බැහැලා බලන්නම්. මේ සීතලේ ඔයා එලියට එන්න එපා”එහෙම කියලා ඒ දෙන්නා කාර් එකෙන් බැස්සා. මම කාර් එකට වෙලා ඉදගෙන හිටියා.

# 8

පැය භාගෙකට විතර පස්සේ දෙන්නා ආයෙත් කාර් එකට ආවා.'' අපි දෙන්නා ටිකක් ඉස්සරහාට ගිහින් බැලුවා.ඉස්සරහින් පාර ඉවර වෙනවා. ප්‍රපාතයක් තියෙන්නේ. වටේටම කැලෑව.''දිලීප කිව්වා.

''ආ, මෙන්න මම ෆෝල්ඩර් එක ඇරියා. එයා දාලා තිබුනේ ලේසි ලොක් එකක්නේ.''එහෙම කියන ගමන් චතුනි මට ෆෝන් එක දික් කලා.

''මොකක්ද දාලා තිබුන ලොක් එක.''

''මායා කියලා.''චතුනි කිව්වා.

''මායා?'' දිලීපටයි මටයි එකපාරටම කියවුණා.

''ඔව්. ඇයි ඔය දෙන්නා එකපාරටම එහෙම ඇහුවෙ.'' ඊට පස්සෙ මම එයාට මගේ හීනේ ගැනයි ඔෆිස් පාර්ටි එකේ හිටපු මායා ගැනයි කිව්වා. ඒ කතාව ඇහුවාම චතුනිගේ මූණ අඳුරු වුණා.

''ඔයා කියන්නේ ඔඅය හීනේ ඔයාට හැමදාම පේනවා කියලාද? ඒ කොල්ලොන්ව ඔයා දන්නවාද්?''

"ඔව් හමදාම පේන්වා.හරියටම පාන්දර එකට . මම ඒ කොල්ලොන්වනම් දන්නේ නැහැ."

"ඔයාට හමදාම පේනවානම් ඒකනම් එච්චර හොද දෙයක්නම් වෙන්න බෑ."

"ඇයි ඔයා එහෙම කියන්නෙ."දිලීප ඇහුවා.

"ඔයා දන්නවාද් මායා කියන්නේ කාටද කියලා. ඒ කලේ අපි මායා කිව්වේ කවීශාට. කම්පස් එකේ, ඉස්කෝලේ, ගෙදර හමෝම එයාට කතා කරේ මයා කියලා.

චතුනි එහෙම කිව්වාම මම එකපාරටම එයාගේ මූණ් දිහා බැලුවා. දිලීපත් එහෙමයි.

"ඔයා ඔය කියන විදිහට තමයි ඔයාලගේ ඔෆිස් පාර්ටි එකට එයා ආවේ." එයා එහෙම කිව්වාම මගේ හදවත නිකන් නතර වුණා වගේ. අනේ මට පේන හීනේ ඇත්තක්නම් වෙන්න එපා.මම ප්‍රාර්ථනා කරා. ඊට පස්සේ චතුනි මගේ අතේ තිබුන කවීශාගේ ෆෝන් එක ගත්තා.

"ඔයාට හීනෙන් පේන කොල්ලොන්ගේ මූණු මතකයි කිව්වානේද? ඒ මෙයාලද? එහෙම කියලා චතුනි මට

ෆොටෝ එකක් පෙන්නුවා. දෙවියනේ ඒ ෆොටෝ එකේ හිටියේ ඒ කොල්ලෝ ටිකම තමයි. මට පේන හීනේ ඉන්න කොල්ලෝ ටික.

"මේ එයාලා තමයි." මම බොහොම අමාරුවෙන් කිව්වා. එහෙම කියලා මම කාර් එකෙන් එළියට බස්සේ මට ඇඩුන නිසායි. කොල්ලෙක් විදිහට මම මීට වඩා ශක්තිමත් වෙන්න ඕනේ තමයි. ඒත් කවීශාට මොනවා හරි වෙලා ඇති කියලා හිතෙනකොට මට ඉවසන්න බරි වුණා.කාර් එකෙන් බැස්ස මම ෂොක් එකට එතනම නතර වුණේ ඒ තැන දැකලා. මම කාර් එකෙන් බැස්සාටත් වඩා වේගේන් ආපහු කාර් එකේ දොර ඇරියා.

"දිලීප මේ ඒ තැන"මම කෑගැහුවා.දිලීපට එකපාරට ඒක තේරුනේ නැහැ. "මේ මට හීනෙන් පේන තැන.මායා ව පේන තැන."මම එහෙම කිව්වාම දිලීපයි චතුනියිත් එකපාරටම කාර් එකෙන් බැහැලා ආවා.

"එතකොට අර ඉස්සරහා තියන ප්‍රපාතේ, ඒක වෙන්න ඇති උඹ හීනෙන් දකින ප්‍රපාතේ."දිලීප කිව්වා.

දිලීප එහෙම කිව්වාම මම ඉස්සරහාට දුවගෙන ගියේ ඒ ප්‍රපාතේ මට පේන තැනමද කියලා දැනගන්නයි.

ප්‍රපාතේ ළඟටම ගිය මම නතර වුණා. මට පහළැ බලන්න තරම් ශක්තියක් තිබුනේ නැහැ. දිලීපයි චතුනියිත් එතනට ආවා.

“මට පහළ බලන්න බැහැ දිලීප, බැරිවෙලා හරි මම දකින හීනේ ඇත්ත දෙයක්නම්.”මම කිව්වා.

“උඹට විතරක් නෙවෙයි මටත් බයයි පහළ බලන්න. කමක් නැහැ මම බලන්නම්කෝ.ඒත් මේ කරුවලේ කිසිම දෙයක් පේන එකක් නැහැනේ.”

“ෆෝන් එකේ ටෝච් එක අල්ලලා බලමු. ෆෝන් ටික ඔක්කොම අල්ලලා බැලුවාම පොඩ්ඩක් හරි පේයි. හඳ එළියත් තියෙනවනේ.” චතුනි කිව්වා.

ඊටා පස්සේ චතුනියී දිලීඉපයි මගේ ෆෝන් එකත් ඉල්ලගෙන අයිනට ගියා. මම ටිකක් පස්සට ගියේ බයටමයි. මාව වෙව්ලනවා වගේ. ඒ සීතලෙත් මට දාඩිය දාලා හිටියේ.ටිකකින් චතුනියි, දිලීපයි මගේ ළඟට ආවා. ඒ දෙන්නගේ මූණුවලනම් ඒ තරම් හොඳ පාටක් තිබුනේ නැහැ.

“ඇයි? මොකද” මම ඒ වචන ටික පිට කරෙත් බොහොම අමාරුවෙන්.

“පහළට ලොකු ප්‍රපාතයක් තියෙන්නේ. ඒත් මෙතන ඉදන් ටිකක් පහළින් පොඩි ගහක් තියනවා.....”චතුනි එහෙම කියලා නතර වුණා. මම ඒ දෙන්නගේ දිහා බලන් හිටියේ ඉතුරු ටිකත් කියනකම්.”

“ඒ ගහේ ඉරිච්ච සුදු පාට ෂෝල් එකක් පැටලිලා තියෙනවා.” දිලීප ඉදලා ඉදලා කිව්වා. එකපාරටම මගේ කකුල් දෙක පණ නැතිවෙලා වගේ වුණා. මම ආපස්සට වැටෙන්න යනකොට දිලීප මාව අල්ලගත්තා. මට කතා කරගන්නවත් බැරි වුණා. මම බැලුවේ පාළු පළාත මැදින් එන පාර දිහා. මායා ඒ කියන්නේ කවීශා දුවගෙන එන හැටි මට මැවිලා පෙනුනා. මගේ හීනේ විදිහට කොල්ලෝ ටික පන්නගෙන ආපු හැටි, එයා වැටෙන හැටි හැමදේම මැවිලා පෙනුනා. ඒ දේවල් පෙනිලා ඉවර වෙනකොට මගේ ඇස් දෙක කඳුළුවලින් බොඳ වුණා. “නැහැ, ඒක වෙන්න බැහැ. ඒ එයා නෙවෙයි. ඒ මගේ කවීශා නෙවෙයි,” මම හීනෙන් වගේ කියෙව්වා.

චතුනියි දිලීපයි මාව කාර් එකට අරගෙන ආවා. මම කාර් එකේ පිටිපස්සේ සීට් එකෙන් ඉදගෙන ඔළුව සීට් එකේ පිටිපස්සට තියා ගත්තා. ‘එතනින් වැටුනේ කවීශා වෙන්න බැහැ. එයා දවස් තුනක්ම මට කතා

කලානේ.'මම හිතුවා.ඒ වෙලවේ පුදුමෙකට වගේ මෙච්චර වෙලා ස්ටාර්ට් වෙන්නැතුව තිබ්බ කාර් එක ස්ටාර්ට් වුණා.

වෙලාව ගැනවත් බලන්නැතුව දිලීප කොහොමහරි මීදුමේම පාර හොයාගෙන අපි නවතින්න බුක් කරලා තිබුන හොටෙල් එකට ආවා. අපි හොටෙල් එකට එනකොට පාන්දර දෙකත් පහුවෙලා. අනිත් යාලුවෝ ඔක්කොම ටික නිදි. දිලීපයි චතුනියිත් මාත් එක්කම ඒ රූම් එකේම ඉන්නවා කිව්වා.අපි තුන්දෙනාගෙන් කාටවත් නින්ද ගියේ නැහැ.

"ගයාන්, ඔලුව අවුල් කරගන්න එපා බං. සමහරවිට ඒක වෙන කාගේහරි වෙන්නත් පුලුවන්. අපි හෙට ගිහාම ඔෆිස් එකේ සීසීටීවී චෙක් කරලා බලමු. උඹලාගේ ගෙදර සර්වන්ට්ස්ලගෙනුත් අහලා බලමු එදා එයා ආවද කියලා."

" ඒත් හම්බුවෙන්නේ මම බලාපොරොට්තු වෙන උත්තරේ නෙවෙයිනම්. එයා ඇත්තටම එතනින පහළට වැටිලනම්."

"එහෙම වෙලා නැතුව ඇති කියලා අපි හිතමු."

ටිකෙන් ටික මගේ ඇස් දෙක පියවුණා.නින්ද ගියාට පස්සේ හීනෙන් එයා මට කතා කළා. එයා ගොඩාක් දේවල් කිව්වා. ඒ හීනේ ඉවර වෙනකොට මට දාඩිය දාගෙන ඇහැරුණා. මගේ කටත් වේලිලායි තිබුණේ. දිලීපයි චතුනියි මගේ ළඟට වෙලා බලන් හිටියා. චතුනි ඉක්මනට මට වතුර වීදුරුවක් දුන්නා.

"ඔයා හීනෙන් කෑගැහුවා.කවීශා යන්න එපා කියලා." චතුනි කිව්වා. මම වතුර වීදුරුව චතුනි අතට දුන්නා. ' 'අනේ දෙවියනේ, හීනෙන් මට එයා කිව්වේ එයා දැන් මැරිලා කියලාද?' මම ඇඳේ පස්සට වෙලා බිත්තියට ඔලුව තියාගත්තා.

"මොනවාද හීනෙන් දැක්කේ." දිලීප ඇහුවා.

"මම .... මම හීනෙන් දැක්කේ කවීශාව. එයා දිහා.... එයා දිහා බලන්න බැරි තරමට තුවාල වෙල හිටියේ. මුළු මූණම හීරිලා. ඇඳුම පුරාම ලේ. එයාගේ බඩේ මොකක් හරි ඇනිලා තිබුනා. එයා...එයා කිව්වා... එයාගේ අවසන් කැමැත්ත ඉෂ්ඨ කරන්න කියලා. එයා මට කිව්වා විශ්වට විරුද්ධව සාක්ෂි තියෙන තැන. විශ්වටයි එයාගේ යාලුවොන්ටයි නීතියෙන් ලැබෙන්න ඕනේ දඬුවම ලබා දෙන්න කියලා එයා ඉල්ලුවා."

“එයා තව මොනවාද කිව්වේ.”චතුනි අස් දෙකේ කඳුළු පුරවගෙන ඇහුවා.

“එයා මට ආදරෙයි කියලා කිව්වා. ඊට පස්සේ එයාව බොද වෙන්න පටන්ගත්තා. අන්තිමේට එයා අතුරුදහන් වුනා.”

“එයා ඇත්තටම මැරිලාද?” චතුනි අඩන්නැතුව ඉන්න හදන ගමන් කිව්වා.

ඊට පස්සේ අපි කාටවත් නින්ද ගියේ නැහැ. කවුරුත්ම කතා කරෙත් නැහැ. ඔහේ බලාගෙන හිටියා. ටික ටික එළිය වැටෙන්න පටන් ගන්නකොට මම ඇදෙන් නැගිට්ටා.” අපි කොළඹ යමු. විශ්වට මම පාඩුවේ ඉන්නනම් දෙන්නේ නැහැ එයා පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක්ගේ නෙවෙයි ජනාධිපතිගේ පුතා වුණත් මම එයාව අතාරින්නෑ.”ඊට පස්සේ අපි නුවර එළියෙන් එන පළවෙනි බස් එකෙන්ම කොළඹ එන්න පිටත් වුණා. හවස් වෙනකොට අපි කොළඹට ආවා.

ගමන් මහන්සියවත් නොබලා ගෙදර ගිහින් කාර් එක අරන් අපි ආපහු ඔෆිස් එකට ආවා. අපි තුන්දෙනාටම හදිස්සිය තිබුනේ කවීශා එදා ඔෆිස් එකට ආවාද් කියලා දැනගන්න. අපි තුන් දෙනා ඔෆිස් එකට ගියා

නෙවෙයි දිව්වා. "ෆෝන් එකේ කෝල් එක ආපු වෙලාව  තියනවා නේද? කීයටද එයා කතා කරලා තියෙන්නේ."දිලීප ඇහුවා.

"දොළහයි හතලිස් හතට "මම කිව්වා.

ඊට පස්සේ දිලීප ඒ වෙලාවේ සීසීටීවී රෙකෝර්ඩ් ප්ලේ කරා. ඒත් එයා ඒකේ හිටියේ නැහැ. එදා දවසේ කිසිම වෙලාවක එයා ඔෆිස් එකට ඇවිත් නැහැ. මම ඔලුවට අත තියාගෙනම පුටුවෙන් ඉදගත්තා." එදා එයා අවේ නැත්තම් කොහොමද එයා මට කෝල් කරේ. මම කල්පනා කරා.මම එකපාරටම නැගිටලා ආවා. මම කෙලින්ම ආවේ ගෙදරට.

ඇවිල්ලා ගෙදර හිටපු  සර්වන්ට්ලා හය දෙනාටම කතා කරා. මම එයාලට කවීශාගේ ෆොටෝ එක පෙන්නලා අහුවා මේ සතිය ඇතූළත  එයා මෙහේ ආවද කියලා. හැමෝම කිව්වෙ එයා අවේ නැහැ කියලා. දැන්නම් මගේ ඔළුව හොදටම අවුල් වෙලා. මම කාමරේට ගිහින් දොර වහගත්තා.

"මේ හැමෝම කියන්නෙ බොරු කවීශා මෙහේ අවේ නැත්තන්කොහොමද එයාගේ ෆෝන් එක මෙහෙට ආවේ එයා මැරිලා නැහැ. හැමෝම කියන්නෙ

බොරු.''මම මටම කෑගැහුවා. ටිකකින් චතුනියි දිලීපයි ආවා. මම කාමරේ ඇතුලේ ඉඳන් කෑගහපුවා ඒ දෙන්නාට සර්වන්ට්ලා කියන්න ඇති. මම බිම ඉඳගෙන කවීශාගේ ෆොටෝ එකක් දිහා ඔහේ බලාගෙන හිටියා. දිලීපයි චතුනියි දොර අරින්න කියලා කෑගහනවා මට ඇහුණත් මම ඇහෙන්නෑ වගේ හිටියා.පැය කීයක් මම එහෙම හිටියාද දන්නෑ. කොහොමහරි මට නින්ද ගිහිල්ලා.

# 9

මගේ ලොකු තාත්තා කෙනෙක් පොලීසියේ හිටියා. අපි පහුවදාම ගිහින් එයාව හම්බුණා. විශ්වගේ තාත්තාගෙ පගාවට යටවෙන්නැතුව අපිට මේ වැඩේ කරගන්න පුළුවන් එයා ඉන්න නිසා. එයාට අපි හැම විස්තරයක්ම කිව්වා. එයා අපේ පමිණිල්ල භාර අරගත්තා. එයා ඒකට නඩුවක් දාන්න ලෝයර් කෙනෙකුත් හොයලා දුන්නා.

ලෝයර්ට අපි තත්ත්වේ පැහැදිලි කරාම එයා අපිට වැඩ කරන්න ඕනේ විදිහ පැහැදිලිව කියලා දුන්නා. තවත් සතියකට පස්සේ උදාරිගේ මරණයට වගේම, කවීශාගේ අතුරුදහන් වීමට සැක පිට විශ්වව වගේම එයාට උදව් කරපු කොල්ලෝ ටිකත් අත්අඩංගුවට ගත්තා.

ඊටත් සතියකට පස්සේ නඩුව කැදෙව්වා. විශ්වගේ ලෝයර් පුළුවන් තරම් බොරු කියලා එයාලව බේරගන්න හැදුවා. ඒත් අන්තිමේට විශ්වගේ එක යාලුවෙක්ම හැමදේම පාපොච්චාරණය කරා. ඒකෙන් අපේ වැඩේ තවත් ලේසි වුණා.

එයාලට විරුද්ධව අපි ළග තිබ්බ සාක්ෂි ගොඩක් ප්‍රබලයි කියලා දනගත්තාට පස්සේ විශ්වගේ තාත්තා එයාගේ දේශපාලන අනාගතේ ගැන හිතලා විශ්වව අතෑරලා දැම්මා. විශ්ව ඒකෙන් ගොඩාක් පහතට වැටුණා. එයා මොන දේ කරෙත් තාත්තාගේ බලය පවිච්චි කරලනේ මේ වතාවේ එයාට ඒ අවස්ථාව නැති වුණා අන්තිමට එයත් හැමදේම පාපොච්චාරණය කරා.මටනම් විශ්වාස කරන්නත් බැරි වුණා යක්ෂයෙක් වගේ හිටපු විශ්ව එහෙම කරා කියලා.

විශ්වලගේ චෝදනා ඇත්ත කියලා නිකන්ම ඔප්පු වුණ නිසා නඩුව දික්ගැස්සුණේ නැහැ. විශ්වට මිනීමැරුම් දෙකකට දඩුවම විදිහට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් හිමිවුණා.එයාගේ යාළුවන්ටත් ලැබෙන්න ඔනේ දඬුවමම ලැබුණා. බන්ධනාගාරෙට අරන් යන්න කලින් විශ්වට මාව හම්බුවෙන්න ඕනේ කියලා ඉල්ලීමක් කරලා තිබුනා. මටනම් විශ්ව එක්ක තිබ්බේ පුදුම තරහක්. කොහොමහරි මම තරහා පාලනය කරගෙන විශ්වව හම්බුවෙන්න ගියා.

“ඇයි තමුසෙට මාව හම්බුවෙන්න ඕනේ කිව්වේ. මාවත් මරලා දාන්නද?”

“කොහෙත්ම නෑ. මට මගේ පව් තවත් වැඩි කරගන්න වුවමනාවක් නැහැ. වෙච්ච හැමදෙයක්ම ගැන  මට සමාවෙන්න. මම මගේ තාත්තාගේ බලය ඕනෙවට වඩා පවිච්චි කරන්න ගියපු නිසායි හැමදේම වුණේ. ඔයා කවීශාගේ කතාව දන්නවා ඇතිනේ. මම එයාට ඇත්තටම ආදරේ කරා. ඒත් මගේ තාත්තට ඕනේ වුණේ කවීශගේ සල්ලි. ඒ නිසා කවීශාට හැමදේම නැති වුණාට පස්සේ තාත්තා මට බල කරා එයාව අතාරින්න කියලා. මගේ අතින් සිද්ධ වෙච්ච ගොඩාක් දේවල් වුණේ තාත්තාගේ වුවමනාවට. අන්තිමේට මට කවීශායි, මගේ අනාගතෙයි දෙකම නැති වුණා.වෙච්ච හැමදේටම මම සමාව ඉල්ලනවා.”

“ සමාව ඉල්ලුවාම හැමදේම හරියනවද මිනිහෝ. තමුසේ හින්දා එයාට ඉංජිනියර් කෙනෙක් වෙන්න බැරි වුණා. තමුසේ මුළු කැම්පස් එකක්ම ඉස්සරාහා ඒ කෙල්ලගේ ගෞරවේ නැති කරලා දැම්මා. අන්තිමෙට එයාගේ ජීවිතෙත් නැති කරා.”

“මම ආපහු හැමදේම හරිගැස්සුවා  ගයාන්. එයාගේ වීඩියෝ එක මම හදපු එකක් කියලා මම මුළු කැම්පස් එකටම දන්වලා තියෙන්නේ. එයාගේ ශිෂ්‍යභාවය ආපහු දෙන්නත් කැම්පස් එක ලෑස්තියි.”

“මට එන කේන්තියට තමුසෙව මෙතනම මරන්න පුලුවන් විශ්ව. කවීශා නතුව එයාගේ ශිෂ්‍යභාවේ මොන මගුලක් කරන්නද යකෝ.” එහෙම කියලා මම එතනින් නගිටලා ආවා. තව ටික වෙලාවක් හරි හිටියොත් මගේ අතින් විශ්වට මොනවා වෙයිද කියන්න මමවත් දන්නේ නැහැ.

“ගයාන්, යන්න කලින් මේක අහලා යන්න. ගයාන් මේක කවීශා ගැන දෙයක්.” විශ්ව එහෙම කෑගැහුවත් මම ආය නතර වුණේ නැහැ. මට විශ්ව ගැන තරහක් වගේම කවීශා නැති වුණ එක ගැන දරාගන්න බැරි දුකක් හිතේ තිබුණා.

ඉතින් මම ගෙදර ගිහින් කාමරේ දොර වහගෙන පැය ගානක් ඇඩුවා. ඇඳේ ඉඳගෙන හිටපු මට එහෙම්ම නින්ද යන්න ඇති. ආයෙත් මට ඇහැරෙනකොට මට දැනුනා ක්කවුරු හරි මගේ ඔලුව අතගානවා වගේ. මම ඇස් අරින්නතුව ගොඩාක් වෙලා හිටියා. අන්තිමට මම කොහොමහරි ඒ අත අල්ලගෙන එකපාරටම නගිට්ටා. මොකද් නැත්තන් කලින් වුණා වගේ ඉන්න කෙනා අතුරුදහන් වුණොත්. ඔලුව උස්සනකොට මගේ ළග හිටියේ කවීශා.

“කවීශා, ඔයා......”

“ඔයා ඔය අහන්න යන්නෙ මම ඇත්තටම මැරිලාද නැත්තන් මේ ඔයා ඉස්සරාහ ඉන්නේ පණපිටින්ද කියලා නේද? අත්තටම මම මැරිලාද නැද්ද කියලා මම තාමත් දන්නේ නැහැ. ඒත් මම මෙහෙම හොල්මන් කරනවා කියන්නේ මම මැරිලා වෙන්න ඇති. ඒ වගේම මේක මම ඔයා ඉදිරියට එන අවසාන වතාව.”

“ඇයි අවසාන වතාව.”

“ ඔයාට ඕනේ මම දිගටම හොල්මනක් වෙලා ඉන්නවා දකින්නද. මගේ අවසන් බලාපොරොත්තුවත් ඔයා ඉෂ්ඨ කලානේ. ඉතින් දැන් මම යනවා. අනික ඔයාට බය හිතෙන්නැද්ද මම මෙහෙම හොල්මන් කරනකොට.”

“ඔයාට බය වෙන්න මම, පිස්සුද. ඔයා හොල්මනක් නෙවෙයි යක්ෂනියක් වෙලා ආවත් ඔයා මගේ ආදරේ කවීශා. මම දෙයක් අහන්නද?”

“අහන්න”

“මම අර උණ හැදිලා හිටපු දවස්වලත් මට දනුනේ ඔයා මගේ ළග ඉන්නවාද?”

“ඔව්,එතකොට ඔයා  ඇත්ත දැනන් හිටියේ නැනේ.”

“ඔයා හොල්මනක් කිව්වානෙද? ඉතින් ඇයි ඔයාම ගිහින් විශ්වලාව බය කරේ නැත්තේ. එහෙම කරලා ඔයාට ඇත්ත එලි කරන්න තිබ්බා නේ. ෆිල්ම් වල වගේ.”

“මම එහෙම කරන්න හැදුවා. ඒත් මාව ඇහෙන්නෙත් පේන්නෙත් ඔයාට විතරයි.”

“පුදුම හොල්මනක්නේ, ඒත් සාමනොයන් හොල්මනකට පුලුවන් නේද තමන්ට ඕන කෙනෙක්ට පේන්න එන්න. එතකොට ඔයා හොල්මනක් නෙවෙයිද?”

“මම දන්නෑ. මේ අහන්න, දැන් මගෙන් වැඩක් නෑ. ඔයා මම ගැන හිතලා ඔයාගේ ජීවිතේ අපායක් කරගන්නවා. බලන්නකෝ ඔයාගේ හැටි, පිස්සෙක් වගේ. දැන් හමදේම අමතක කරන්න. මාව අමතක කරලා ඔයාගේ ජීවිතේ ගැන හිතන්න. නත්ත්ම් මට සතුටින් යන්න බැරි වෙයි.”

“ඔයා නම් ලේසියෙන් කියයි අමතක කරන්න කියලා. ඔයාට පුලුවන්ද එහෙම කරන්න.”

“මට එහෙම කරන්න වෙනවනේ. මම දැන් අලුත් ජීවිතේකට යයිනේ. ඔයා මට පොරොන්දු වෙන්න මාව අමතක කරලා සතුටින් ඉන්නවා කියලා.”එහෙම කියනකොටනම් එයගේ අස්වලත් කඳුළු තිබුණා.

“පොරොන්දු වෙන්නම් එහෙම කරන්න උත්සාහා කරනවා කියලා.ඔයා අත්තටම දැන් යනවද?”

“ඔයාට නින්ද යනකම් මම ඔයා ළඟ ඉන්නම්.ඊට පස්සේ මම සදහටම යනවා.”

“ඔයානම් පුදුම හොල්මනක් තමා.වෙන කිසිම හොල්මනක් නැතුව ඇති එහෙම කරන.”

“කොහොමද?”

“නින්ද යනකම් ළඟ ඉන්න.” මම කඳුළු හිරකරන් හිනාවෙන ගමන් කිව්වා. ඊට පස්සේ මම එයාගේ ඔඩොක්කුවෙන් ඔලුව තියාගත්තා. එයා මගේ ඔලුව අතගගා හිටියා. ඉතින් ඊට පස්සේ මට නින්ද ගිහිල්ලා. ආයෙත් උදේ අහෙරෙනකොට එයා හිටියේ නැහැ.

## 10

මම ඉන්නේ කොහෙද වුණේ මොකද්ද කියලා හිතාගන්න බැරුව ඇස් අරියා. අස් ඇරියාට එතන තිබුනේ අඳුර විතරයි. මම ටික වෙලාවක් අඳුරට ඇස් හුරුවනකම් හිටියා. මම මේ කොහෙද ඉන්නේ. හරියට ගුහාවක් වගේනේ. මට මොකද වුණේ? මම කොහොමද මෙතනට ආවේ. මම කල්පනා කරා. ඔන්න එතකොට වෙච්ච දේවල් ටික ටික මතක් වුණා.

ටික කාලෙකට පස්සේ විශ්ව මාව හම්බුවෙන්න ඕනේ කියලා දිගින් දිගටම ඉල්ලනවා කියලා බන්ධනාගාරෙන් දැනුම් දුන්නා. මාසෙකට විතර පස්සේ මම විශ්වව හම්බුවෙන්න ගියා.

“ඇයි මෙච්චර මාව හම්බුවෙන්න  ඕනේ කියලා කියන්නේ” මම අහුවා.

“ඔයාට කියන්න වැදගත් කතාවක් තියනවා. අන්තිමේට හම්බුන දවසෙත් සම්පූර්න කතාව අහන්නැතුව ගියානේ.”

“මොකද්ද තමුසෙට කියන්න තියන මහ ලොකු කතාව.”

“ගයාන් කවදාහරි විශ්වාස කරලා තියෙන්වාද මායාව කියන එක ඇත්තක් කියලා.”

“මොකක්ද? මේ , මට තමුසෙත් එක්ක විකාර කියවන්න වෙලාවක් නෑ.කියන දෙයක් කියනවා විකාර නැතුව.”

“ඒක විකාරයක් නෙවෙයි. මම කියන්න යන්නේ ඇත්තම දෙයක්.”

“හරි හරි කියනවකෝ.”

“ගයාන් දන්නවද කවීශාට ඇයි මායා කිව්වේ කියලා.ඔයා හිතන්නේ මොකක් හින්දා කියලදා? අපි එයාට මායා කිව්වේ එයාගේ නම මයුමි නිසා නෙවෙයි. ඔයා හිතන්නේ ඒ නිසා කියලනේ.”

“එහෙනම්? ඇයි එයාට මායා කිව්වේ?”

“ කැම්පස් එකේ ශිෂ්‍යභාවය ආයෙත් දෙන්නම් කිව්වාම ඇහුවා නේද කවීශා නැතුව ශිෂ්‍යභාවය මොකටද කියලා. මම ඒ වෙලාවෙයි මේ කතාව කියන්න ගියේ. එදා මායා ප්‍රපාතෙන් පල්ලෙහාට වැටුනට පස්සේ අපි එයාගේ බොඩි එක තියනවාද කියලා හොයලා බැලුවා. ලණු දාලා අපි කොල්ලෝ

ටික පහළට ගිහිල්ලත් බැලුවා. ඒත් හම්බුනේ නැහැ. ඔයාලට හම්බුනාද?''

"නැහැ, පොලීසියෙනුත් බැලුවා. හම්බුණේ නැහැ.''

"ඔය ප්‍රපාතේ කොච්චර හෙව්වත් එයාගේ බොඩි එක නම් කීයටවත් හම්බුවෙන්නෑ.''

" ඇයි? තමුසේ බොඩි එක හොයාගෙන පුච්චලාවත් දැම්මද?''

"දැන් මම කිව්වනේ බොඩි එකක් හම්බුනේ නෑ කියලා. කොහොමත් බොඩි එකක් කොහෙන් හම්බුවෙන්නද එයා තාමත් ජීවත්වෙන කොට.'' මම ඇස් දෙක ලොකු කරගෙන විශ්ව දිහා බලන් හිටියා. "ඔව් ගයාන්, එයා මැරෙන්න විදිහක් නැහැ. කොහෙද කියන්නනම් මාත් දන්නේ නැහැ. හැබැයි එයා කොහේහරි ජීවත්වෙලා ඉන්නවා ඇති අනිවයෙීන්ම.''

"තමුසේ කොහොමද එහෙම කියන්නෙ. එදා නඩුවෙදී තමුසෙම කිව්වනේ එයා මරුණා කියලා.''

"නෑ, එයා මැරුණේ නැහැ. මමයි චතුනියි විතරක් දැනගෙන හිටපු මායා ගැන රහසක් මම දැන් කියන්නම්.මායා කියලා එයාට කියන්න හේතුව තමයි

එයාට මායාවන් කරන්න පුලුවවන්. නිකන් පොඩි මැජික් වගේ දේවල් නෙවෙයි. එයාට හිතෙන ඕනෙම දෙයක් එයාට කරන්න පුලුවන්.''

''මොකක්ද කිව්වේ, මට හරියට ඇහුනේ නෑ. මායාවන් පුලුවන් කියලාද කිව්වේ.''

''ඔව්, ඇහුන විදිහට තමයි කිව්වේ. එයාට ඔනේම දෙයක් එයාගේ මායා බලෙන් කරන්න පුලුවන්. ඔයා ඉල්ලන ඕනෙම දෙයක් එයාට මවන්න පුලුවන්.''

''විශ්ව නිකන් මෙතන විහිළු කරන්න එපා. එයාට එච්චර දෙයක් කරන්න පුලුවන්නම් එයාගේ ජීවිත කතාව අර තරම් නරක වුනේ කොහොමද?''

''ඒකටත් හේතුවක් තියෙනවා. එකපාරක් එයා කරන්න ගියපු මායා වැඩක් වරදුනා. එකේන් තමයි එයගේ අම්මයි තාත්තයි ගියපු ප්ලේන් එක කඩන් වැටුනේ. ඊට පස්සේ එයා මායා වැඩ කරන එක නතර කරා.''

'' ඔය ඇත්තටමද කියන්නේ. නැත්තම් මේකත් තමුසෙගේ මොකක් හරි කපටි කමක්ද? ඔය වගේ දෙයක් විශ්වාස කරන්න පුලුවන් යෑ''

"මේක ඇත්ත කතාවක් ගයාන්. ඒ වෙච්ච දෙයින් පස්සේ එයා මායවන් පාවිච්චි කරන එක සම්පූර්නයෙන්ම අතැරලා දම්මා.

"එයගේ මායා වැඩවලින් ප්‍රයෝජන ගන්න බලන් හිටපු තමුසේ එයා ඒවා නැවැත්තුවාම එයාව අතැරලා දැම්මා.ඒකනේ වුණේ."

"ඔව්, මම පිළිගන්නවා."

"මේවා විශ්වාස කරන්න පුලුවන්ද? මේ ලෝකේ එහෙම දේවල් වෙන්න පුලුවන්ද?"

"ඔයා ඒ ගැන හිතන එක නවත්තන්න. දැන් කොහොමහරි එයාව හොයාගන්න. මට හොදටම විශ්වාසයි එයා මායාවන් පාවිච්චි නොකරාට එයාගේ බලය හින්දා තාමත් ජීවත් වෙනවා ඇති."

" ඔය කියන දේවල් අත්තනම් එයා කොහෙද දන් අත්තේ. එයා ඇති කියලා හිතන්න පුලුවන් තැනක් තියනවාද?"

"මම හිතන්නේහොස්පිට්ල්වල බලුවනාම් හොදයි. මොකද ප්‍රපාතේ පහළ තියෙන ගහේ අත්තක් එයාගේ බඩේ ඇනෙනවා මම දැක්කා.එයාට හොදටම තුවාල

වෙලයි තිබුනේ.ඒවා හොද කරන්නවත් එයා මායාව පාවිච්චි කරයි කියලා හිතන්න බැහැ.''

''ඒත් දැන් මාස තුනක්ම ගිහිල්ලානේ. ඒක නෙවෙයි. තව ප්‍රශ්නයක් තියනවා. ''ඊට පස්සෙ මම කවීශා හොල්මනක් වගේ ඇවිත් මට කියපු දේවල් විශ්වට කිව්වා. එයා මැරිලා කියලා පිළිගන්න කියපු හැටි.

''ඒකනම් ටිකක් අමුතුයි. එයාට ඔයා ඉස්සරාහා විතරයි පෙනී ඉන්න පුළුවන් කිව්වානම් එයා හොල්මනක් නෙවෙයි. එයා ඒක කරන්න ඇත්තේ මායා බලෙන්. ඒ කියන්නේ එයා ආයෙත් බලේ පාවිච්චි කරලා.''

''එයා මායාවන් පවිච්චි කරානම් හොස්පිට්ල් එකකට යන්න නැතුව ඇතිනේ.''

''නෑ, එයාට එයාවම හොද කරගන්න බැහැ. එයාට ඒකට ඇගේ ශක්තිය ඕනේ. තුවාල වෙලා ඉන්න වෙලාවට එයාට මායාවන් කරන එක අමාරුයි. ඒ හින්දා එයා අනිවයේන්ම හොස්පිට්ල් එකකට ගිහින් ඇති. හොයලා බලන්න.''

ඊට පස්සේ මම මාසයක් තිස්සේ පුළුවන් හැම විදිහටම හඹයලා බැලුවා කවීශා කොහේහරි ඉන්නවාද කියලා. ඒත් මට එයාව හම්බුනේ නැහැ. ඊට පස්සේ මම ආයෙත් විශ්වව හම්බුවෙන්න ගියා.

"මට කොහොමටවත් කවීශාව හොයාගන්න බැරි වුණා. හොදටම විශ්වාසද එයා තාමත් ජීවත්වෙනා කියලා."

"ඔව්, එයා අනිවයෙීන්ම ජීවත්වෙලා ඉන්න ඕන,"

"සමහරවිට එයා ආයෙත් මගේ ඉස්සරාහාට එන්න කැමති නැතුව ඇති.ඒකනේ කිව්වේ එයා මැරුණා කියලා පිළිගන්න කියලා."

"එයා එහෙම කිව්වානම් ඔයා ඒක පිළිගන්න."

එයාට මම කිසිම වැරැද්දක කරලා නැහැනේ. ඇයි එයා මගේ ඉස්සරහටවත් එන්නෙ නැත්තේ. මම කල්පනා කරා. එයාව මගේ ඉස්සරහට ගෙන්නගන්න ක්‍රමයක් ඇත්තෙම නැද්ද?

"හරි, මම දන්නවා කරන්න ඕන දේ. එයා එතකොට අනිවායෙීන්ම මගේ ඉස්සරහට එයි."

“මොකක්ද කරන්න හදන්නේ.”

“මම යනවා එයා වැටුන ප්‍රපාතේ ළඟට. එතනට ගිහින් මමත් පනිනවා එතනින් පහළට. එයා මට ඇත්තටම ආදරේ කරනවා කිව්වානේ. අනිවායේන්ම එයා එයි මාව බේරගන්න.”

“ගයාන්, පිස්සු හැදිලාද, එයා ඔයාව බේරගන්න එන්නේ  එයා ආයෙත් මායා බල පාවිච්චි කරන්න අරන්නම් විතරයි. නැත්තම් එයා කොහොමද දැනගන්නේ ඔයා එතනින් පනිනවා කියලා. එහෙම වුණේ නැත්තන් මැරෙන්න වෙන්නේ.”

“කොහොම වුණත් කමක් නැහැ.”

“පිස්සු නටන්න එපා. ඒක හරියන්නේ නැහැ.අපිට හරියටම කියන්න බැහැනේ එයා මායා බල පාවිච්චි කරන්න පටන් අරන්ද කියලා.”

“ඒ කොහොම වුණත් මම යනවා. මට දැන් මෙහෙම ජීවත් වෙන එකත් එපා වෙලා ඉන්නේ.”මම එහෙම කියලා එතනින් ආවා. මම ඒ වෙලාවෙම නුවර එළියේ යන්න පිටත්වුණා.මම ප්‍රපාතේ ළඟට යනකොට රෑ දොළහත් පහුවෙලා. රෑට නුවර එළියේ පාරවල් වල

යන එකත් අමාරුයිනේ.අන්තිමේට මම ප්‍රපාතේ ළඟට යනකොට පහුවදා පාන්දර එකටත් ළඟයි. මම එතන ඉඳන් කාගහලා කතා කරා.

“මායා, ඔයාට මාව ඇහෙනවාද? මම දැන් මෙතනින් පනින්නයි හදන්නේ. ඔයා ජීවත් වෙලා ඉන්නවානම් මාව බේරගන්නවත් මගේ ඉස්සරාහට එයි කියලා මම හිතනවා. ඔයා එන්නේ නත්තම් කොහොමත් මට ජීවත් වෙන්න වුවමනාවක් නෑ මම මැරුනදෙන්. එහෙනම් මම යනවා.”එහෙම කියලා ඇස් දෙක වහගන එතනින් පහළට පැන්නා. එතකොටම ඉර පායනවා වගේ පළාතම එළිය වුණා වගේ මතකයි. ඊට පස්සේ මට මොකුත්ම මතක නැහැ. මට සිහිය ආවේ මේ ගුහාව ඇතුලේ.

ටිකින් ටික ගුහාව ඇතුළට එළිය එන්න පටන් ගත්තා. මම හිතන්නේ ඉර පායනවා වෙන්න ඇති. ‘ මම ඒ ප්‍රපාතෙන් වැටිලා බේරුණේඑ කොහොමද?’ මට එකපාරටම මතක් වුණා. ‘ මායා මාව බේරගන්න ආවාද? මම කිසිම තුවාලයක්වත් නැතුව ඉන්නේ කොහොමද?’ එහෙම හිතන ගමන් මම ගුහාඅවෙන් එළියට ඇවිත් වටපිට බැලුවා.

# 11

ගුහාවෙන් එළියට ආපු මම එතනම නතර වුණේ දකින දේ විශ්වාස කරන්නත් බැරුව. දෙයියනේ, මම මේ දකින්නේ හීනයක්ද?

මම හිටියේ පොඩි කන්දක් මුදුනේ. ඒ කන්ද පාමුළ තිබුනේ ලොකු නගරයක්. ඒත් ප්‍රශ්නේ කියන්නේ නගරේ කොහොමත් වර්තමාන පෙනුමක් තිබුනේ නැහැ. ඒක පරණම පරණ කාලේ නගරයක්. මුළු නගරේම හැදිලා තිබුනේ ගල්වලින්. ඒ නගරේ මැද හරියට ඩිස්නි මාලිගාව වගේ ගල්වලින්ම හදපු මහා විශාල මාළිගාවක් තිබුනා.

"ඔයා දැන් මට කියන්න ඕනේ මොන කෙහෙල්මලකට මෙහෙට ආවාද කියලා.මට පිටිපස්සෙන් එකපාරට කටහඬක් ඇහුනා. බය වෙච්චා පාරට තව පොඩ්ඩෙන් කන්දෙන් පහළට වැටෙනවා. ඒ වෙන කවුරුත් නෙවෙයි මායා. ඒ කියන්නේ කවීශා. මට දනුන සතුට කොයි තරම්ද කියනවානම් කතා කරන්නත් බැරි වුණා.

"ඔයා මොනවාද මෙහේ කරන්නේ මොකටද මෙහෙට ආවේ."

“අනේ දෙයියනේ,කවීශා ඔයා තාමත් ජීවත් වෙනවා.” එහෙම කියලා අම එයාව බදාගන්නයි ගියේ.

“හෝව්, ගයාන් ඔහොම ඉන්නවා. මගේ ළගට එන්න එපා. අනික මම මෙහේදී කවීශා නෙවෙයි මායා. ඔයා කවීශාගෙයි මායාගෙයි වෙනස තේරුම් ගන්න.”

“මොකද්ද වෙනස, මොන නම කිව්වත් ඒ ඔයානේ.”

“ කවීශා කියන්නේ සාමාන්‍ය මනුස්ස කෙල්ලෙක්. මම මෙහේදී මායා බල තියන කෙනෙක්. “

“ඔයා හරියට කතා කරන්නේ කවීශා කියන්නේ ඔයා නෙවෙයි වෙන කෙල්ලෙක් වගේනේ.”

“දැන් මම එක සැරේකුත් කිව්වා තේරුණේ නැද්ද. මම කවීශා වෙන්නේ මනුස්ස ලෝකෙදි. මට ඕනන්ම් ඒ ලෝකෙදිත් මායා විදිහට ඉන්න පුළුවන්.”

“ඔයා මොකක්ද කියන්නේ. ඔයා කතා කරන්නේ හරියට අපි වෙන ලෝකේක ඉන්නවා වගේනේ. අනික මොකද ඔහොම නපුරු තාලෙට කතා කරන්නේ.”

“ඔව්, අපි මේ ඉන්නේ වෙන ලෝකෙක තමයි. මේක මායාවරුන්ගේ ලෝකේ. අනිත් එක තමයි ඔයා මෙහෙට අයිති කෙනෙක් නෙවෙයි. ඔයා මෙහෙට ආවේ කොහොමද?”

“ඒකට කලින් මට උත්තර දීලා ඉන්න. ඔයා කියන්නේ මේක වෙන ලෝකයක් කියලා. එතකොට ඒ කතාව ඇත්ත. ඔයාට මායවන් පුලුවන් කියන එක.”

“ඔයා කොහොමද ඒක දන්නේ.”

“ විශ්ව කිව්වේ. හොල්මනක් කියලා මට බොරු කියලා ආවේ අන්තිම පාර.” මම එහෙම කියනකොට එයා අමුතු විදිහට හිනාවුණා. “ ඇයි හිනාවෙන්නේ. මහ ලොකු මායාකාරි එදා අඩලා නේද ආවේ මාව දාලා යන්න බෑ කියලා.”

“මම දැන් එක පාරකුත් කිව්වා. කවීශාගේ දේවලුයි මායාගේ දේවලුයි පටලවගන්න එපා කියලා.”

“තේරුණා, ඔයා කියන්නේ දැන් ඔයා මායා. ඒ කියන්නේ කවීශා වගේ පොඩ්ඩක්වත් මගේ ගැන බලන්නේ නෑ. මේ ලෝකෙදි ඔයා මට ආදරේ කරන කෙනා නෙවෙයි.”

“ඇති යන්තම් බූරුව තෙරුම් ගත්තා. දැන් කියනවා මේ ලෝකෙට ඇතුල් වුණේ කොහොමද? ඒක කරන්න පුළුවන් මායාවරයෙක්ට විතරයි.”

“ඔයා නෙවෙයිද එතකොට මාව බේරගත්තේ.”

“පිස්සුද, මම මොකටද ඔයාව බේරගත්තේ.”

“එතකොට මම කොහොමද මෙහෙට ආවේ.”

“ඒක ඉතින් මමද දන්නේ. මමම හොයාගන්නම් ඒක. මගේ අත් දෙක උඩින් අත් දෙක තියනවා.”මම මගේ අත් දෙක එයාගේ අත් දෙක උඩින් තිබ්බා. ඊට පස්සේ එයා අස් දෙක වහගෙන ටික වෙලාවක් හිටියා. ඊට පස්සේ ඇස් දෙක ඇරිය එයා මගේ ඔළුවට ගැහුවා. “මොන අමාරුවකටද අර ප්‍රපාතෙන් පහළට පැන්නේ. පිස්සු හැදිලාද ඉන්නේ.”එහෙම අහනකොට මට හිනාගියා.

“මායායි කවිශායි දෙන්නෙක් කිව්වාට එහෙමමත් නෙවෙයි වගේනේ.”

“මම මේ එහෙම දෙයක් හින්දා නෙවෙයි බැන්නේ හරිද? ඔයා මෙහෙට ඇවිත් තියෙන්නේ ඒ ප්‍රපාතේ තියෙන මායා දොරටුවෙන්.”

“මටනම් තේරෙන්නෑ මේ මොනවද කියලා. මම ඇත්තටමද මේ දේවල් දකින්නේ.”

“ඔව් මෝඩයෝ, මේක ඇත්තක්. ඒ ප්‍රපාතේ තියෙනවා මායාවරුන්ගේ ලෝකේට දොරටුවක්. මේක මායාවන්ගෙන් පිරිණු ලෝකයක්. ඒ නිසා කිසිම තාක්ෂණේකට මේක හොයාගන්න බැහැ.මේක පෘථිවියට සමාන්තර ලෝකයක්.”

“එතකොට මෙහේ ඉන්න හැමෝටම මායා වැඩ පුලුවන්ද?”

“අත්තම කියනවානම් මේ වෙලාවේ පණ ඇති අය විදිහට මෙහේ ඉන්නේ අපි දෙන්නා විතරයි.”

“ මොකක්,එහෙනම් ඉතින් ඔයා මොනවාද මෙහෙට වෙලා තනියම කරන්නේ.”

“ඒක ඔයාටම බලාගන්න පුලුවන්. දැන් අපි මාළිගාවට යන්න ඕනේ. ඔයාව කොහොමද ආයේ යවන්නේ කියලත් හොයාගන්න ඕනේ.”

“ඉතින් ඔයාගේ මායා බලයෙන් බැරිද ඒක කරන්න. අනික මාව යවන්නේ ඇයි?”

“මේ වෙලාවේ මගේ මයා බලේ වෙන වදගත් වැඩකට යොදවලා තියෙන්නේ. ඒ නිසා වෙන වැඩ කරන්න පුලුවන් සීමිතව.ඒ වගේම ඔයාව මෙහෙන් යවන්නේ ඔයා මෙහෙට අයිති මායාවරයෙක් නෙවෙයි හින්දා.” එහෙම කියලා එයා මගේ අතින් අල්ලගත්තා. ඊළඟ මොහොතේ අපි හිටියේ මාළිගාව ඇතුලේ.”

“ඒකනම් මාරයි. දැනෙන්නේවත් නැතුව මෙතනට ආවානේ.”මම මායා දිහා බැලුවා. එයා හිටියේ හුස්ම ගන්න අමාරුවෙන් වගේ බිත්තියට එක අතක් තියාගෙන නැවිලායි. “ඔයා හොදින්ද? අමාරුවෙන් වගේ ඉන්නේ.”

“ප්‍රශ්නයක් නෑ, මායා බලය සීමිත හින්දා මට මහන්සියක් දැනෙනවා.”

“ඔයා මට හංගන මොකක් හරි තියනවා නේද? ඇත්තටම මට හිතෙන්නෑ ඔයා හොදින් කියලා.”

“එහෙම දෙයක් නෑ. මම හොදින්.”එයා අහක බලාගෙන කිව්වා.”එන්න, ඔයාට පෙන්නන්න දෙයක් තියනවා.”එහෙම කියලා එයා මාව මාළිගාවේ සඳළුතලයට එක්කන් ගියා. එතනට මාළිගාවේ මුළු උද්‍යානෙම පේනවා. උද්‍යානේ පුරාම කිසිම හිඩසක්

නැතුව පිරිලා තිබුනේ පිළිම වලින්. මිනිස් ප්‍රමාණයෙන්ම තිබුන මිනිස් පිළිමවලින්.

“මෙච්චර පිළිම ගොඩක්.ඇයි මේ.”

“මේ තමයි මායා ලොකේ හිටපු මායාවරුන්. මේ නෙළපු පිළිම නෙවෙයි. එක තැන ගල් වුණ මායාවරු. මේ ලෝකේ කවුරුත් නතිවෙන්න හේතුව තමයි මේ.”

“එහෙම වෙන්නේ කොහොමද? ඇයි මෙහෙම හැමෝම ගල් වෙලා ඉන්නේ.”

“මායා ලෝකේ එක විශේෂත්වයක් තියනවා. මේ ලෝකේ ජීවය රැදිලා තියෙන්නේ එක දියමන්තියක. ඒක තියලා තියෙන්න ඕනේ මේ මාළිගාවේ හරි මැද තියන බල ආසනය උඩ. ඒක එතනින් අයින් කරොත් මායාවරුන්ගේ පවැත්ම නැති වෙනවා. ඒ නිසයි මෙහෙම ගල් වෙලා ඉන්නේ.”

“ ඒ කියන්නේ දැන් ඒ දියමන්තිය තියෙන්න ඕනේ තැන නැද්ද? කවුද ඒක අයින් කරලා තියෙන්නේ.”

“අදුරේ මායාවිය. මොකක් හරි හේතුවක් නිසා එයා ඒ දියමන්තිය එතනින් ගත්තා. මම හිතන්නේ එයාට මෙහේ රැජිණ වෙන්නයි ඕනේ වෙලා තිබුනේ. එයා ඒ

දියමන්තිය එතනින් ගත්ත මොහොතේ හැමදේම ගල්වුණා. එයා ඒක අරන් තියෙන්නේ මෙහේ රැජිණියට කිරුළු පලන්දන්න තිබ්බ දවසෙයි. ඒකයි හැමෝම මෙහේ ඉන්නේ.''

''එතකොට ඔයත් මේ ලෝකෙට අයිති කෙනෙක්නම් ඇයි ඔයාට එහෙම නොවුනේ.''

''ඒ දේ සිද්ධ වෙලා තියෙන්නේ අවුරුදු පන්දාහකට කලින්. ඒත් මම ඉපදුනේ අවුරුදු විසිපහකට කලින්. මම ඉපදුණේ මේ ලෝකේ නෙවෙයි නිසා මගේ පැවැත්මට ඒ දියමන්තිය බලපාන්නේ නැහැ.

''ඔයා කොහොමද මෙච්චර දේවල් දන්නේ.''

''මායාවේ මහා පුස්තකයෙන්. ඒක ලියලා තියෙන්නේ අවුරුදු දහස් ගානකට කලින්. ඒකේ තියෙන්නේ මායා ලෝකය ඇතුලේ අනාගතේ සිද්ධ වෙන දේවල්. ඒකේ ලියලා තියනවා මේ විදිහට හමදේම ගල් වෙනවා කියලත්.''

''ඉතින් එහෙනම් ඒ පොතේ ඊට පස්සේ වෙන දේවලුත් ලියලා ඇතිනේ''

''ඇති, ඒ නිසා තමයි මම ඒක කියවන්නේ.''

“ඉතින් ඔයාගේ මායා බලයෙන් බැරිද ඕක එකපාර කියවලා ඉවර කරන්න.”

“මගේ බලය වෙන වැඩකට යොදවලා තියෙන්නේ කියලා කිව්වනේ. ඒ නිසා බැහැ. දැන් යමු මාත් එක්ක. මම පෙන්නන්නම් අඳුරේ මායාවියව.” එහෙම කියලා එයා මාව මාළිගාවේ මදට එක්කන් ආවා. එතන ගල්වෙච්ච කෙනෙක්ගේ පිළිමයක් තිබුණා.

“මෙයා තමයි අඳුරේ මායවිය. එයාගේ අතේ අර තියෙන්නේ බල දියමන්තිය. ඒක තමයි මම කිව්ව දියමන්තිය.”

“ඉතින් ඒක මෙයාගේ අතින් අරන් මෙතනින් තියන්න විතරනේ තියෙන්නේ. එතකොට හමදේම හරියයිනේ.

“ඒක ඔහොම කියනවා වගේ ලේසි නෑ. බල දියමන්තිය එයාගේ අතේම ගල්වෙලා තියෙන්නේ. ඒක එයාගේ අතින් ගන්න පුලුවන් එයාට ආයෙත් පණ ලැබුණට පස්සේ විතරයි. ඒක ගොඩාක් භයානක වැඩක්”

“දැන් ඔයා අර මොකද්ද පොත කියවලා හොයන්නේ ඒක කරන්න ක්‍රමයක්ද?ඉතින් අයි ඔයා ඒක කරන්න

ඕනේ. මේ හැමදේම අතෑරලා ගිහින් පාඩුවේ හිටියානම් ඉවරනේ.''

''එහෙම කරන්න පිළුවන්නම් මමත් ගොඩාක් කැමතියි. ඒත් මහා පුස්තකේ ලියලා තියනවා මේ විනාශයට අවුරුදු පන්දාහක් වෙන මොහොතේ මනුස්ස ලෝකේ ඉදලා එන මායාවරුන්ගේ ලෝකෙට අයිති දෙන්නෙක් හැමදේම නැවත තිබුන තත්ත්වෙට ගේනවා කියලා. එහෙම කරන්න බැරි වුණොත් ගල්වෙලා ඉන්න මායාවරු මැරෙමිනවා. ඒ වගේම මමත්.

''එතකොට කවුද ඒ අනිත් කෙනා.''

''ඒක තමයි ප්‍රශ්නේ. ඒ කෙනා මේ වෙනකොට මෙහෙට ඇවිත් ඉන්න ඕනේ. ඒත් ඒ කෙනා ඔයා නෙවෙයි. ඔයාට කිසිම මායා බලයක් නෑනේ. හැබැයි ඔයා වෙනුවෙන් මායා දොරටුව විවර වුණා.ඒ කෙනා ආවේ නත්ත්ම් මට මේක කරන්න බෑ. ඒ කෙනා නැතුව ලෝකේ බේරගන්න ක්‍රමයක් හොයන්නයි මම මහා පුස්තකය කියවන්නේ. මගේ මායා බල ගොඩාක් බලවත් වුණාට මේ වෙලාවේ ඒවාගෙන් වැඩක්

ගන්නත් බැහැ. මට තියන කාලේ ගොඩාක් අඩුයි. එක දෙයක්වත් කරගන්න බැරිවෙයි වගේ.''

''ඒ කියන්නේ ඔයාගේ මායා බලය යොදවලා තියෙන්නේ මේ ලෝකේ බේරගන්න නෙවෙයිද්? මට පේන්නේ ඔයා ඉන්නේ ලොකු ප්‍රශ්නෙක වගේ.''

''ඒවා ඔයාට වැඩක් නෑ. දැන් ඉස්සරවෙලාම ඔයා මෙහෙන් ආපහු යන්න ඕනේ. ආපහු ඒ ගුහාවට යන්න මම මොකක් හරිකරලා මයා දොරටුව ඇරලා දෙන්නම්. කරන්න ඕනේ මොකද්ද කියලා මම දැන් තීරණය කරලා ඉවරයි. තවත් මට බලන් ඉන්න බෑ අනික් කෙනා එනකම්.''එයා අවුලෙන් වගේ කිව්වා.

''ඇයි ඔයා කියන්නෙ මට මෙහෙන් යන්න කියලා. ඔයා ඉන්නේ ලොකු ප්‍රශ්නෙක වගේ. ඔයාගේ මායාවන් ගොඩාක් බලගතුයිනම් ඇයි ඕනෙම දෙයක් කරන්න බැරි.''

''මොකද මේ වෙලාවේ මගේ ඇගේ ඒකට ඕනේ කරන ශක්තිය නෑ. දැන් කටවහගෙන මෙහෙන් යනවා. මම කියන දේ කරනවා.''

# 12

එයා එහෙම කෑගැහුවේ මොකක් හරිවැදගත් ඩෙයක් එකපාරටම තේරුම් ගියා වගෙයි. මම මොනවා කිව්වත් එයා ඇහුවේ නැහැ. මාව මාළිගාවෙන් එළියට යවලා එයා හැම දොරක්ම වහලා දැම්මා. කරන්න දෙයක් නැති හින්දා මම ආයෙත් ගුහාවට යන්න පිටත් වුණා. මේඑ වෙන දේවල් මොනවාද? මම් මේ හීනයක් දකිනවද?

මේ වෙන දේවල්වල මොකක් හරි අමුත්තක් තිබුබා. මායා මගෙන් හංගන මොකක් හරි දෙයක් තිබුනා.මම මෙහෙට ආපු එකට ගොඩාක් බය වෙලායි හිටියේ. මගෙන් හංගන ලොකක් හරි ලොකු දෙයක් මෙතන තියනවා.

එයා මොකක් හරි ලොකු ප්‍රශ්නෙක ඉන්නේ. ඉතින් මම තීරණය කළා ආපහු හැරිලා මාළිගාවට යන්න. මට කිසිම මායා බලයක් නැති වුණාට කමක් නැහැ. මොන දේ වුණත් මම එයා එක්කම ඉන්නවා කියලාතීරණය කළා. ඉත්න් මම ආපහු හැරිලා මාළිගාවට ආවා.

වහලා තිබ්බ දොර ඇරගන්න පුළුවන් වෙයිද බලන්න දොරට අත තිබ්බා විතරයි මෙන්න දොර ඇරුනා. මම මාළිගාව ඇතුළට ගියා. දැන් මම කොහෙටද යන්න ඕනේ. මේ මහා විශාල මාළිගාව ගැන කිසිම දෙයක් මම දන්නැහැනේ. මම කල්පනා කරා. එකපාරටම මට යන්න ඕනේ කොහෙටද කියලා දැනුනා. මට දැනුන විදිහට මම ඉස්සරහට ගියා. අන්තිමේට මම නතර වුණේ වහලා දාලා තිබුණ කාමරයක් ළග. මම අත තිබ්බොත් ඒ දොරත් ඇරෙයි කියලා මට දැනුනා. මම ඒ දොරට අත් අතියන්න යනකොටම........

"ඔයා ඔතන මොනවාද් කරන්නේ? ඔයා කොහොමද ආයෙත් ඇතුළට ආවේ. මම කිව්වා නේද ඔයාට යන්න කියලා." මායා එහෙම කියන ගමන් එතනට ආවා. එයා හොදටම බය වෙලයි හිටියේ. "ඇයි කියන දේ අහන්නේ නැත්තේ. මෙහෙන් යන්න කියලා කිව්වා නේද? අනික ඔයා මොකද මේ කාමරේ ළග කරන්නේ."එයා කෑගැහුවා.

"මායා, මම මෙතෙන්ට එන්න ඕනේ කියලා මට දැනුනා. ඒ නිසා මම ආවා. මෙහේ ඕනෙම දොරක් මම අත තියපු ගමන් ඇරෙනවානේ. ඔයා කිව්වා නේද

එහෙම වෙන්න බෑ කියලා. අනික මොකද්ද මේ කමරේ තියෙන විශේෂත්වය.''

''ඔයා වෙනුවෙන් ඕනෙම දොරක් ඇරුනාට ඔයාට මේ කාමරේට යන්න බෑ.ඕක කොහොමටවත් අරින්න එපා.''

''හරි එහෙනම් මම අරින්නැතුව ඉන්නම්. හැබැයි ඔයා මට කියන්න ඕනේ මොකද්ද මෙතන තියන ප්‍රශ්නේ කියලා. ඔයා හොදටම බය වෙලා ඉන්නේ. මට කියන්න මොනවාද වෙන්නේ කියලා.''

මම එහෙම කිව්වාම එයා ඇහිපිය නොගහා මගේ දිහා බයෙන් වගේ බලන්  හිටියා. එකපාරටම එයාගේ ඇස්වල හිරකරන් හිටපු කදුළු එළියට ආවා. එයා අඩන ගමන්ම එතන දණ ගහගත්තා. '' ඇයි මේ අඩන්නේ. මට කියන්න මොකද්ද තියන ප්‍රශ්නේ කියලා. මට පුළුවන් විදිහට උදව් කරන්නම්''

''ඔයාට මට උදව් කරන්න බෑ ගයාන්. ඔයාට බෑ. දැන් කිසිම දෙයක් කරන්න කාලයක් නෑ. තව පැය දෙකකින් ඒ අවුරුදු පන්දාහා සම්පූර්ණ වෙනවා. හැමදේම විනාශ වෙයි.ඒ නිසායි මම ඔයාට මෙහෙන් යන්න කිව්වේ. මගේ ඉතුරු වෙලා තියන අන්තිම

ශක්තියෙන් මම මායා දොරටුව ඇරලා දෙන්නම්. මෙහෙන් යන්න. කියන දේ අහලා යන්න.''

''පැය දෙකයි? ඉතින් අයි යනවානම් අපි දෙන්නාටම යන්න බැරි . ඔයාට පුලුවන්නේ මේ ලෝකේ බේරගන්න එක පැත්තකට දාලා මාත් එක්කම යන්න එන්න.''

''මට බෑ එහෙම කරන්න. ඔයාව යවන්න විතරයි මට පුලුවන්. පැය දෙකකින් හැමදේම විනාශ වෙනවා. දැන් ඔයා යන්න.''එයා අඩන ගමන්ම කිව්වා.

''ඇයි ඔයාට බැරි මාත් එක්ක යන්න.ඔයා මොකක් හරි හංගනවා. කියන්න ඇයි ඔයාට බැරි මාත් එක්ක යන්න.''

''ඒක ඔයා දැනගන්න ඕනේ නැහැ. මට ආය ජීවත් වෙන්න බැහැ. මම මායාවරියක්. මේ ලෝකෙත් එක්කම මාවත් විනාශ වෙලා යයි. ඒත් ඔයාට බේරෙන්න පුලුවන්. දැන්වත් මෙහෙන් යන්න. ''

''මම යන්නේ නැහැ. ඔයා එන්නේ නැත්තම් මම යන්නෙත් නැහැ. මොනවා වුණත් කමක් නැහැ.''

“මට ඔයාත් එක්ක එන්න බෑ. තේරුම් ගන්න. මට මායා දොරටුව හරහා යවන්න පුලුවන් ඔයාව විතරයි. මම සිරුරක් නති ආත්මයක් විතරයි. මට මගේම සිරුරත් අරන් මායා දොරටුව ඇරගෙන යන්න බැහැ. “එයා එහෙම කියන ගමන් මට අරින්න එපා කියලා එයාම කියපු කාමරේ දොර ඇරියා.

මම එයාත් එක්කම කාමරේඵ ඇතුළ්ට ගියා. ඒ කාමරේ හරියට තරු පිරුණු අඳුරු අභ්‍යවකාශේ වගේ. පොළව පුරා සුදුපාට මීදුමක් පැතිරිලා තිබුනා. කාමරේ හරි මැද ලොකු ගල් ආසනයක් උඩ එයා වැතිරිලා හිටියා. ඒ තමයි මායා.

මගේ අස්වලින් කඳුළු පහළට කඩාගෙන වැටුනා. මේ වෙනකම්ම මාත් එක්ක ඉඳලා තියෙන්නේ, කතා කරලා තියෙන්නේ එයාගේ ආත්මය. “මම ප්‍රපාතෙන් පහළැට වැටෙනකොට එතන තියන ගහේ අත්තක් මගේ බඩේ ඇනුනා.ඒක මායා ගහක් එතනයි මායා දොරටුව තියෙන්නේ. ඒ ගහේ විෂ නිසා ආත්මය ඇගෙන් වෙන්වෙලා තියෙන්නේ. හරියට කෝමා එකක් වගේ. ඒ විෂ අයින් වෙනකම් මට ඇගට ඇතුල් වෙන්න බෑ. ඒ තුවලේ හොඳ කරන්න මායා බලයක් ඕනේ....

.... ඒත් මායාවක් කරලා මාව හොද කරන්න කවුරුත් මෙහෙ නෑ. ඒ නිසා මට පුලුවන් විදිහට මගේම මායා බලය තුවාලේ හොද කරන්න යොදවනවා. ඒක කරන්න ගොඩාක් අමාරුයි. මාස ගානක් තිස්සේ මායාව යොදවලත් මට ඒ විෂ අයින් කරලා තුවලේ හොද කරන්න බැරි වුණා. හැමදේම විනාශ වෙනකොට මනුස්ස ලෝකෙට සම්බන්ධ හැම දොරටුවක්ම සදහටම වැහිලා යනවා. ඒ නිසායි ඔයා මෙහෙන් යන්න ඕනේ. ඔයාට ඕනේනම් මගේ සිරුර විතරක් අරගෙන යන්න. මායා දොරටුව අරින්න මගේ අන්තිම ශක්තියත් යෙදුවාම මගේ ආත්මේ විනාශ වෙලා යනවා. එතකොට මට ආයේ ජීවිතයක් නැහැ.

මම එයාගේ සිරුර ළගට ගියා. එයාගේ බඩේ තිබුන තුවාලේ ගොඩාක් ගැඹුරුයි. ඒත් එකපාරටම ඒක හොද කරන්න පුළුවන් කියලා මට දැනුනා.

“බල දියමන්තිය, බල දියමන්තියට පුළුවන් නේද මේ තුවාලේ විෂ අයින් කරලා හොද කරන්න.” මට කියවුනා. ඒක අහලා මායගේ ඇස් දෙක උඩ ගියා.

“මොකක්ද් ඔයා කියන්නෙ. බල දියමන්තියට එහෙම කරන්න පුලුවන් කියලාඔයා දන්නේ කොහොමද?”

“දන්නේ කොහොමද කියන එකන්ම් මමත් දන්නේ නෑ. හැබැයි දැන් කරන්න ඕනේ මොකක්ද කියලානම් මම දන්නවා.”එයා පුදුම වෙලා මගේ දිහා බලන් හිටියා.

“ඔයාට කරන්න තියෙන වැඩෙත් ලේසි නෑ හැබැයි. ඔයාට ඔයාගේ ඇගට ඇතුල් වෙන්න බැරි වුණාට වෙන කෙනෙක්ගේ ඇගට ඇතුල් වෙන්න පුලුවන්නේ.ඔයා අදූරේ මායාවියගේ ඇගට ඇතුල් වෙන්න ඕනේ. එහෙම ඇතුල් වෙලා ඔයා ඒ ඇග පාලනේ කරලා එයාගේ අත දිගාරින්න ඕනේ. එතකොට මට බල දියමන්තිය ගන්න පුලුවන්. මම ඒක ගත්ත ගමන් ඔයා එයාගේ ඇගෙන් අයින් වෙන්න.”

“එහෙම කරොත් අදූරේ මායවියට ආයෙත් පණ එන එකක් නැද්ද?”

“ඒකනම් හරියට කියන්න බෑ”

“ඒත් ඔයා කොහොමද මේ දේවල් දන්නේ.”

“ඒ දේවල් මට දැනෙනවා. ඒ කොහොමද කියලා මම දන්නේ නැහැ. ඒත් ඒක තමා දැන් කරන්න ඕනේ .”

# 13

එයා හිමින් හිමින් ඇස් ඇරියා. එකපාරටම බය වෙලා වගේ එයා නැගිටින්න හැදුවා. ඒත් එයාට නැගිටින්න බැරි වුණා. එතකොට එයා මාව දැක්කා.

“ගයාන්, මම මේ කොහෙද ඉන්නේ. මගේ ඔලුව හොඳටම රිදෙනවා. ඔලුව උස්සන්නත් බෑ. “

“ඔයා ඉන්නේ මගේ ගෙදර.ඔයා ඇක්සිඩන්ට් වෙලා මාස ගාණක් කෝමා එකකයි හිටියේ. දැන් ඔයාට ගොඩක් හොදයි. නැගිටින්න එපා. ඔහොම ඉන්න.”

“මම මොනවා වෙලාද ඇක්සිඩන්ට් වුණේ.”

“ඔයාව ඇක්සිඩන්ට් කරවලා තියෙන්නේ  විශ්ව. දැන් එයා හිරේ ඉන්නේ. දැන් ඔයාගේ ප්‍රශ්න ඇති. තව ටිකක් නිදාගන්න. එතකොට ඔය ඔලුවේ කැක්කුම අඩු වෙයි.”මම එහෙම කිව්වාම එයා ආයෙත් ඇස් දෙක වහගත්තා. මම එයාට ෂීට් එක පෙරවලා කාමරේ දොරත් වහලා එළියට ආවා. මම එනකම් දිලීපයි චතුනියි පහළ සාලෙට වෙලා බලාගෙන හිටියා. මම ගිහිල්ල ඉඳගත්තා.

“හරි දැන් ගයාන්, මට උත්තර දෙනවා. මෙච්චර කල් කොහෙද අතුරුදහන් වෙලා හිටියේ. එතකොට මැරුණ කවීශා ආපහු ආවේ කොහොමද?”

“දිලීප, උඹ හරියට සී අයි ඩී එකෙන් වගේනේ ප්‍රශ්න කරන්නේ. දැන් මම උත්තර දෙන්නම ඕනෙද”

“ඔව්, උත්තර දෙන්නම ඕනේ. උඹ හිටියේ කොහෙද් කියන එකට නැතත් කවීශා කොහොමද ආයෙත් ආවේ කියන එකට.”

“මම කවීශාට කිව්ව ටිකම තමයි උඹලාට කියන්න තියෙන්නේ. එයා කන්දෙන් පහළට වැටුනාට පස්සෙ කවුරු හරි එයාව හොස්පිට්ල් එකට අරන් ගිහින්. එයා කෝම එකක ඉදලා තියෙන්නේ. මම මෙච්චර කල් එයාව හෙව්වා.”

“ආ ඇත්තද, උඹට මගේ මූණ දිහා බැලුවාම පේනවාද බූරුවෙක්, ගොනෙක් වගේ. එතකොට උඹ කවීශාට කිව්වේ නැනේ ප්‍රපාතෙකින් වැටුණා කියලා. වාහන ඇක්සිඩන්ට් එකක් කියලනේ කිව්වේ. නිකන් බොරු කියන්න එපා ගයාන්.”

“මම ඒ ගැන මතක් කරන්නවත් කැමති නෑ. ඒ දේවල් මතක් වෙනකොට තාමත් මගේ හුස්ම නවතිනවා වගේ. ඒ ගැන මම විතරක් දැනගෙන හිටියාම ඇති.”

“ එතකොට වෙච්ච දේ කවීශාට මතක නැද්ද?”

“එයාට දැන් ඒ දේවල් අමතක වෙලා තියෙන්නේ. මතක් වෙන එකකුත් නැහැ.”

“වුණු දේ ඇයි ඔයා හංගන්නේ.”

“කවීශාගේ අනාගතේ වෙනුවෙන්. එයා තව දුරටත් දුක් විඳිනවා බලන්න මම කැමති නැහැ. එයාගේ අනාගතේ වෙනුවෙන් ඒ හැමදෙයක්ම රහසක් විදිහට තිබුනදෙන්. චතුනි එයා තවදුරටත් මායා නෙවෙයි. එයාගේ ළග ආය කිසිම මායාවක් නෑ. එයාට එහෙම දෙයක් තිබුණා කියන එකවත් එයාට කියන්න එපා.”

“මම එහෙම කරන්නම්. ඒත් ඔයා කොහොමද ඒක දැනගත්තේ.”

“ මට ඒ ගැන කිව්වේ විශ්ව. “

“මොකද්ද ඒ මායා කතාව.” දිලීප ඇහුවා.

“ මම ඒ ගැන ඔයාට පස්සේ කියන්නම්.”චතුනි කිව්වා.

“දැන් අපි යන්නම්. එයා දැන් හොඳින්නේ. මම හෙට එන්නම් එයාව බලාගන්න. ඔයා ඔෆිස් ගිහාම එයා තනියමනේ.”ඊට පස්සේ චතුනියි දිලීපයි ගියා. රෑ වෙලා මම කෑමත් අරගෙන කවීශාගේ කාමරේට ගියා. ඒ වෙලාවේ එයා ඇහැරලා හිටියේ. මම ගියාම එයා නැගිටලා ඇඳ පිටිපස්සට හේත්තු වුණා.

“දැන් ඔලුවේ කැක්කුම අඩුයිද? ඇයි මේ බයවෙලා.”

“මම බය හිතෙන හීනයක් දැක්කා.”

“මොකක්ද”

“මම විශ්වගෙන් බේරිලා දුවගෙන යනවා. එතකොට ප්‍රපාතෙකින් පහළට වැටෙනවා. “එයා එහෙම කිව්වාම මම ගැස්සිලා ගියා. එයාට කොහොමද ආයෙත් ඒක පේන්නේ.

“ඔයා නිකන් බය වෙලා. දැන් විශ්ව ඉන්නේ හිරේනේ එයාට බෑ ඔයාට කරදරයක් කරන්න.”

“ඒ වුණාට මට හිතෙනවා ඒ හීනෙන් පේන දේ කලින් වෙලා තියනවා කියලා.”

“පිස්සුද? එහෙම දෙයක් වුනානම් අඩ ඔයා මෙහෙම ඉදියිද.දැන් ඔයා කෑම කන්නකෝ බෙහෙත් බොන්නත් එපැයි.”

“මට කන්න බෑ. ඔයා කවන්න.”එයා කිව්වා.ඉතින් මම එයාට කැව්වා.”ඔයාගේ අම්මයි තාත්තායි කෝ. ඔයා විතරනේ මෙහේ ඉන්නේ.”

“ඒ දෙන්නා බිස්නස් වැඩකට රට ගිහින් ඉන්නේ. තව මාස දෙකකින් එන්නේ.”

“එතකොට ඔයාට සහෝදර සහෝදරියෝ නැද්ද.”

“නැහැ, මම විතරයි. ඒක නෙවෙයි. ඔයාට කියන්න සුභ ආරංචියක් තියනවා. ඔයාට ආයෙත් කැම්පස් යන්න පුලුවන්. ඔයාගේ ශිෂ්‍යභාවය ආපහු දෙන්න කියලා උසාවියෙන් කියලා තියෙන්නේ. විශ්ව පිළිගත්තා එයා කරපු දේවල් බොරු කියලා.”

“ඔය ඇත්තමද? ඒ කියන්නේ මට ඉංජිනියර් කෙනෙක් වෙන්න පුලුවන්.”

“ඔව්, පුලුවන්. ඔයාට ඩිග්‍රී එක කම්ප්ලීට් කරන්න ට්‍රේනින් යන්න විතරනේ තියෙන්නේ.”

“ඒක නෙවෙයි ඔයා කොහොමද ඒ විස්තරේ දන්නේ.”

“ඔයාට වෙච්ච හැමදෙයක්ම මම දන්නවා. චතුනි මට හැමදේම කිව්වා.ඔයා හංගලා තිබුන සාක්ෂි හොයාගෙන අපි විශ්වව හිරේ යැව්වා. එයා දැන් ජීවිතාන්තය ද්ක්වාම හිරේ.”

“කොහොමද සාක්ෂි හොයාගත්තේ. ඒක දැනන් හිටියේ මම විතරනේ.”

“ඒවා හොයාගන්න එක එච්චර අමාරු වුනෙ නැහැ.”

## 14

මෙන්න මේකයි එදා අත්තටම සිද්ධ වුණේ,

***************************************

මමයි මායයි එයාගේ පණ නැති සිරුරත් අරන් බල ආසනය ළගට ගියා.

"තවත් කෙනෙකුගේ මායා බලයේ උදව්ව නැතුව මේක කරන්න පුලුවන් වෙයිද කියලා මට බයයි. මට අඳුරේ මයාවියගේ ආත්මේ පාලනේ කරගෙන මේක කරන්න පුලුවන් වෙයිද"

"ඔයාට ඒක පුලුවන්. යන්න." මම අඳුරේ මායාවියගේ ළගින් හිටගෙන කිව්වා. පුලුවන් තරම් ඉක්මනට හැමදේම කරන්න ඕනේ නිසා පිලිමේ අත ළගින්ම මම අත තියාගෙන හිටියේ අත දිගඇරුන ගමන්ම දියමන්තිය ගන්න පුලුවන් විදිහට.

මායා එකපාරටම අඳුරේ මායාවියගේ ගල් ගැහිලා තිබුන ඇගට ඇතුල් වුනා. අන්තිමේට ගොඩාක් වෙලාවකට පස්සේ පිළිමේ අත දිගඇරුනා. ඒත් එක්කම මම ඉක්මනින්ම බල දියමන්තිය මගේ අතට ගත්තා. මම දියමන්තිය අතට ගත්ත ගමන්ම ඒක

මායාගේ බඩේ තිබුන තුවාලේ උඩින් තිබ්බා. තුවාලේ ටික ටික හොද වෙන්න පටන් ගත්තා. ඒත් ගොඩාක් හිමින්. මායාගේ ආත්මය අදූරේ මායාවියගේ සිරුරෙන් එළියට ආවා. එයා තුවාලේ වැහිලා යන දිහා බලාගෙන හිටියා.ඒත් එයා එකපාරටම බිම දණගහගෙන හිටපු මගේ උරහිස්ට හයියෙන් අත තිබ්බා. එයා බය වෙලා වගේ බලාගෙන හිටියේ අදූරේ මයාවිය දිහා. ඉතින් මමත් හැරිලා බැලුවා.

“දෙයියනේ එයා ගල්බවින් මිදෙනවා. එහෙම වෙන්නෙ කොහොමද .”මම ඇහුවා.

“එයා මෙහේ හිටපු සාමන්‍ය මායාවරුන්ට වඩා බල්වත් කෙනෙක් මම එයගේ ඇගට ඇතුල් වුනාම එයාගේ ඇග ඇතුලේ ත්බුන මායාවන් කැළඹෙන්න ඇති. එයාට ඉක්මනටම පණ එයි.”එහෙම කියලා එයා මගේ ළ්ගින් දණ ගහගත්තා.

“ඔයා දිගටම ඔය විදිහට දියමන්තිය තියාගෙන ඉන්න. මම ඇගට ඇතුල් වෙන්න උත්සාහ කරන්නම්. ඔය දියමන්තිය අතාරින්න එපා. ඕක ඔයා ළග තියනක්ම් එයාට බෑ ඔයාට කිසිම දෙයක් කරන්න.” එහෙම කියලා එයා සිරුරේ අත් දෙක අල්ල ගත්තා. ඊට

පස්සේ ඇස් දෙක වහගත්තා. මම දිගටම එයාගේ තුවාලේ උඩින් දියමන්තිය තියාගෙන හිටියා. අන්තිමේට තුවලේ සම්පූර්ණයෙන්ම වැහිලා ගියා.මයාගේ ආත්මය සිරුර ඇතුලට ඇදිලා ගියා. ඒත් එයාට සිහිය ආවේ නැහැ. මම තවත් දියමන්තිය තියාගෙන හිටියා. එයාට ටික ටික සිහිය එන්න පටන් ගත්තා.ඒත් හැමදේම කනපිට පෙරලුනේ ඒ වෙලාවේ.

“දැන් ඔය හොඳටම් ඇති. කරුණාකරලා බල දියමන්තිය මට දෙන්වා.”දෙවියනේ, අඳුරේ මායාවියට පණ ඇවිල්ලා. එයා රවාගෙන අපේ දිහා බලන් හිටියා.

“තමුන්ට කොහොමටවත් බල දියමන්තිය ලැබෙන්නේ නැහැ. “මම කිව්වා.

“තමුන්ලා දෙන්නවම වාශ්ප කරලා දාන්න කලින් ඕක දෙනවා. එහෙම කරොත් මම දෙන්නවම විනාශ නොකර අතාරින්නම්.”

“ඇයි මම විශ්වාස කරන්න ඕනේ තමුන් අපි දෙන්නාව අතාරියි කියලා. කොහොමටවත් දියමන්තිය තමුන්ට දෙන්නේ නැහැ. අනික අපි ළග දියමන්තිය තියනකම් තමුන්ට බෑ අපිට මොකුත් කරන්න.”

“එහෙමද හිතාගෙන ඉන්නේ. අපි බලමු එහෙනම් මොකද වෙන්නෙ කියලා.” එහෙම කියලා අඳුරේ මයාවිය මායා ගිනි ජාලාවක් අපේ දිහාට එවන්න පටන් ගත්තා.බේරෙන්න විදිහක් නෑ කියලා දැනුන නිසා මම අත උස්සච්චා. ඒත් එක්කම මගේ අතින් එළියක් විහිදිලා අපි දෙන්නා වටේ ආරක්ෂක බුබුලක් හැදුනා.

එකපාරටම මම කොච්චර පුදුම වුණාද කියනවන්ම් මටම හිතාගන්න බැරි වුණා මොකද වෙන්නේ කියලා. අඳුරේ මායවෙයගේ ගිනිදැල්වලට ආරක්ෂක බුබුලෙන් ඇතුලට එන්න පුලුවන් වුණේ නැහැ. ඒත් එයා දිගටම ගින්දර එව්වා. මම එක අතකින් දියමන්තිය මායාගේ ඇග උඩ තියාගෙන හිටපු නිසා එක අතකින් ආරක්ෂක බුබුල නැති වෙන්නැතුව තියාගෙන ඉන්න වුණා. ටිකෙන් ටික මගේ ශක්තිය අඩු වෙනවා මට දැනුනා. ආරක්ෂක බුබුල අල්ලගෙන ඉන්න එක ටික ටික අමාරු වුණා. ඒත් අඳුරේ මායාවියටනම් කිසිම මහන්සියක් තිබුනේ නැහැ. එයා දිගින් දිගටම අපි දිහාවට ගිනිදැල් එව්වා.

අන්තිමේට කොහොමහරි ආරක්ෂක බුබුල බිදෙන්න ඔන්න මෙන්න තියෙද්දී මායට සිහිය ආවා. ඒත්

තාමත් එයාට නැගිටින්න තරම් ශක්තියක් තිබුනේ නැහැ. එයා එහෙම්ම ඉදිද්දී මම අනිත් අතත් ඉස්සරාහට දික් කලා. මායාව පාවිච්චි කරන්නේ කොහොමද කියලා මම දැනගෙන හිටියේ නැති වුණාට මගේ අනිත් අතින් විහිදුන එලියත් එක්ක ආරක්ෂක බුබුල ආයෙමත් ශක්තිමත් වෙනවා මට දැනුනා.

මායා හිමින් හිමින් නැගිටින්න උත්සාහා කලා. එයා අමාරුවෙන් විසිවෙවී වගේ නැගිට්ටා. බිම ද්ණගහගෙන හිටපු මමත් එයත් එක්කම නැගිට්ටා.

"අපි බල ආසනේ ගාවට යන්න ඕනේ. තව පොඩි වෙලාවයි ඉතුරු වෙලා තියෙන්නේ." එයා අමාරුවෙන් වගේ කිව්වා. මම ආරක්ෂක බුබුල අල්ලගෙන ඉදිද්දිම හිමින් හිමින් බල ආසනේ දිහාවට යන්න පටන් ගත්තා.

"තමුන්ලාට ඔය දියමන්තිය තිබුන තැනින් තියන්න මම ඉඩ දෙන්නේ නැහැ." එහෙම කියලා එයා මහා විශාල ගිනි දැල්ලක් අපි දිහාවට එව්වා. ඒකේ බලේට ආරක්ෂක බුබුල බිදිලා මම පස්සට විසි වෙලා ගියා.

අඳුරේ මායාවිය ආයෙත් පහර දෙන්න හදද්දී මම දැනගෙන හිටියේ නැහැ මායාව පාවිච්චි කරන්න ඕනේ කොහොමද කියලා. මායා ඒක තෙරුම් ගන්න ඇති. බල දියමන්තිය මගේ දිහාවට විසි කරපු එයා අපේ මැද්දට පැන්නා. එයාගේ ඇගේ මායාව පාවිච්චි කරන්න තරම් ශක්තියක් නොතිබුනත් එයා අඳුරේ මායාවියගේ ගිනිදැල්වලට එයාගේ මායාවෙන් පහර දුන්නා. දෙන්නගේම මායවන් එකට ගැටෙනකොට මුළු මාළිගාවම් දෙදරලා ගියා.

“බල දියමන්තිය තියන්න ඕනේ තැනින් තියන්න.” මායා කෑගැහුවා. මම ඉක්මනට බල දියමන්තිය බල ආසනය උඩින් තිබ්බා. ඒ වෙනකොට එතන තිබුන වැලි ඔරලෝසුවේ වැලි ටික ඔක්කොම පහළට වැටිලා ඉවර වෙලා තිබුනා. අඳුරේ මායාවිය මහා හයියෙන් හිනාවුණා. මායා අමාරුවෙන් හුස්ම ගන්න ගමන් බඩ අල්ලගෙන නැමිලයි හිටියේ.

“ මම කිව්වනේ, තමුන්ලාට ඒක කරන්න ඉඩ දෙන්නේ නෑ කියලා. දැන් පරක්කු වැඩියි හැමදේම විනාශ වෙයි.” අඳුරේ මායාවිය මහ හයියෙන් හිනාවෙන ගමන් කිව්වා. මම මායා ළගට ගිහින් එයාගේ අතින් අල්ල ගත්තා. එයා අමාරුවෙන් වගේ

මගේ දිහා බැලුවා. එකපාරටම එයාට මොකක් හරි මතක් වෙලා වගේ.

එයා මගේ අතින් අල්ලගෙනම බල දියමන්තිය ගාවට ගියා. මගේ අතින් අල්ලගෙන හිටපු එයාගේ අත එයා බල දියමන්තිය උඩින් තිබ්බා. "මේ විදිහට අපිට එයාව පරද්දවන්න පුලුවන්. ඔයාත් මායවරයෙක්. ඔයා හිතෙන් මායාව පාලනේ කරන්න. හිතෙන් බලය යොදවන්න. 'අඳුරේ මායාවට විරුද්ධව මගේ මායාව ශක්තිමත් වේවා කියලා හිතින් හිතන්න.'ඊට පස්සේ එයාගේ දිහාට අත දික් කරලා 'අඳුරේ මායවට විරුද්ධව මාගේ මායාව ක්‍රියාත්මක වේවා' කියලා හිතන්න."එහෙම කියලා මායා අස්දෙක වහගත්තා. මමත් එයා කියපු විදිහට හිතුවා. මගේ ඇග ඇතුලේ මොනවා හරි වෙනවා කියලා මට දැනුනා. මම මායා කිව්ව විදිහට හිතන ගමන් මගේ අත අඳුරේ මායාවිය දිහාට  දික් කරනකොටම මායාත් එහෙම කලා.

ඒත් එක්කම අඳුරේ මායාවිය එයාගේ මායා දැල් අපි දිහාට එවව්වා. ඒත් අපි දෙන්නගේම මායා රැස්වල වැදිච්ච ඒ ගිනිදැල් ආපස්සට තල්ලු වෙලා ගියා. අන්තිමේට අපි දෙන්නගේ මායා රැස් අඳුරේ මායාවියගේ ඇගේ වැදුනා. එයා වේදනාවෙන්

කැගහන්න පටන්ගත්තා. මහ හයියෙන් කැගහන එයාව ටිකෙන් ටික කලු පාට වාශ්පයක් වගේ වෙන්න පටන් ගත්තා. ඒ කලු පාට වාශ්පය අන්තිමේට නැතිවෙලා ගියා. අදුරේ මායාවිය විනාශ වුණා. ඒත් එක්කම අපිත් අත් පහළට දැම්මා. මායා හිටියේ හොදටම දුර්වල වෙලා. එයා එකපාරටම සිහිය නැතුව වැටුනා. මම එයාව අල්ලගත්තා.

ඒත් එක්කම භූමිකම්පාවක් වගේ හැමදෙයක්ම දෙදරන්න පටන්ගත්තා. කිච්චා වගේම හමදේම විනාශ වෙන්නද් යන්නේ. මට හිතාගන්න බැරි වුණා. ඒත් එක්කම මගේ ඔලුව කැරකෙන්න පටන්ගත්තා. මට මායාව අතැරුනා. ඒත් එක්කම මටත් හිටගෙන ඉන්න බැරුව බිම වැටුනා. ඊට පස්සේ මට සිහිය නැතිවුණා.

ආයෙත් මට ටිකින් ටික සිහිය එනකොට හැමදේම වෙනස් වෙල තිබුනා. තව දුරටත් එතන පරණ ගල් මාළිගාවක් වුණේ නැහැ. ඒක වර්තමානයේ තියෙන සුඛෝපබෝගී මාළිගාවක් විදිහට වෙනස් වෙලා තිබුනා. බල ආසනය විතරක් එහෙම්මම තිබුනා. ‘මායා කොහෙද?’ මට එකපාරටම මතක් වුණා.

මම නැගිටලා බැලුවා.  මායාත් එතනම වැටිලා හිටියා. එයාට තාමත් සිහිය ඇවිත් තිබුනේ නැහැ. මම එයා ළගට ගිහින් දණගහගත්තා. එයාව මගේ අත් දෙකෙන් උස්සලා  ඔලුව කකුල් දෙක උඩින් තියාගත්තා. එයා හිටියේ හරියට පණ නැති කෙනෙක් වගේ. එයාගේ නාඩි වැටෙනවා මට දැනුනේ නැහැ. “මායා, නැගිටින්න . ඔයාට බෑ මාව දාලා යන්න.ඔයා මැරිලා නෑ නේද? මට ඇඬුනා. මම මගේ මායාවෙන් එයාව හොද කරන්න හදනකොටම වටේට සද්ද ඇහෙන්න පටන් ගත්තා.

එළියේ ගල් වෙලා හිටපු අයට පණ ඇවිත් වෙන්න ඇති. එයාලා තවටිකකින් මෙතෙන්ට එයි. මට ඕන වුණේ නැහැ එයාලා අපිව දකින්න. එයලා දැනගන්න ඕනේ නැහැ එයාලව බේරගත්තේ කවුද කියලා. මට හිතුනා. මායව මගේ අත් දෙකෙන් අල්ලගෙන මම හිතින් ප්‍රර්ථනා කරා අපි ආයෙත් අර කන්ද මුදුනේ තිබුන ගල් ගුහාවේ ඉන්න කියලා. ඊට පස්සේ මම ඇස් ඇරියා. ඇත්තටම ඒක හරි ගියා. අපි හිටියේ ගල් ගුහාවේ. මම හිතින් බලය යොදවලා කොහොමහරි මායා දොරටුව ඇරගත්තා. ඊටපස්සේ මායා වත් අරගෙන ආපහු මම මනුස්ස ලෝකෙට ආවා. අපි

හිටියේ ප්‍රපාතේ ළග. මනුස්ස ලෝකෙට ආපු ගමන් මම කරපු පළවෙනි දේ තමයි  මායා දොරටුව විනාශ කරපු එක. ආයේ කිසිම දවසක එහාට යන්නේ නෑ කියලා මම තීරණය කළා. අන්තිමේට මම මායවත් අරගෙන මගේ ගෙදරට ආව. ඇත්තම කියන්වානම් මහ රෑ මම මායා වත් උස්සගෙන ගේ ඉස්සරහින් එකපාරටම මතු වුණා. හොද වෙලාවට කවුරුත් ඒක දැක්කේ නැහ.

මායාව අරන් ගියපු මම ඉස්සර වෙලාම මායාලෝකේ ස්ද්ධ වෙච්ච හැමදෙයක්ම එයාගේ මතකෙන් අයින් කරා. ඊට පස්සේ මගේ මයා බලය යොදවලා  එයාට සිහිය ගත්තා. ඊටත් පස්සේ තමයි මම දිලීපටයි චතුනිටයි කතාකරේ.

ඔන්න ඔහොමයි එදා හමදේම සිද්ධ වුණේ. මායා එතනින් එහාට හැමදාටම කවීශා විතරක් වෙලා ඉදියි. මගේම කවීශා වෙලා. මායාවයි, මායා ලෝකෙයි නිසා එයාට සිද්ධ වුනේ දුක් විදින්න. ඒ නිසා එයගේ මතකෙන් මම ඒ හැමැදෙයක්ම අයින් කරලා දැම්මා.

මමත් මායාවරයෙක් කියලා දැනගන්න ලැබුනේ අන්තිම මොහොතෙනේ. මගේ මායා බලය මෙච්චර

කල් හැංගිලා තිබුනේ ඇයි? මනුස්ස ලෝකේ මිනිස්සුන්ට දාව මායා බල තියන දෙන්නෙක් ඉපදුනේ කොහොමද? තවත් මේ විදිහට මායා බල තියන අය ඉන්නවාද? ඒ වගේ මායා ලෝකයක් තියෙන්නේ කොහොමද? මේ දේවල් ඔක්කොම නොවිසඳුනු ප්‍රශ්න. ඒ දේවල් හැමදාටම ප්‍රශ්න විදිහට තියෙයිද නැත්තම් විසඳෙයිද කියලා කාටවත්ම කියන්න බැහැ. මමත් මගේ මයා බලය බොහෝ දුරට පාවිච්චි නොකර ඉන්න තීරණය කළා.

කවීශාට හොද වුණාට පස්සේ ආයෙත් කැම්පස් ගිහින් ඩිග්‍රී එක කම්ප්ලීට් කළා. ඊට පස්සේ එයා අවුරුද්දක ඉන්ටර්න් එකකට සිංගප්පූරුවට ගියා. අද එයා ආපහු එනවා. මේ අවුරුද්දේ අපේ වෙඩින් එක ගන්නයි හිතාගෙන ඉන්නේ. ඉතින් මන් එයාව ගන්න දැන් එයාපෝර්ට් එකට යනවා.

මෙම කෘතිය හා කතාවේ අයිතිය කතෘ පවිත්‍ර මානසි සමරසේකර වන මා සතු වේ. කතාව ගැන ඔබගේ අදහස් pavithramanasi@gmail.com වෙත එවන්න.

............නිමි...............

